# ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලය
# இலங்கை வயம்ப பல்கலைக்கழகம்
# WAYAMBA UNIVERSITY OF SRI LANKA

## වාර්ෂික වාර්තාව හා ගිණුම්
## ஆண்டறிக்கையும் கணக்கும்
## ANNUAL REPORT & ACCOUNTS

**2014**

# පටුන


පිටු අංකය

දැක්ම 01

මෙහෙවර 01

1 ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලයේ ඉලක්කයන් 02

2 විශ්වවිද්‍යාලයේ නිලධාරීන් 03

3 පාලක සභාවේ සාමාජිකයින් 04

4 උපකුලපතිවරයාගේ සමාලෝචනය 05

5 2014 වර්ෂයේ මානව සම්පත් හා පිරිවැය තොරතුරු 07

6 2014 වර්ෂයේ ශිෂ්‍ය තොරතුරු 08

7 2014 - වයඹ විශ්වවිද්‍යාලයීය උපාධිධාරීන්ගේ සේවා නියුක්තිය 09

8 2014 වර්ෂයේ විශ්වවිද්‍යාලය මඟින් මෙහෙයවන ලද බාහිර වැඩසටහන් පිළිබඳ විස්තර 15

9 2014 වර්ෂය තුළ දී ආරම්භ කරන ලද නව පාඨමාලා. 16

10 2014.12.31 දිනට පීඨයන්හි හා ඒකකයන්හි අධ්‍යයන හා අධ්‍යයන සහායක කාර්යය මණ්ඩල තොරතුරු 17

11 2014.12.31 දිනට අනධ්‍යයන කාර්යය මණ්ඩල තොරතුරු 20

12 පුස්තකාලය 22

13 2014 වර්ෂයේ උපාධි අපේක්ෂකයන් සඳහා නේවාසිකාගාර පහසුකම් සැපයීම 28

14 මහපොළ / ශිෂ්‍යාධාර ලැබූ ශිෂ්‍ය පිරිස 31

15 පර්යේෂණ, නව සොයා ගැනීම් හා ප්‍රකාශන පිළිබඳ තොරතුරු 32

16 2014 වර්ෂය තුළ අධ්‍යයන කාර්යය මණ්ඩලය විසින් සම්පූර්ණ කරන ලද පශ්චාද් උපාධි 34

17 ත්‍යාග ලැබීම් පිළිබඳ තොරතුරු 36

18 ශාරීරික අධ්‍යාපන අංශය 39

19 වෘත්තීය මාර්ගෝපදේශන ඒකකය 46

20 තොරතුරු සන්නිවේදන තාක්ෂණ මධ්‍යස්ථානය කුලියාපිටිය පරිශ්‍රය 55

21 තොරතුරු සන්නිවේදන තාක්ෂණ මධ්‍යස්ථානය මාකඳුර පරිශ්‍රය 57

22 ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීමේ ඒකකය - කුලියාපිටිය පරිශ්‍රය 60

23 ඉංග්‍රීසි ඉගැන්වීමේ ඒකකය - මාකඳුර පරිශ්‍රය 64

24 වෛද්‍ය මධ්‍යස්ථානය 65

25 පුනරාවර්තන වියදම් තොරතුරු 66

26 ප්‍රාග්ධන වියදම් තොරතුරු 66

27 මූල්‍ය ප්‍රගතිය පිළිබඳ තොරතුරු (වියදම්) 66

28 මූල්‍ය ප්‍රගතිය පිළිබඳ තොරතුරු (උපයන ලද ආදායම්) 67

29 2014 මූල්‍ය ක්‍රියාකාරීත්ව විශ්ලේෂණය 67

30 ව්‍යාපෘති පිළිබඳ තොරතුරු (දේශීය ප්‍රතිපාදන මත ක්‍රියාත්මක ) 68

31 ව්‍යාපෘති වියදම් තොරතුරු (දේශීය අරමුදල්) 69

32 2014 වර්ෂයේ යටිතල පහසුකම් ලැබීම් පිළිබඳ තොරතුරු 70

2014 ගිණුම් ප්‍රකාශය 71

2014 දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා මූල්‍ය තත්ත්වය 74

2014 දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා මූල්‍ය කාර්යය සාධන ප්‍රකාශය 76

2014 දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශය 78

# දැක්ම

"ශ්‍රී ලංකා උසස් අධ්‍යාපනයේ
විශිෂ්ටතම මධ්‍යස්ථානය බවට
පත්කිරීම "

# මෙහෙවර

"නව්‍යකරණ අධ්‍යාපන පාඨමාලා,
පර්යේෂණ සහ බාහිර ක්‍රියාකාරකම්
මඟින් ජාතික සංවර්ධනයට
ගැලපෙන පරිදි මානව සම්පත්
වැඩිදියුණු කිරීම"

## 1. ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලයේ ඉලක්කයන්

*1.) උපාධි පාඨමාලාවන්හි තත්වය වර්ධනය කිරීම.*

*2.) ලංකාවේ වර්ධනය වන උසස් අධ්‍යාපන ඉල්ලුම සපුරාලීම සඳහා ශිෂ්‍ය ප්‍රවේශය නැංවීම.*

*3.) උපාධිලාභීන්ගේ සේවා නියුක්තිය ඉහළ නැංවීම.*

*4.) සමස්ත ඵලදායීතාවල සම්පත් භාවිතයේ කාර්යක්ෂමතාව සහ සේවාවන්හි බලාත්මකභාවය ඉහළ නැංවීම.*

*5.) සම්පත් අත්කරගැනීම සහ ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලයේ මූල්‍ය ස්ථාවරත්වය නැංවීම.*

*6.) ජාතීන් අතර සමගිය ශිෂ්‍යයන් හා කාර්යමණ්ඩලය අතර වර්ධනය කරමින් උසස් කාර්යමය වටපිටාවක් ඇතිකර ගැනීම සඳහා විශ්වවිද්‍යාලයේ සමාජ ප්‍රාග්ධනය යථාස්ථාපනය කිරීම.*

# 2. විශ්වවිද්‍යාලයේ නිලධාරීන් - 2014

**කුලපති**

මහාචාර්ය ටියුලි ද සිල්වා මහතා

**උපකුලපති**

මහාචාර්ය එස්. ජේ. බී.ඒ. ජයසේකර මහතා, විද්‍යාවේදී *(කෘෂිවිද්‍යා) (පකිස්ථානය),*

*දර්ශනසූරි (එක්සත් රාජධානිය)*

**පීඨාධිපතිවරු**

**කෘෂිකර්ම හා වැවිලි කළමනාකරණ පීඨය**

මහාචාර්ය ඩී. පී. එස්. ටී. ජී. අත්තනායක මහතා, විද්‍යාවේදී *(කෘෂිකර්ම) (පේරදෙණිය),*
*විද්‍යාපති, දර්ශනසූරි (බර්මිංහැම්)*

**ව්‍යවහාරිකවිද්‍යා පීඨය**

ආචාර්ය ඊ. එම්. පී. ඒකනායක මහතා, විද්‍යාවේදී *(කැලණිය), විද්‍යාපති, ඩී.එස්.සී. (ජපානය)*

**ව්‍යාපාර අධ්‍යයන හා මූල්‍ය පීඨය**

මහාචාර්ය ඊ. එස්. වික්‍රමසිංහ මහතා, *ශාස්ත්‍රවේදී (කොළඹ),පශ්චාද් උපාධි ඩිප්ලෝමා (කොළඹ)*
*වානිජවිද්‍යාපති. (කැලණිය),*

**පශුසම්පත්, ධීවර හා පෝෂණ පීඨය**

ආචාර්ය එම්. එස්. ඩබ්ලිව්. ද සිල්වා මහතා, විද්‍යාවේදී *(රසායන විද්‍යාව) (පේරදෙණිය),*
*දර්ශනසූරි (ඇ.එ.ජ)*

**ලේඛකාධිකාරී**

ජී පියරත්න මහතා, *ශාස්ත්‍රවේදී (පේරාදෙණිය), මානව සම්පත් කළමනාකරණ පශ්චාද් උපාධි ඩිප්ලෝමා (කොළඹ විශ්වවිද්‍යාලය), මානව සම්පත් කළමනාකරණය පිළිබඳ පශ්චාද් උපාධිය (කොළඹ විශ්වවිද්‍යාලය)*

2013.04.01 සිට

**මූල්‍යාධිකාරී**

ඩී. ඒ. යූ. ධර්මදාස මහතා, විද්‍යාවේදී *(කැලණිය), වරලත් ගණකාධිකාරී, ඒ එස් සී එම් ඒ*

**පුස්තකාලයාධිපති**

ඩබ්ලිව්. ජී. පී. ගම්ලත් මහතා, *ශාස්ත්‍රවේදී (පේරදෙණිය), පුස්තකාල හා තොරතුරු විද්‍යාවේදී (ඉන්දියාව), පුස්තකාල හා තොරතුරු විද්‍යාපති (ඉන්දියාව)*

## 3. 2014 වර්ෂයේ පාලක සභා සාමාජිකයෝ

**උපකුලපති**

මහාචාර්ය එස්. ජේ. බී.ඒ. ජයසේකර මහතා - සභාපති

**පීඨාධිපතිවරු**

| | |
|---|---|
| කෘෂිකර්ම හා වැවිලි කළමනාකරණ පීඨය | - මහාචාර්ය ඩී. පී. එස්. ටී. ජී. අත්තනායක මහතා |
| ව්‍යවහාරිකවිද්‍යා පීඨය | - ආචාර්ය ඊ. එම්. පී. ඒකනායක මහතා |
| ව්‍යාපාර අධ්‍යයන හා මූල්‍ය පීඨය | - මහාචාර්ය ඊ. එස්. වික්‍රමසිංහ මහතා |
| පශුසම්පත්, ධීවර හා පෝෂණ පීඨය | - ආචාර්ය එම්. එස්. ඩබ්ලිව්. ද සිල්වා මහතා |

**විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිසම මඟින් පත් කරන ලද සාමාජිකයන්**

ආචාර්ය ඩබ්ලිව්. ඒ. අබේසිංහ මහතා

ඒ. ඒ. ජිනදාස මහතා

ජේ. එච්. ආර්. කරුණාරත්න මහතා 2014.08.31 දක්වා

ජේ. එම්. ගුණතිලක මහතා 2014.08.31 දක්වා

එෆ්. ප්‍රීති පෙරේරා මහතා 2014.08.31 දක්වා

ආර්. පී. එල්. වීරසිංහ මහතා 2014.09.01 දින සිට

නාරද එදිරිසිංහ මහතා 2014.09.01 දින සිට

ආර්. එම්. වන්නිනායක මහතා 2014.08.31 දක්වා

ඩබ්. ඩී. ජයසිංහ මහතා 2014.09.01 දින සිට

මහින්ද තෙන්නකෝන් මහතා 2014.09.01 දින සිට

එච්. ජී. එම්. හිටිසේකර මහතා 2014.09.01 දින සිට

**සනාතන සභාව මඟින් පත් කරන ලද සාමාජිකයෝ**

ආචාර්ය කේ. ඩී. ඩී. එන්. දිසානායක මහතා 2014.05.28 දක්වා

මහාචාර්ය ආර්. සී. ඩබ්ලිව්. එම්. ආර්. ඒ. නුගවෙල මහතා 2014.03.18 දක්වා
මහාචාර්ය ජේ. එච්. පී. කේ. ජයසිංහ මහතා 2014.05.29 සිට
ආචාර්ය එල් . ඩී .ආර් .ඩී . පෙරේරා මහතා 2014.03.19 සිට

**ලේඛකාධිකාරී (ලේකම්)**

ජී පියරත්න මහතා

# 4. උපකුලපතිවරයාගේ සමාලෝචනය

## 4.1 කෙටි හැඳින්වීම

විශ්වවිද්‍යාලයේ 519ක් වන කාර්ය මණ්ඩලයේ (අධ්‍යයන 152, පරිපාලන 28, පුස්තකාල 5, අධ්‍යයන සහයක 11 සහ අනධ්‍යයන 323ක් වන) සහයෝගයෙන් විශ්වවිද්‍යාලය එහි ඉලක්ක සපුරා ගැනීම සඳහා ක්‍රියා කළේය. පීඨ හතරෙහි සමස්ත ශිෂ්‍ය ප්‍රජාව 2856ක් වූ අතර (පිරිමි 1154ක් සහ ගැහැණු 1702ක් ලෙස)එයින් 729 ක් සඳහා නේවාසික පහසුකම් සපයන ලදී. පිරිමි 510ක් සහ ගැහැණු 419ක් වන පරිදි.සිසුහු 473ක් ශිෂ්‍යාධාර ලැබූ අතර 821 දෙනෙක් මහපොළ ශිෂ්‍යත්ව දීමනා ලැබූහ. අප විශ්වවිද්‍යාලයෙන් පිටව යන උපාධිධාරීන්ගේ සේවා නියුක්ති ප්‍රතිශතය 89.55% ක ඉහළ අගයකින් සමන්විත විය. එය ලංකාවේ රාජ්‍ය විශ්වවිද්‍යාල අතර දෙවන තැන ගන්නා ඉහළ අගයකි.

## 4.2 ජයග්‍රහණයන්

2014 වර්ෂයේ උපාධි ප්‍රදානෝත්සවය 2014 ජූලි මස 17 වන දින විශ්වවිද්‍යාලයීය ප්‍රාධාන ශාලාවේ දී පැවැත්විණි. මෙය ප්‍රථම වතාවට විශ්වවිද්‍යාල පරිශ්‍රයේ උපාධි ප්‍රාදානෝත්සවයක් පවත්වන ලද අවස්ථාව විය. 2014 වර්ෂයේ පෙබරවාරි මාර්තු සමයේ දැයට කිරුළ ජාතික ප්‍රදර්ශනය අරමුණු කර ගනිමින් ප්‍රාධාන ශාලාවක් විශ්වවිද්‍යාලයේ ඉදිවීම හේතුවෙන් උපාධි ප්‍රදානෝත්සවය සඳහා එය මහඟු උපකාරයක් විය. උපාධි ප්‍රදානෝත්සවය සඳහා ආරාධිතකයින් ලෙස උසස් අධ්‍යාපන අමාත්‍ය එස්. බී. දිසානායක මැතිතුමා හා විදුලි සංදේශ සහ තොරතුරු තාක්ෂණ අමාත්‍ය රංජිත් සියඹලාපිටිය මැතිතුමා උත්සව සභාව අලංකාර කළහ.උපාධි ප්‍රදානෝත්සවය සැසිවාර දෙකකින් සමන්විත විය. උපාධිධාරීහු 576 දෙනෙක් මෙහි දී උපාධි ලැබූහ. දර්ශනසූරී උපාධි 02ක්ද පශ්චාද් උපාධි 38ක්ද පශ්චාද් උපාධි ඩිප්ලෝමා 13ක්ද සාමාන්‍ය උපාධි 523ක්ද කළමණාකරන කෙරිණ.

පළමු ජාත්‍යන්තර පර්යේෂණ සභාව "තිරසාර සංවර්ධනය හැමට සමසේ" යන තේමාව යටතේ විශ්වවිද්‍යාලයීය ප්‍රධාන ශාලාවේ දී 2014 අගෝස්තු මස 29-30 දෙදින තුළ පැවැත්විය. මේ සඳහා තුන්සියයකට (300) අධික පර්යේෂකයින් පිරිසක් ලෝකයේ විවිධ රටවල් 22කින් සහභාගි වූහ. මෙහි ප්‍රධාන දේශනය පවත්වන ලද්දේ මහාචාර්ය පැස්කල් බොඑක්ස් (Pascal Boeks) මහතා විසිණි. උපමාතෘකා 6 ක් යටතේ මෙම සමුළුව පැවැත්විණි. තවද 2014 වර්ෂයේ පශුසම්පත් ධීවර හා පෝෂණ පීඨයේ අපේක්ෂකයන්ගේ පර්යේෂණ සභාව 2014 නොවැම්බර් මස 05 වන දින ද කෘෂිකර්ම හා වැවිලි කළමනාකරණ පීඨයේ පර්යේෂණ සභාව 2014 අගෝස්තු 7 සහ 8 යන දිනයන්හිදීද පැවැත්විණි.

2014 වර්ෂය තුළදී වයඹ විශ්වවිද්‍යාලයේ පරිවර්තනයන් කිහිපයක් සිදු විය. 2013 ව්ර්ෂයේ අරම්භ කරන ලද යටිතල පහසුකම් වර්ධනය කිරීමේ වැඩසටහන් 2014 වර්ෂයේ දී නිමාවවට අත් වූ අතර කුලියාපිටිය පරිශ්‍රයේ පැවැත්වුණු " දැයට කිරුළ ජාතික ප්‍රදර්ශණය" පදනම් කොට ගෙන භූමි අලංකරණය සම්බන්ධ සුවිශේෂී වෙනස්කම් සිදු කෙරින. සියලු අභ්‍යන්තර මාර්ග ප්‍රතිසංස්කරණය කිරීම ද පුළුල් කිරීම ද කාපට් කිරීම ද සිදු විය. නවතම ක්‍රීඩා සංකීර්ණය (රු. මිලියන 250ක වියදමින් ඉදිකරන ලද), සම්පූර්ණයෙන් වායු සමනය කරන ලද ආසන 1000කින් සමන්විත ශ්‍රවණාගාරය (රු. මිලියන 250ක වියදමින් ඉදිකරන ලද), ශිෂ්‍ය මධ්‍යස්ථානය (රු. මිලියන 60කින් නිමකරන ලද), නැනෝ තාක්ෂණ විද්‍යාගාරය (රු. මිලියන 30කින් ඉදිකරන ලද ),

විශාල ජල ටැංකියකින් සමන්විතල නළ ළිංවලින් ද සමන්විත ජල සැපයුම් පද්ධතිය (රු .මිලියන 20ක් වැය කොට ගොඩ නගන ලද ) බොහොමයක් ගොඩනැගිලි සඳහා කෙටි ප්‍රවේශයන් ද විශ්වවිද්‍යාලයීය අථිති ශාලාව (Guest House ) ප්‍රතිසංස්කරණය කිරීම ද මෙසේ සම්පූර්ණ කරන ලද වැඩ අතර විය.

එක් නේවාසිකාගාරයක සිසුන් 400 යකට පහසුකම් සැපයෙන පරිදි ඉදි කරන ලද නේවාසිකාගාර පහක් (05) ආරම්භ කොට ඇත. මෙයින් නේවාසිකාගාර තුනක් (03) කුලියාපිටිය පරිශ්‍රයේ පිහිටා ඇති අතර දෙකක් මාකඳුර පරිශ්‍රයේ පිහිටා ඇත. ක්‍රීඩා පිටියේ වැඩ කටයුතු නිම වෙමින් පවතී. පශු සම්පත් ධීවර හා පෝෂණ පීඨයේ අවසන් අදියරෙහි ඉදි කිරීම් ආරම්භ වී ඇති අතර කෘෂිකර්ම හා වැවිලි කළමනාකරණ පීඨයේ දෙවන අදියරෙහි ඉදිකිරීම් අවසන් විය. මාකඳුර ෂත්ව ගොවිපල ඒකකයේ වැඩ කටයුතු සිදු කෙරෙමින් පවතී. මාකඳුර පරිශ්‍රයේ ප්‍රවේශ මාර්ග පළමු අදියරෙහි වැඩ කටයුතු සම්පූර්ණ කෙරිණි.

පීඨ හතරෙහි අධ්‍යයන කාර්ය මණ්ඩලය 500කට අධික පර්යේෂණ ලිපි ප්‍රමාණයක් පර්යේෂණ පත්‍රිකා ලෙෂත් උදෘත ලෙෂත් දේශීය හා ජාත්‍යන්තර සඟරාවන්හි මේ වර්ෂය තුළ පලකොට ඇත.

මෙම වර්ෂය තුළ පොත් 14ක් ප්‍රකාශනය කොට ඇති අතර නව සොයාගැනීම් හයක් (6) සිදුකොට ඇත. මෙම පර්යේෂණ කටයුතුවල පීඨ හතරෙහි බොහෝමයක් පශ්චාද් උපාධි සිසුන් සහ උපාධි අපේක්ෂකයන් ඍජුව නියැලී සිටින අතර නව සොයාගැනීම්වල ද නිරතව ඇත.

2014 වර්ෂය තුළ දී කාර්යමණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානය (SDC ) සහ වෘත්තීය මාර්ගෝපදේශණ ඒකකය (CGU) තම ඉලක්කයන් කරා යමින් බොහෝමයක් ක්‍රියාකාරකම්වල සක්‍රීයව දායක විය. කාර්යමණ්ඩල සංවරධන මධ්‍යස්ථානය විවිධ සේවක කණ්ඩායම් විවිධ අංශ වලින් පුහුණුව සඳහා සහභාගී කරවීය. එසේම වෘත්තීය මාර්ගෝපදේශන ඒකකය මගින් සිසුන් සඳහා පුහුණුව සපයන ලදී.

## 4.3 අසමර්ථ්‍යයන් හා සනාථ කිරීම

කුලියාපිටිය පරිශ්‍රයේ කේවල කාර්ය මණ්ඩල නිවාස ව්‍යාපෘතිය සම්පූර්ණ කිරීමට අපහසු විය. ඒ සඳහා විශ්වවිද්‍යාලය නඩුවක් ගොනු කොට ඇති අතර විභාග වන දිනයක් අපේක්ෂාවෙන් පසුවෙයි. ක්‍රීඩාපිටිය ද සම්පූර්ණ කිරීම අතපසු වූ අතර 2015 වර්ෂය අවසන් වන විට සම්පූර්ණ කිරීමට සැලසුම් කර ඇත.

## 4.4 අනාගත සැලසුම්


විශ්වවිද්‍යාලයේ පශ්චාද් උපාධි වැඩකටයුතු, පර්යේෂණ, බාහිර සම්බන්ධතා සහ සාමුහික කාර්යයන් පුළුල් වනු ඇත.

ඉදිකිරීම් ව්‍යාපෘති කිහිපයක් ද සැලසුම් කරනු ලැබ ඇත. නිදසුන් ලෙස -මාකඳුර පරිශ්‍රයේ ප්‍රවේශ මාර්ගය අදියර III, පශුසම්පත්, ධීවර හා පෝෂණ පීඨයේ සහ ව්‍යවහාරිකවිද්‍යා පීඨයේ ගොඩනැගිලි සංකීර්ණවල අවසන් අදියර සඳහන් කළ හැකිය. 2015 අවසන් වන විට සිසුන් 400 බැගින් පහසුකම් සැපයිය හැකි නව නේවාසිකාගාර තුනක් ඉදිකිරීමට අපේක්ෂිතය.

## 5. 2014 වර්ෂයේ මානව සම්පත් හා පිරිවැය තොරතුරු

2014 වර්ෂය තුළ දී පීඨ හතරෙහි සමස්ත ශිෂ්‍ය සංඛ්‍යාව 2856 ක් වූ අතර සමස්ත අධ්‍යයන කාර්ය මණ්ඩලය 143කි. එමෙන්ම සමස්ත අනධ්‍යයන කාර්ය මණ්ඩලය 125කි. 2013 සහ 2012 වර්ෂයන්හි පිළිවෙළින් සමස්ත ශිෂ්‍ය සංඛ්‍යාව 2572, 2113 ක් ද සමස්ත අධ්‍යයන කාර්ය මණ්ඩලය 132,119 සහ සමස්ත අනධ්‍යයන කාර්ය මණ්ඩලය 124, 102 පරිදි විය. 2014 වර්ෂය තුළදී ශිෂ්‍ය සංඛ්‍යාව සමස්ත අධ්‍යයන කාර්ය මණ්ඩලය සහ සමස්ත අනධ්‍යයන කාර්ය මණ්ඩලයද 2012 වර්ෂයට සාපේක්ෂව වර්ධනය වී ඇත. පීඨ හතර මගින් උපාධි 11ක් පිරිනමනු ලැබ ඇත. 2014 වර්ෂය තුළ දී ව්‍යවහාරිකවිද්‍යා පීඨය මගින් නව උපාධි පාඨමාලා තුනක් (03) අරම්භ කරනු ලැබ ඇත.

| පීඨය | උපාධි පාඨමාලාව | සමස්ත ශිෂ්‍ය සංඛ්‍යාව | සමස්ත අධ්‍යයන කාර්යය මණ්ඩලය | සමස්ත අනධ්‍යයන කාර්යය මණ්ඩලය |
|---|---|---|---|---|
| කෘෂිකර්ම හා වැවිලි කළමනාකරණ | විද්‍යාවේදී (කෘෂිකර්මය) | 454 | 37 | 43 |
| ව්‍යවහාරිකවිද්‍යා පීඨය | විද්‍යාවේදී (සාමාන්‍ය/) | 461 | 38 | 26 |
| | විද්‍යාවේදී (බද්ධ ප්‍රධාන විෂය) | | | |
| | විද්‍යාවේදී (විශේෂ)කර්මාන්ත කළමනාකරණ | | | |
| | විද්‍යාවේදී (විශේෂ)ගණිතය හා සංඛ්‍යානය | | | |
| | විද්‍යාවේදී (විශේෂ)ව්‍යවහාරික ඉලෙක්ට්‍රොණික විද්‍යාව | | | |
| ව්‍යාපාර අධ්‍යයන හා මූල්‍ය පීඨය | විද්‍යාවේදී (විශේෂ) බැංකු හා මූල්‍ය | 1521 | 34 | 16 |
| | විද්‍යාවේදී (විශේෂ) ව්‍යාපාර කළමනාකරණ | | | |
| | විද්‍යාවේදී (විශේෂ) රක්ෂණ හා තක්සේරුකරණය | | | |
| | විද්‍යාවේදී (විශේෂ) ගිණුම් හා ව්‍යාපාර මූල්‍ය | | | |
| පශු සම්පත්, ධීවර හා පෝෂණ පීඨය | විද්‍යාවේදී (ආහාර විද්‍යාව හා පෝෂණය) | 264 | 34 | 40 |
| | විද්‍යාවේදී (ආහාර නිෂ්පාදනය හා තාක්ෂණ කළමනාකරණය) | 156 | | |
| **එකතුව** | | **2856** | **143** | **125** |



## 6. 2014 ශිෂ්‍ය තොරතුරු

| පීඨය | උපාධි පාඨමාලාව | මාධ්‍යය | 2014 ශිෂ්‍ය කණ්ඩායම | පළමු වසර ශිෂ්‍ය සංඛ්‍යාව | දෙවන වසර ශිෂ්‍ය සංඛ්‍යාව | තුන්වන වසර ශිෂ්‍ය සංඛ්‍යාව | අවසන් වසර ශිෂ්‍ය සංඛ්‍යාව |
|---|---|---|---|---|---|---|---|
| කෘෂිකර්ම හා වැවිලි කළමනාකරණ | විද්‍යාවේදී (කෘෂිකර්මය) | ඉංග්‍රීසි | 142 | 142 | 112 | 102 | 98 |
| ව්‍යවහාරිකවිද්‍යා | විද්‍යාවේදී (සාමාන්‍ය) | ඉංග්‍රීසි | 163 | 163 | 120 | 130 | 48 |
| | විද්‍යාවේදී (බද්ධ ප්‍රධාන විෂය) | | | | | | |
| | විද්‍යාවේදී (විශේෂ)කර්මාන්ත කළමනාකරණ | | | | | | |
| | විද්‍යාවේදී (විශේෂ)ගණිතය හා සංඛ්‍යාතය | | | | | | |
| | විද්‍යාවේදී (විශේෂ)ව්‍යවහාරික ඉලෙක්ට්‍රොනික විද්‍යාව | | | | | | |
| ව්‍යාපාර අධ්‍යයන හා මූල්‍ය | විද්‍යාවේදී (විශේෂ) බැංකු හා මූල්‍ය | ඉංග්‍රීසි | 438 | 438 | 460 | 342 | 281 |
| | විද්‍යාවේදී (විශේෂ) ව්‍යාපාර කළමනාකරණය | | | | | | |
| | විද්‍යාවේදී (විශේෂ) රක්ෂණ හා තක්සේරුකරණය | | | | | | |
| | විද්‍යාවේදී (විශේෂ) ගිණුම් හා ව්‍යාපාර මූල්‍ය | | | | | | |
| පශු සම්පත්, ධීවර හා පෝෂණ | විද්‍යාවේදී (ආහාර විද්‍යාව හා පෝෂණය) | ඉංග්‍රීසි | 89 | 89 | 60 | 60 | 55 |
| | විද්‍යාවේදී (ආහාර නිෂ්පාදනය හා තාක්ෂණ කළමනාකරණය) | | 36 | 36 | 49 | 36 | 35 |
| **එකතුව** | | | **868** | **868** | **801** | **670** | **517** |

ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලයේ පළමු වසර සිට අවසන් වසර දක්වා වන සියලු උපාධි පාඨමාලා ඉංග්‍රීසි මාධ්‍යයෙන් පැවැත්වේ. 2014 වර්ෂයේ දී පවත්වන ලද උපාධිප්‍රදානෝත්සවයේ දී සිසුහු 493 දෙනෙක් උපාධි ලැබූහ.


## 7. 2014 - වයඹ විශ්වවිද්‍යාලයීය උපාධිධාරීන්ගේ සේවා නියුක්තිය

ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලයේ බාහිර සම්බන්ධතා ඒකකය (External Affairs Unit) මගින් ප්‍රශ්නාවලියක් උපයෝගී කොටගෙන මෙම තොරතුරු ලබා ගෙන විශ්ලේෂණය කෙරිණි.

2014 වර්ෂයේ දී උපාධිය හිමිකරගත් සිසුන්ගෙන් ලබාගත් තොරතුරු මත පදනම්ව මෙම අධ්‍යයනය පදනම් වූ අතර මෙම අධ්‍යයනයට අනුව මෙහි සඳහන් තොරතුරු සකසා ඇත. මෙම තොරතුරු උපාධිය සම්පූර්ණ කිරීම සහ උපාධි ප්‍රදානය අතර ඇති කාලය මත පදනම්ව පවතී. පීඨ හතරෙහි අවසන් විභාගය සහ උපාධි ප්‍රදානය අතර වන කාලය වෙනස්වන අතර කෘෂිකර්ම හා වැවිලි කළමනාකරණ පීඨයේ සහ පශුසම්පත් ධීවර හා පෝෂණ පීඨයේ එම කාල පරිච්ඡේදය දළ වශයෙන් මාස 3 1/2 ක් වන අතර ව්‍යවහාරිකවිද්‍යා පීඨයේ එය වසර 1ක් හා මාස 5කි. ව්‍යාපාර අධ්‍යයන හා මූල්‍ය පීඨයේ එය වසර 1ක් හා මාස 2කි.

ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලයේ සමස්ත රැකියා නියුක්තිය 89ග55 % ලෙස වාර්තා විය.


| ගණය | % |
|---|---|
| ස්ථිර | 58.21% |
| තාවකාලික | 29.85% |
| ස්වයං රැකියාවක නියුතු | 1.49% |
| සේවාවියුක්ත | 10.45% |
| **එකතුව** | **100.00%** |



## 7.1 කෘෂිකර්ම හා වැවිලි කළමනාකරණ පීඨය

| අංශය | ස්ථිර | තාවකාලික | ස්වයං රැකියාවක නියුතු | සේවාවියුක්ත | එකතුව |
|---|---|---|---|---|---|
| වැවිලි කළමනාකරණ | 8 | 16 | - | 7 | **31** |
| උද්‍යාන විද්‍යා හා භූමි අලංකරණ | 4 | 10 | - | 6 | **20** |
| ජීව තාක්ෂණ | 2 | 6 | - | 2 | **10** |
| කෘෂිව්‍යාපාර කළමනාකරණ | 8 | 11 | - | 9 | **28** |
| **එකතුව** | **22** | **36** | **-** | **12** | **89** |


| ස්ථිර | තාවකාලික | ස්වයං රැකියාවක නියුතු | සේවාවියුක්ත |
|---|---|---|---|
| 24.72% | 48.31% | 0% | 26.97% |



## 7.2 ව්‍යවහාරිකවිද්‍යා පීඨය

| අංශය | ස්ථිර | තාවකාලික | ස්වයං රැකියා නියුතු | සේවාවියුක්ත | එකතුව |
|---|---|---|---|---|---|
| කර්මාන්ත කළමනාකරණ | 15 | 06 | 00 | 02 | **23** |
| ගණිතමය විද්‍යා | 23 | 07 | 01 | 08 | **39** |
| ඉලෙක්ට්‍රොනික විද්‍යා | 16 | 11 | 00 | 03 | **30** |
| පරිගණක හා තොරතුරු පද්ධති | 14 | 02 | 00 | 04 | **20** |
| **එකතුව** | **68** | **26** | **01** | **8** | **112** |


| ස්ථිර | තාවකාලික | ස්වයං රැකියා නියුතු | සේවාවියුක්ත |
|---|---|---|---|
| 60.71% | 23.21% | 0.89% | 15.18% |



## 7.3 ව්‍යාපාර අධ්‍යයන හා මූල්‍ය පීඨය

| අංශය | ස්ථිර | තාවකාලික | ස්වයං රැකියාවක නියුතු | සේවාවියුක්ත | එකතුව |
|---|---|---|---|---|---|
| ව්‍යාපාර කළමනාකරණ | 65 | 20 | 03 | 06 | **96** |
| ගණකාධිකරණ හා ව්‍යාපාර මූල්‍ය | 29 | 32 | 00 | 13 | **74** |
| බැංකු හා මූල්‍ය | 06 | 03 | 00 | 01 | **10** |
| රක්ෂණ හා තක්සේරුකරණ | 17 | 03 | 00 | 01 | **21** |
| **එකතුව** | **117** | **60** | **03** | **21** | **201** |


| ස්ථිර | තාවකාලික | ස්වයං රැකියාවක නියුතු | සේවාවියුක්ත |
|---|---|---|---|
| 58.21% | 29.85% | 1.49% | 10.45% |



## 7.4 පශුසම්පත්, ධීවර හා පෝෂණ පීඨය

| අංශය | ස්ථිර | තාවකාලික | ස්වයං රැකියා නියුතු | සේවාවියුක්ත | එකතුව |
|---|---|---|---|---|---|
| ජල ජීවී වගා හා මත්ස්‍ය | 04 | 07 | 00 | 02 | **13** |
| පශුසම්පත් හා පක්ෂි විද්‍යා | 03 | 06 | 00 | 02 | **11** |
| ආහාර විද්‍යා හා තාක්ෂණ | 06 | 07 | 00 | 04 | **17** |
| ව්‍යවහාරික පෝෂණ | 0 | 11 | 00 | 05 | **16** |
| **එකතුව** | **13** | **31** | **00** | **13** | **57** |


| ස්ථිර | තාවකාලික | ස්වයං රැකියාවක නියුතු | සේවාවියුක්ත |
|---|---|---|---|
| 22.81% | 54.39% | 0% | 22.80% |



**2012 - 2014 කාලය අතර පීඨ හතරෙහි රැකියා නියුක්තිය පිළිබඳ සන්සන්දනාත්මක විග්‍රහය**

සේවා නියුක්තියේ ඉහළ අගයක් වාර්තා වන්නේ 2013 වර්ෂයේ වන අතර සේවා නියුක්තියේ පහළ අගයක් වාර්තා වන්නේ 2012 වර්ෂයේ දීය. සේවා වියුක්තියේ පහළ අගයක් වාර්තා වන්නේ 2013 වර්ෂයේ වන අතර 2014 වර්ෂයේදී එය 10.45% ක් දක්වා වර්ධනය වී ඇත. කෙසේ වෙතත් සේවා වියුක්තියේ ප්‍රතිශතය සන්සන්දනාත්මකව 2013 සහ 2014 වර්ෂයන්හි 2012 වර්ෂයට වඩා පහළ අගයක් ගනී. පහත සඳහන් ප්‍රස්තාරයෙන් පෙන්නුම් කෙරෙන්නේ 2012 සිට 2014 දක්වා කාලය අතර උපාධිධාරීන්ගේ සේවා නියුක්තිය පිළිබඳ තොරතුරුය.

2012, 2013, සහ 2014 වර්ෂයන්හි (පිළිවෙළින් ) විභාගය අවසන් වන දිනය සහ උපාධි ප්‍රදානෝත්සවය අතර කාලය තුළ උපාධිධාරීන්ගේ සේවා නියුක්තිය පිළිබඳ ප්‍රතිශතයන්.



## **8.** 2014 වර්ෂයේදී විශ්වවිද්‍යාලය මඟින් මෙහෙයවන ලද බාහිර පාඨමාලා පිළිබඳ විස්තර

***1.) ව්‍යාපාර අධ්‍යයන හා මූල්‍ය පීඨය***

- ව්‍යාපාර පරිපාලනය පිළිබඳ පශ්චාද් උපාධිය
- ව්‍යාපාර කළමනාකරණය පිළිබඳ පශ්චාද් උපාධි ඩිප්ලෝමා පාඨමාලාව
- රක්‍ෂණය ඩිප්ලෝමා පාඨමාලාව
- රක්‍ෂණය පිළිබඳ උසස් ඩිප්ලෝමා පාඨමාලාව
- පුද්ගල මූල්‍ය කළමනාකරණය පිළිබඳ සහතිකපත්‍ර පාඨමාලාව (AIA රක්‍ෂණ සමාගමේ කාර්යය මණ්ඩලය සඳහා මෙහෙය වන ලදී)

***2.) කෘෂිකර්ම හා වැවිලි කළමනාකරණ පීඨය***

- විද්‍යාවේදී වැවිලි කළමනාකරණ(බාහිර උපාධි) පාඨමාලාව
- ආහාර ව්‍යාපාර අලෙවිකරණය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව

***3.) ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීමේ ඒකකය – කුලියාපිටිය***

- ඉංග්‍රීසි ඩිප්ලෝමා පාඨමාලාව

***4.) ඉංග්‍රීසි ඉගැන්වීමේ ඒකකය – මාකඳුර***

- E- Learning මගින් ඉංග්‍රීසි සහතිකපත්‍ර පාඨමාලාව

***5.) තොරතුරු සන්නිවේදන තාක්‍ෂණ මධ්‍යස්ථානය – කුලියාපිටිය***

- තොරතුරු තාක්‍ෂණය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව
- තොරතුරු තාක්‍ෂණය පිළිබඳ සහතිකපත්‍ර පාඨමාලාව

***6.) තොරතුරු සන්නිවේදන තාක්‍ෂණ මධ්‍යස්ථානය – මාකඳුර***

- තොරතුරු තාක්‍ෂණය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව
- පරිගණක භාවිතය සහ කුසලතාසහතික පත්‍ර පාඨමාලාව
-

***7.) කාර්යමණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානය***

- ඉගෙනුම් තාක්ෂණය සහ ක්‍රමවේදය පිළිබඳ වෘත්තීය ඩිප්ලෝමා පාඨමාලාව
- කාර්යමණ්ඩල සංවර්ධනය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව

2014 වර්ෂයේ බාහිර පඨමාලා සඳහා ලියාපදිංචි වූ සහ සම්පූර්ණ කරන ලද ශිෂ්‍ය සංඛ්‍යාව

| පාඨමාලාව | **2014 වසරේදී ලියාපදිංචි වූ ශිෂ්‍ය සංඛ්‍යාව** | **2014 වසරේදී පාඨමාලාව සම්පූර්ණ කරන ලද ශිෂ්‍ය සංඛ්‍යාව** |
|---|---|---|
| අ. ව්‍යාපාර පරිපාලන පශ්චාද් උපාධි පාඨමාලාව | 101 (08 වන කණ්ඩායම ) | 37* |
| ආ. ව්‍යාපාර කළමනාකරණය පශ්චාද් උපාධි ඩිප්ලෝමාව | 123 (09 වන කණ්ඩායම) | 13* |
| ඇ. විද්‍යාවේදී වැවිලි කළමනාකරණ පශ්චාද් උපාධි පාඨමාලාව | 92 (09 වන කණ්ඩායම) | 30* |
| ඈ. රක්ෂණය පිළිබඳ උසස් ඩිප්ලෝමා පාඨමාලාව | 25 (02 කණ්ඩායම) | 64 (පළමු කණ්ඩායම) |
| ඉ. රක්ෂණය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව | 81 (06 වන කණ්ඩායම) | 79 (05 වන කණ්ඩායම) |
| ඊ. ඉංග්‍රීසි ඩිප්ලෝමා පාඨමාලාව | 301(08 වන කණ්ඩායම ) | හදාරමින් සිටී |
| උ. තොරතුරු තාක්ෂණය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව කුලියාපිටිය පරිශ්‍රය | 65 (05 වන කණ්ඩායම) | හදාරමින් සිටී |
| ඌ . තොරතුරු තාක්ෂණය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව මාකඳුර පරිශ්‍රය | 91 (04 වන කණ්ඩායම) | හදාරමින් සිටී |
| එ. ආහාර අලෙවිය පිළිබඳ ඩිප්ලෝමාව | 14 (02 වන කණ්ඩායම) | හදාරමින් සිටී |
| ඒ. ඉගැන්වීමේ තාක්ෂණ ක්‍රමවේදය පිළිබඳ වෘත්තීය ඩිප්ලෝමාව | 38 (02 වන කණ්ඩායම) | 35 (02 වන කණ්ඩායම) |
| ඔ. කාර්ය මණ්ඩල සංවර්ධනය පිළිබඳ සහතිකපත්‍ර පාඨමාලාව | 35 (08 වන කණ්ඩායම ) | හදාරමින් සිටිති |
| ඕ. පරිගණක භාවිතය සහ කුසලතා පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව | 74 (06 වන කණ්ඩායම) | 64 |
| ක. E- Learning මගින් ඉංග්‍රීසි සහතිකපත්‍ර පාඨමාලාව | 19 (03 වන කණ්ඩායම) | 14 (03 වන කණ්ඩායම) |

*** 2014 වර්ෂය තුළ දී සහතික පත්‍ර ලැබූ ශිෂ්‍ය සංඛ්‍යාව**

## 9. 2014 වර්ෂය තුළ දී ආරම්භ කරන ලද නව පාඨමාලා


| පීඨය / ඒකකය | පාඨමාලාව | මාධ්‍ය | සහතික පත්‍ර | ඩිප්ලෝමා | පශ්චාද් උපාධි ඩිප්ලෝමා | පරිපාලනාදිපති | දර්ශනපති | දර්ශනසූරී |
|---|---|---|---|---|---|---|---|---|
| **තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ මධ්‍යස්ථානය කුලියාපිටිය** | **තොරතුරු තාක්ෂණ** ඩිප්ලෝමාව | ඉංග්‍රිසි | - | √ | - | - | - | - |

## **10.** 2014.12.31 දිනට පීඨයන්හී හා ඒකකයන්හි අධ්‍යයන හා අධ්‍යයන සහායක කාර්යය මණ්ඩල තොරතුරු

| පීඨය | අධ්‍යයනාංශ | අනුමත සේවක සංඛ්‍යාව | ජ්‍යෙෂ්ඨ මහාචාර්ය | මහාචාර්ය | සහාය මහාචාර්ය | ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය | කථිකාචාර්ය / ආධුනික කථිකාචාර්ය | උපදේශක | පද්ධති ඉංජිනේරු | වෘත්තීය උපදේශක | වර්තමාන සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| කෘෂිකර්ම හා වැවිලි කළමනාකරණ | පීඨාධිපති කාර්යාලය | **2** | - | - | - | - | - | - | - | - | - | **2** |
| | කෘෂිව්‍යාපාර කළමනාකරණ | **8** | - | 2 | - | 2 | 4 | - | - | - | **8** | - |
| | ජෛව තාක්ෂණ | **9** | - | - | 1 | 4 | 4 | - | - | - | **9** | - |
| | උද්‍යාන විද්‍යා හා භූමි අලංකරණ | **10** | 1 | - | - | 4 | 4 | - | - | - | **9** | **1** |
| | වැවිලි කළමනාකරණ | **12** | - | 2 | - | 4 | 5 | - | - | - | **11** | **1** |
| ව්‍යවහාරිකවිද්‍යා | පීඨාධිපති කාර්යාලය | **1** | - | - | - | - | - | - | - | - | - | **1** |
| | පරිගණක හා තොරතුරු පද්ධති | **10** | - | - | - | 2 | 5 | - | - | - | **7** | **3** |
| | ඉලෙක්ට්‍රොනික විද්‍යා | **9** | 1 | 1 | - | 5 | 1 | - | - | - | **8** | **1** |
| | කර්මාන්ත කළමනාකරණ | **15** | - | - | - | 9 | 2 | - | - | - | **11** | **4** |
| | ගණිතමයවිද්‍යා | **14** | - | - | - | 7 | 5 | - | - | - | **12** | **2** |
| ව්‍යාපාර අධ්‍යයන හා මූල්‍ය | පීඨාධිපති කාර්යාලය | **2** | - | - | - | - | - | - | - | - | - | **2** |
| | ගණකාධිකරණ හා ව්‍යාපාර මූල්‍ය | **11** | - | - | - | 5 | 5 | - | - | - | **10** | **1** |
| | බැංකු හා මූල්‍ය | **8** | - | - | - | 5 | 2 | - | - | - | **7** | **1** |
| | ව්‍යාපාර කළමනාකරණ | **11** | - | - | 1 | 6 | 3 | - | - | - | **10** | **1** |
| | රක්ෂණ හා තක්සේරුකරණ | **7** | - | - | - | 2 | 5 | - | - | - | **7** | - |
| පශු සම්පත්, ධීවර හා පෝෂණ | පීඨාධිපති කාර්යාලය | **-** | - | - | - | 1 | - | - | - | - | - | - |
| | ජෛව තාක්ෂණ | **2** | - | - | - | 1 | 1 | - | - | - | **2** | - |
| | ව්‍යවහාරික පෝෂණ | **10** | - | - | - | 5 | 3 | - | - | - | **8** | **2** |
| | ජල ජීවී වගා හා මත්ස්‍ය | **8** | 1 | 1 | - | 4 | 1 | - | - | - | **7** | **1** |
| | ආහාර විද්‍යා හා තාක්ෂණ | **11** | - | - | - | 6 | 4 | - | - | - | **10** | **1** |
| | පශුසම්පත් හා පක්ෂි විද්‍යා | **8** | - | | | 4 | 3 | - | - | - | **7** | **1** |


| | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීමේ ඒකකය | ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීමේ ඒකකය – කුලියාපිටිය | **4** | - | - | - | - | 4 | - | - | - | **4** | **0** |
| | ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීමේ ඒකකය – මාකඳුර | **3** | - | - | - | - | - | 1 | - | - | **1** | **2** |
| තොරතුරු සන්නිවේදන තාක්ෂණ මධ්‍යස්ථානය | තොරතුරු සන්නිවේදන තාක්ෂණ මධ්‍යස්ථානය – කුලියාපිටිය | **5** | - | - | - | - | 3 | 1 | 1 | - | **5** | **-** |
| | තොරතුරු සන්නිවේදන තාක්ෂණ මධ්‍යස්ථානය – මාකඳුර | **6** | - | - | - | - | 2 | 1 | 1 | - | **4** | **2** |
| ශාරීරික අධ්‍යාපන ඒකකය | | **5** | - | - | - | - | - | 4 | - | - | 4 | **1** |
| වෘත්තීය මාර්ගෝපදේශන ඒකකය | | **1** | - | - | - | - | - | - | - | 1 | **1** | **0** |
| **එකතුව** | | **192** | **3** | **6** | **2** | **75** | **66** | **7** | **2** | **1** | **162** | **30** |

ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලයේ 30%ක් වූ අධ්‍යයන කාර්ය මණ්ඩලයද, 2%ක් වූ අධ්‍යයන සහායක කාර්ය මණ්ඩලයද, 6%ක් වූ විධායක නිරධාරීන්ද, 62%ක් වූ අනධ්‍යයන කාර්ය මණ්ඩලයද, ඇතුලත් වන 519ක් වූ කාර්ය මණ්ඩලයේ සහයෝගයෙන් ගත වූ වසර තුළ ඉලක්කයන් කරා කටයුතු කළේය





* පුස්තකාල අධ්‍යයන කාර්ය මණ්ඩලය ද මීට ඇතුලත්ය

අධ්‍යයන කාර්යය මණ්ඩලයේ ව්‍යාප්තිය, ජ්‍යෙෂ්ඨ මහාචාර්ය, මහාචාර්ය, සහාය මහාචාර්ය, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, කථිකාචාර්ය පිළිවෙළින් 2%, 4%, 1%, 49%, 44% යන ප්‍රතිශතයන්ගෙන් සමන්විත විය.




2012 - 2014 කාලය අතර තුර විශ්වවිද්‍යාලයේ කාර්යය මණ්ඩලය පිළිබඳ සන්සන්ධනයකි

| කාර්ය මණ්ඩලය | 2012 | 2013 | 2014 |
|---|---|---|---|
| අධ්‍යයන | 128 | 141 | 152 |
| අධ්‍යයන (පුස්තකාලයීය) | 04 | 05 | 05 |
| අධ්‍යයන සහායක | 08 | 08 | 11 |
| විධායක | 29 | 28 | 28 |
| අනධ්‍යයන | 271 | 317 | 323 |
| **එකතුව** | **440** | **499** | **519** |




## 11. 2013.12.31 දිනට අනධ්‍යයන කාර්යය මණ්ඩල තොරතුරු

| පීඨය/අංශය | විධායක නිලධාරී කාර්යය මණ්ඩලය | කාර්මික නිලධාරීන් | ලිපිකාර හා සමාන්තර ශ්‍රේණි | සුළු සේවක |
|---|---|---|---|---|
| උපකුලපති කාර්යාලය | 1 | - | 1 | 1 |
| ලේඛකාධිකාරී කාර්යාලය | 2 | - | 2 | 2 |
| අධ්‍යයන ආයතන අංශය | 1 | - | 5 | 1 |
| අනධ්‍යයන ආයතන අංශය | 1 | - | 4 | 1 |
| සාමාන්‍ය පාලන අංශය | 1 | - | 6 | 4 |
| මූලධන අංශය | 1 | - | 2 | 1 |
| අධ්‍යයන අංශය | 1 | - | 2 | 1 |
| පොදු සේවා ඒකකය - මාකඳුර පරිශ්‍රය | 2 | - | 2 | 3 |
| අභ්‍යන්තර විගණන අංශය | 1 | - | 3 | 1 |
| වෘත්තීය මාර්ගෝපදේශන ඒකකය | - | - | 1 | - |
| බාහිර සම්බන්ධතා අංශය | - | - | 1 | - |
| මූල්‍ය අංශය - කුලියාපිටිය පරිශ්‍රය | 3 | - | 9 | 2 |
| මූල්‍ය අංශය - මාකඳුර පරිශ්‍රය | 1 | - | 4 | 1 |
| ගබඩා සහ සැපයුම් අංශය | 1 | - | 5 | 2 |
| ආරක්ෂක සේවා | - | - | 3 | 3 |
| ප්‍රවාහන සේවා | - | - | - | 11 |
| ව්‍යවහාරිකවිද්‍යා පීඨය | 1 | 6 | 8 | 11 |
| කෘෂිකර්ම හා වැවිලි කළමනාකරණ පීඨය | 2 | 5 | 12 | 24 |
| ව්‍යාපාර අධ්‍යයන හා මූල්‍ය පීඨය | 1 | 1 | 8 | 6 |
| පශු සම්පත්, ධීවර හා පෝෂණ පීඨය | 2 | 9 | 10 | 19 |
| විභාග අංශය | 1 | - | 6 | 2 |
| පුස්තකාලය - කුලියාපිටිය පරිශ්‍රය | 1 | - | 8 | 8 |
| පුස්තකාලය - මාකඳුර පරිශ්‍රය | - | - | 4 | 3 |
| තොරතුරු සන්නිවේදන තාක්ෂණ මධ්‍යස්ථානය - කුලියාපිටිය පරිශ්‍රය | - | 1 | 2 | 2 |
| තොරතුරු සන්නිවේදන තාක්ෂණ මධ්‍යස්ථානය - මාකඳුර පරිශ්‍රය | - | 1 | 1 | 2 |
| ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීමේ ඒකකය - කුලියාපිටිය පරිශ්‍රය | - | - | 1 | 1 |

| | | | | |
|---|---|---|---|---|
| ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීමේ ඒකකය - මාකඳුර පරිශ්‍රය | - | - | 1 | 1 |
| වෛද්‍ය මධ්‍යස්ථානය - කුලියාපිටිය පරිශ්‍රය | - | 3 | 1 | 1 |
| වෛද්‍ය මධ්‍යස්ථානය - මාකඳුර පරිශ්‍රය | - | 3 | - | 1 |
| ශාරීරික අධ්‍යාපන ඒකකය | 1 | - | 1 | 7 |
| කාර්ය මණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානය | - | - | 1 | - |
| ශිෂ්‍ය හා සේවක සුබසාධක අංශය | 1 | - | 5 | 2 |
| නඩත්තු අංශය - කුලියාපිටිය පරිශ්‍රය | 2 | 4 | 5 | 25 |
| නඩත්තු අංශය - මාකඳුර පරිශ්‍රය | - | 1 | 1 | 7 |
| නේවාසිකාගාර - කුලියාපිටිය පරිශ්‍රය | - | - | 3 | 1 |
| නේවාසිකාගාර - මාකඳුර පරිශ්‍රය | - | - | 2 | 2 |
| **එකතුව** | **28** | **4** | **130** | **159** |

අනධ්‍යයන කාර්යය මණ්ඩල ව්‍යාප්තිය (විධායක නිලධාරීන් හැර) 2014 වර්ෂයේ දී 323ක් විය. ඊට කාර්මික, ලිපිකාර හා සමාන්තර සේවා සහ කනිෂ්ඨ කාර්ය මණ්ඩලය පිළිවෙළින් 11% ක්ද, 40% ක්ද, 49% ක් ද පරිදි විය.



# 12. පුස්තකාලය

## 12.1 පසුබිම් තොරතුරු

ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලයීය පුස්තකාලය පුස්තකාල දෙකකින් සමන්විතය. ඉන් එකක් කුලියාපිටිය පරිශ්‍රයේ පිහිටා ඇති අතර එමගින් ව්‍යවහාරිවිද්‍යා පීඨය සහ ව්‍යාපාර අධ්‍යයන හා මූල්‍ය පීඨය යන පීඨයන් දෙකට සේවය සපයන අතර අනෙක් පුස්තකාලය මාකඳුර පරිශ්‍රයේ පිහිටා ඇති අතර එමඟින් කෘෂිකර්ම හා වැවිලි කළමනාකරණ පීඨයට හා පශු සම්පත්, ධීවර හා පෝෂණ පීඨය යන පීඨවලට සේවය සපයයි.

## 12.2 ගොඩනැඟිලි

### 12.2.1 *කුලියාපිටිය පරිශ්‍රයේ පුස්තකාලය -*

පැරණි පරිපාලන ගොඩනැගිල්ලේ පළමු මහලෙහි කුලියාපිටිය පුස්තකාලය ස්ථාපිතව ඇත. පරිපාලන කාර්යාලය නව ගොඩනැඟිල්ලට ගෙන යාමෙන් පසු සමස්ත පළමු මහල පුරාම ව්‍යාප්ත කෙරිණිග ඒ අනුව වර්ග අඩි 7326කින් සමන්විත මුළු පළමු මහලෙහිම පුස්තකාලය ව්‍යාප්තව පවතී. මෙහි සිසුන් 141දෙනෙකුට අසුන් ගැනීමේ පහසුව ඇත.

### 12.2.2 *මාකඳුර පරිශ්‍රයේ පුස්තකාලය*

මාකඳුර පරිශ්‍රයේ පුස්තකාලය ප්‍රධාන මාර්ගයට ආසන්නව, පීඨ දෙක අතර මැද පිහිටා ඇත. මෙම පුස්තකාලය නව දෙමහල් ගොඩනැගිල්ලකින් සමන්විත වන අතර මෙය වර්ග අඩි 7200කින් සමන්විත වේ. සිසුන් 125කට අසුන් ගැනීමේ හැකියාව ඇත. මෙම නව ගොඩනැගිල්ල 2006 ජූලි මස 27 දින විවෘත කරන ලද්දකි.

## 12.3 නව ජයග්‍රහණ

### 12.3.1 ප්‍රකාශන

- ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලයාධිකාරී ඩබ්. එම්. තුසිතා කුමාරි මිය සහ සහකාර පුස්තකාලයාධිකාරී ඩී. ජී. ඒ. එස්. මල්කාන්ති මිය “විශ්වවිද්‍යාලීය පුස්තකාලවල සමබර හා අදාළ පොත් එකතුවක් ගොඩනැගීම සඳහා තොරතුරු ලබාගැනීමේ අවශ්‍යතාව” යන මැයෙන් සාමුහික ප්ර්යේෂණ පත්‍රිකා Indian Journal of Research Management Business and Social Science (LIRMBSS) Vol II/I 2014 හි 68-72 පිටුවල පළකිරීම

- පුස්තකාලයීය ප්‍රකාශන - ආයතනික පුහුණු වාර්තා vol I (1994 - 2010) කෘෂිකර්ම හා වැවිලි කළමනාකරණ පීඨය හා පශු සම්පත්, ධීවර හා පෝෂණ පීඨය. සම්පාදනය ඩබ්. එම්. තුසිතා කුමාරි. ප්‍රධාන පුස්තකාලය ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලය කුලියාපිටිය 2014

- පුස්තකාලයීය පුවත් - 2014

  මෙය 2015 වර්ෂයේ පෙබරවාරි මස අවසානයේ දී ප්‍රකාශයට පත් කිරීමට නියමිතව පැවතුනි

## 12.3.2 වෙනත්

- විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිශන් සභාව විසින් මෙහෙය වන ලද "Consortia" සඳහා දායකවීමේ ප්‍රතිපලයක් ලෙස විශ්වවිද්‍යාල අතර සම්පත් හුවමාරු කරගැනීමේ ක්‍රමය අනුව 2014 වර්ශය තුළ පුස්තකාල අතර ඉබොහෝ සම්පත් හුවමාරු කරගැනීම සිදුවිය

- " අධ්‍යයන කාර්ය මණ්ඩලය සහ ශිෂ්‍ය ප්‍රජාව අතර ස්වයංක්‍රීය පුස්තකාල භාවිතය" යන මැයෙන් මාකඳුර පීඨ දෙකෙහි නව වැඩපිළිවෙලක් ආරම්භ විය.

- පුස්තකාලය මගින් ගොඩනංවන ලද " ඉගෙනුම් කුසලතාසංවර්ධන වැඩසටහන " පිළිබඳ නව යෝජනාව ව්‍යවහාරිකවිද්‍යා පීඨයේ ශිෂ්‍ය අත්පොතෙහි ඇතුලත් කරන ලද අතර 2015 අධ්‍යයන වර්ෂ්යේ සිට සියලු සිසුන් සඳහා ඔවුන්ගේ අධ්‍යයන කටයුතු සඳහා මෙම ක්‍රමවේදය ක්‍රියාත්මක වනු ඇත.

- මහජන සේවා සැපයීමේ ක්‍රමවේදයේ ප්‍රතිඵලයක් ලෙස පුස්තකාල කළමනාකරණ හා e-library පහසුකම් තාක්ෂණ හැකියා වර්ධනය කිරීමේ වැඩ මුළු දෙකක් පහත සඳහන් පරිදි පැවැත්විණි.

    1. වෘත්තීය හා අර්ධ වෘත්තීය පුස්තකාල කාර්ය මණ්ඩල සමාජිකයින් සඳහා පුස්තකාල කලමණාකරනය වැඩමුළුව 2014 මැයි මස 24 දින පන්නල ප්‍රාදේශීය සභාවෙ මාකඳුර මහජන පුස්තකාලයේදී ඩබ්. එම්. තුසිතා කුමාරි, ඩබ් පුණ්‍යවර්ධන, ඩී ජී ඒ එස් මල්කාන්ති සහ කේ ජී අයි ජයවර්ධන යන නිලධාරීන්ගේ සම්පත් දායකත්වයෙන් සිදු කෙරිණ.

    2. කුලියාපිටිය නගර සහා බල ප්‍රදේශයට අයත් අ. පො. ස. උ. පෙළ සිසුන්ගේ විද්‍යුත් පුස්තකාල හා තොරතුරු සකසන කුසලතාවර්ධනය සඳහා කුලියාපිටිය මහජන පුස්තකාලය මගින් සංවිධානය කරන ලද වැඩසටහන සඳහා සම්පත් දායකයන් ලෙස සහකාර පුස්තකාලයාධිකාරී කේ ජී අයි ජයවරධන මහතා සහ පද්ධති විශ්ලේෂක ඊ එම් සී එල් ඒකනායක මහතා 2014 ජුනි 10 වෙනි දින සහභාගි වූහ.

- කැලණිය විශ්වවිද්‍යාලයේ පුස්තකාල හා තොරතුරු විද්‍යා උපාධිධාරීන් සඳහා සයමාසික අභ්‍යන්තර පුහුණු වැඩසටහන කියාත්මක විය.

- ශ්‍රී ලංකා පුස්තකාල සංගමයේ පුස්තකාල හා තොරතුරු විද්‍යා ඩිප්ලෝමා ශිෂ්‍යයන් හතර දෙනෙකු සඳහා දින 10ක පුහුණු වැඩසටහනක් ක්‍රියාත්මක කෙරිණ.

- විශ්ව විද්‍යාල ප්‍රජාව සඳහා විශ්වවිද්‍යාලයීය අන්තර ජාලය මගින් විවෘත සම්පත් පිළිබඳ දත්ත පහසුකම් සහ විද්‍යුත්සඟරා දත්ත පහසුකම් අඛණ්ඩව සැපයිණි.

- කුලියාපිටිය සහ මාකඳුර පුස්තකාල දෙකෙහි වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ කටයුතු (2014) සාර්ථකව සිදු කෙරිණ.

## 12.4. පුස්තකාල හඳුන්වා දීමේ වැඩසටහන

අ. කුලියාපිටිය පරිශ්‍ර පුස්තකාලය

පහත සඳහන් පරිදි කුලියාපිටිය පරිශ්‍රයේ ප්‍රධාන පුස්තකාලය මගින් පීඨ දෙකෙහි 2014 වර්ෂයේ නව ශිෂ්‍ය කණ්ඩායම් සඳහා පුස්තකාලය හඳුන්වා දීමේ වැඩසටහන සිදු කෙරිණි.

- ව්‍යවහාරිකවිද්‍යා පීඨය - 2014 මැයි මස 23 සහ 25 දින
- ව්‍යාපාර අධ්‍යයන හා මූල්‍ය පීඨය - 2014 සැප්තැම්බර් මස 03 සහ 04 දිනයන් සහ 2014 වර්ෂයේ සැප්තැම්බර් 10 සහ 11 දිනයන්හි

ආ. මාකඳුර පරිශ්‍රයේ පුස්තකාලය

2014 වර්ෂයේ බඳවා ගන්නා ලද නව ශිෂ්‍ය කණ්ඩායම සඳහා (පීඨ දෙකට අයත් ) පුස්තකාලය හඳුන්වා දීමේ වැඩසටහන පහත සඳහන් පරිදි සාර්ථකව කෙරිණ.

- පශු සම්පත්, ධීවර හා පෝෂණ පීඨය - 2014 මාර්තු මස 31 වන දින
- කෘෂිකර්ම හා වැවිලි කළමනාකරණ පීඨය - 2014 අප්‍රේල් මස 01 වන දින

## 12.5 වැඩමුළු

- ප්‍රධාන පුස්තකාලයේ සහකාර පුස්තකාලයාධිකාරී කේ ජී අයි ජයවර්ධන මාහතා මාකඳුර පරිශ්‍රයේ තොරතුරු හා අන්නිවේදන තාක්ෂණය මධ්‍යස්ථානයේ දී 2014 ජනවාරි මස 31 වන දින පැවැත්වූ "Introduce Web Based Training (WBT) for staff" නමැති වැඩමුළුව සඳහා සහභාගි විය.
- පුස්තකාලයාධිපති ඩබ්. ජී. පී ගම්ලත් මහතා, ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලයාධිකාරී ඩබ් එම් තුසිතා කුමාරි මහත්මිය සහ ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලයාධිකාරී ඩබ්. පුන්‍යවර්ධන මහතා " Open Access to Research Information Awareness Raising යන මැයෙන් 2014 පෙබරවාරි මස 28 දින කොළඹ ජාතික විඥාපන විද්‍යා ආයතනයේ පවත්වන ලද සම්මන්ත්‍රණය සඳහා සහභගි වූහ.
- ඩී ජී එස් මල්කාන්ති මහත්මිය ( සහකාර පුස්තකාලයාධිකාරි මාකඳුර පරිශ්‍රය) කොළඹ විශ්වවිද්‍යාලයේ පුස්තකාල හා විඥාපන විද්‍යා ජාතික ආයතනයේ 2014 මාර්තු අස 15 දින පැවති " Digital Library" වැඩමුළුව සඳහා සහභාගි වූවාය.
- පුස්තකාලයාධිපති ඩබ් ජී පී ගම්ලත් මහතා සහ ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලයාධිකාරි ඩබ් එම් තුසිතා කුමාරි මිය " Introduction to Electronic Resource Management " යන මැයෙන් පවත්වන ලද වැඩමුළුව සඳහා සහභාගි වූහ. මෙය INASP ආයතනය මගින් කොළඹ විශ්වවිද්‍යාලයේ දී 2014 මාර්තු මස 25 -27 දිනයන්හි දී පැවැත්විණි.
- ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලයාධිකාරි ඩබ් පුන්‍යවර්ධන මහතා "Indigeneous Knowledge for National Development : Role of Library" යන මැයෙන් 2014 ජුලි මස 25 වන දින NSLRC මෙහෙයවන ලද වැඩ මුළුව සඳහා සහභාගි විය.
- ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලයාධිකාරි ඩබ් එම් තුසිතා කුමාරි මිය " Planning and Implementation of Information Library Programme in Universities" යන මැයෙන් 2014 ජුලි මස 24-25 දියන්හි දි කොළඹ විශ්වවිද්‍යාලයේ පැවති වැඩමුළුවට සහභාගි විය.
- ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලයාධිකාරි ඩබ් එම් තුසිතා කුමාරි මිය " Marketing and Promotion of Electronic Resource" යන මැයෙන් SNASP ආයතනය මගින් 2014 නොවැම්බර් මස 26-28 දිනයන්හී පවත්වන ලද වැඩමුළුවට සහභාගි විය.

- කේ ඒ ඩී පි අබේගුණවර්ධන මහතා (සහකාර ලේඛකාධිකාරී - පුස්තකාල සේවා ) " Inductive Training Pragramme for New Recruits of Administrative and Financial Officer Grades in University Service" යන මැයෙන් 2014 වර්ෂයේ පවත්වන ලද වැඩමුළු සඳහා සහභාගි විය. එම වැඩමුළු පහත සඳහන් පරිදි පැවැත්විණි.
    - 2014 මැයි 19 සිට 23 දක්වා - ශ්‍රී ලංකා පදනම් ආයතනය, කොළඹ
    - 2014 සැප්තම්බර් 10 සිට 14 දක්වා ජානකී හෝටලය, කොළඹ

- 2014 අගෝස්තු මස 27 සහ 28 දිනයන්හි පද්ධති විශ්ලේෂක ඊ එම් සී එල් ඒකනායක මයා විසින් ප්‍රධාන පුස්තකාලයේ දී පරිශ්‍ර දෙකෙහිම පුස්තකාල සහයකයින් සඳහා තොරතුරු තාක්ෂණ කුසලතාවර්ධනය කරගැනීම සඳහා දෙදින විශේෂිත වැඩමුළුවක් පවත්වන ලදි.
- මාකඳුර පරිශ්‍රයේ පුස්තකාල සහකාර වයි එම් ඒ ජී යාපා මයා සහ පුස්තකාල සහකාර එච් ඩී කේ හේරත් යන අය " Computer Operating System and Data Base Management " යන මැයෙන් 2014 ජුනි මස 04, 11, 18, 25 සහ ජුලි මස 02 දිනවල දී මාකඳුර පරිශ්‍රයේ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ මධ්‍යස්තානයේ දී පවත්වන ලද වැඩමුළුව සඳහා සහභාගී වූහ.

## 12.6 ලියාපදිංචි වූ පාඨකයින්

**අ) කුලියාපිටිය පරිශ්‍රයේ පුස්තකාලය**

| පාඨකයින් | 2014.12.31 දිනට පාඨක සංඛ්‍යාව | 2014 වර්ෂයේ ලියාපදිංචි වූ පාඨක සංඛ්‍යාව |
|---|---|---|
| සිසුන් | 2054 | 567 |
| අධ්‍යයන කාර්යය මණ්ඩලය<br>ස්ථිර<br>තාවකාලික | <br>59<br>86 | <br>04<br>17 |
| විධායක නිලධාරී කාර්යය මණ්ඩලය | 08 | 01 |
| අනධ්‍යයන කාර්යය මණ්ඩලය | 89 | 10 |

**ආ) මාකඳුර පරිශ්‍රයේ පුස්තකාලය**

| පාඨකයින් | 2014.12.31 දිනට පාඨක සංඛ්‍යාව | 2014 වර්ෂයේ ලියාපදිංචි වූ පාඨක සංඛ්‍යාව |
|---|---|---|
| සිසුන් | 890 | 189 |
| අධ්‍යයන කාර්යය මණ්ඩලය<br>ස්ථිර<br>තාවකාලික | <br>59<br>86 | <br>02<br>15 |
| විධායක නිලධාරී කාර්යය මණ්ඩලය | 08 | 01 |
| අනධ්‍යයන කාර්යය මණ්ඩලය | 89 | 05 |

## 12.7 පොත් සහ වාර සඟරා සඳහා වැය ශීර්ෂය

*පුස්තකාලයීය* ප්‍රතිපාදන :

පොත් සහ වාර සඟරා - රු. 4, 675, 000.00 (මිලියන 4.675) - ප්‍රධාන පුස්තකාලය

- රු. 3, 600, 000.00 (මිලියන 3.6) - මාකඳුර පුස්තකාලය

*වැය:*

**අ) කුලියාපිටිය පරිශ්‍රයේ පුස්තකාලය**

| පොත් | වාර සඟරා |
|---|---|
| රු. 577,775.35 | රු. 17,182.00 |

**සමස්ත වියදම - රු. 594,957.35**

**ආ) මාකඳුර පරිශ්‍රයේ පුස්තකාලය**

| පොත් | වාර සඟරා |
|---|---|
| රු. 92,350.00 | රු. 148,941.00 |

**සමස්ත වියදම - රු. 241,291.00**

## 12.8 පොත් තොග

2014.12.31 දිනට පරිග්‍රහණ ලේඛනයට අනුව සමස්ත පොත් තොගය.

**කුලියාපිටිය පරිශ්‍රයේ පුස්තකාලය** - 36378

**මාකඳුර පරිශ්‍රයේ පුස්තකාලය** - 17322

සලකා බලන වර්ෂය තුළ කුලියාපිටිය පරිශ්‍රයේ පුස්තකාලය පොත් 782ක් පරිග්‍රහණ ලේඛනගත කොට තිබූ අතර එයින් 579ක් පරිත්‍යාගයන්ය. මාකඳුර පරිශ්‍රයේ පුස්තකාලය පොත් 64ක් ලේඛන ගත කර තිබූ අතර එයින් 43ක් පරිත්‍යාගයන්ය.

## 12.9 ආදායම

### 12.9.1 පුස්තකාල දඩ

අ) **කුලියාපිටිය පරිශ්‍රයේ පුස්තකාලය**

| | |
|---|---|
| නැති වූ පොත් සඳහා අයකර ගැනීම | - රු. 17680.00 |
| පුස්තකාල කාඩ්පත් අනුපිටපත් නිකුතුව | - රු. 1075.00 |
| ප්‍රමාද ගාස්තු | - රු. 66,220.00 |
| එකතුව | - රු. 84,975.00 |

ආ) **මාකඳුර පරිශ්‍රයේ පුස්තකාලය**

| | | |
|---|---|---|
| නැති වූ පොත් සඳහා අයකර ගැනීම | - රු. | 3810.00 |
| පුස්තකාල කාඩ්පත් අනුපිටපත් නිකුතුව | - රු. | 200.00 |
| ප්‍රමාද ගාස්තු | - රු. | 695.00 |
| එකතුව | - රු. | 4705.00 |

## 12.9.2 ඡායා පිටපත් සේවාව

අ) **කුලියාපිටිය පරිශ්‍රයේ පුස්තකාලය**

| | | |
|---|---|---|
| ඡායා පිටපත් කූපන් නිකුතුව | - රු. | 68 050.00 |
| ආදායම | - රු. | 68 050.00 |

ආ) මාකඳුර **පරිශ්‍රයේ පුස්තකාලය**

| | | |
|---|---|---|
| ඡායා පිටපත් කූපන් නිකුතුව | - රු. | 16 9000.00 |
| ආදායම | - රු. | 16 9000.00 |

## 12.9.3 පොත් බැඳීම් අංශයේ සංඛ්‍යා ලේඛන

| | |
|---|---|
| බඳින ලද පොත් සංඛ්‍යාව | - 484 |
| පිළිසකර කරන ලද පොත් | - 10 |

## 12.10 2014.12.31 දිනට පුස්තකාල කාර්යය මණ්ඩලය

**(අධ්‍යයන, අධ්‍යයන සහායක සහ පරිපාලන මණ්ඩලය )**

| පුස්තකාලය | අනුමත කාර්ය මණ්ඩලය | පුස්තකාලයාධිපති | ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලයාධිකාරී | සහකාර පුස්තකාලයාධිකාරී | සහකාර ලේඛනාධිකාරී (පුස්තකාල සේවා) | පද්ධති විශ්ලේෂක | එකතුව | පුරප්පාඩු ගණන |
|---|---|---|---|---|---|---|---|---|
| **කුලියාපිටිය පරිශ්‍රයේ පුස්තකාලය** | 5 | 1 | 1 | 1 | 1 | 1 | **5** | **0** |
| **මාකඳුර පරිශ්‍රයේ පුස්තකාලය** | 2 | - | 1 | 1 | - | - | **2** | **0** |

## **13.** 2014 වර්ෂයේ උපාධි අපේක්ෂකයන් සඳහා නේවාසිකාගාර පහසුකම් සැපයීම


| විශ්වවිද්‍යාල නේවාසිකාගාර | නේවාසිකාගාර පහසුකම් ලැබුනු සිසුන් සංඛ්‍යාව | | කුලියට ගන්නා ලද නේවාසිකාගාර | ඉඩ පහසුකම් ලැබුණු සිසුන් සංඛ්‍යාව | |
|---|---|---|---|---|---|
| | ශිෂ්‍යයන් | ශිෂ්‍යාවන් | | ශිෂ්‍යයන් | ශිෂ්‍යාවන් |
| පණ්ඩුකාභය – කුලියාපිටිය | - | 60 | කාරියවසම් (1 සහ 2 මහළ) | 89 | - |
| දීඝගාමිණී - කුලියාපිටිය | - | 56 | | | |
| ස්වර්ණපාලී - කුලියාපිටිය | 60 | - | | | |
| චිත්‍රාදේවී- කුලියාපිටිය | 60 | - | | | |
| නව කාන්තා නේවාසිකාගාරය I - කුලියාපිටිය | - | 80 | | | |
| නව කාන්තා නේවාසිකාගාරය II - කුලියාපිටිය | - | 98 | | | |
| සපුමල් බණ්ඩාර I සහ II - මාකඳුර | 101 | - | | | |
| බිසෝ බණ්ඩාර I සහ II - මාකඳුර | - | 125 | | | |
| **එකතුව** | **221** | **419** | **එකතුව** | **89** | |

2014 වර්ෂයේ විශ්වවිද්‍යාලයේ සමස්ත පිරිමි සහ ගැහැණු ශිෂ්‍ය සංඛ්‍යාව පිළිවෙළින් 1154ක් සහ 1702 විය.


එයින් පිරිමි 221 සහ ගැහැණු 419ක් සඳහා විශ්වවිද්‍යාලයීය නේවාසික පහසුකම් සැපයිණි. සාමාන්‍යයෙන් විශ්වවිද්‍යාලය මගින් නිවසේ සිට විශ්වවිද්‍යාලයට ඇති දුර ප්‍රමාණය සලකා පළමු සහ අවසන් වසර සිසුන් සඳහා නේවාසිකාගාර පහසුකම් සපයනු ලැබේ.

2014 වර්ෂයේ දී කුලියට ගන්නා ලද නේවාසිකාගාරය මඟින් සිසුන් (පිරිමි ) 89 කට නේවාසික පහසුකම් සැපයිණි.

**2013 නේවාසිකාගාර පහසුකම් – ශිෂ්‍යයන් සඳහා**





**2013 නේවාසිකාගාර පහසුකම් – ශිෂ්‍යාවන් සඳහා**



**2012 - 2014 කාලය අතර උපාධි අපේක්ෂකයින් සඳහා නේවාසිකාගාර පහසුකම් සැපයීම පිළිබඳ සන්සන්ධනයක්**

| වර්ෂය | විශ්වවිද්‍යාල නේවාසිකාගාර | | කුලියට ලබා ගත් නේවාසිකාගාර | | එකතුව |
|---|---|---|---|---|---|
| | ශිෂ්‍යයන් | ශිෂ්‍යාවන් | ශිෂ්‍යයන් | ශිෂ්‍යාවන් | |
| 2012 | 240 | 336 | 150 | 40 | 766 |
| 2013 | 240 | 316 | 60 | 40 | 656 |
| 2014 | 221 | 419 | 89 | - | 729 |





**13.1** 2014 වර්ෂයේ කුලියට ගන්නා ලද නේවාසිකාගාර සඳහා වාර්ෂික වියදම

| (කුලියාපිටිය පරිශ්‍රයේ) නේවාසිකාගාර | වියදම රු. |
|---|---|
| කාරියවසම් (පලමු සහ දෙවන මහල) | 270,000.00 |
| එකතුව | **270,000.00** |

## 14. මහපොළ / ශිෂ්‍යාධාර ලැබූ ශිෂ්‍ය පිරිස

| පීඨය | මහපොළ | ශිෂ්‍යාධාර |
|---|---|---|
| කෘෂිකර්ම හා වැවිලි කළමනාකරණ පීඨය | 78 | 141 |
| ව්‍යවහාරිකවිද්‍යා පීඨය | 61 | 227 |
| ව්‍යාපාර අධ්‍යයන හා මූල්‍ය **පීඨය** | 506 | 621 |
| පශු සම්පත්, ධීවර හා පෝෂණ **පීඨය** | 176 | 84 |
| **එකතුව** | **821** | **1073** |

2014 වර්ශයේ සමස්ත ශිෂ්‍ය සංඛ්‍යාව වූ 2856 ක් වූ ශිෂ්‍ය පිරිසකගෙන් 821 දෙනෙකු සඳහා මහපොල ශිෂ්‍යත්ව හිමිකම ලැබුණි. 1073 වූ ශිෂ්‍ය පිරිස සඳහා ශිෂ්‍යාධාර හිමිකම ලැබුණි. ප්‍රතිශතයක් ලෙස ගත් කල්හි 29%ක් සඳහා මහපොල හිමිකම ලැබුණු අතර 38% ක් ශිෂ්‍යාධාර හිමිකම ලැබූහ.




**ශිෂ්‍යාධාර/ මහපොළ ශිෂ්‍යත්ව ලැබීම් - 2013**

2012 - 2014 කාලය තුළ මහපොළ හා ශිෂ්‍යාධාර හිමිකම් ලැබූ ශිෂ්‍ය සංඛ්‍යාව පිළිබඳ සන්සන්ධනයක්

| පීඨය | ශිෂ්‍යාධාර | | | මහපොළ | | |
|---|---|---|---|---|---|---|
| | **2012** | **2013** | **2014** | **2012** | **2013** | **2014** |
| කෘෂිකර්ම හා වැවිලි කළමනාකරණ | 124 | 128 | 141 | 125 | 89 | 78 |
| ව්‍යවහාරිකවිද්‍යා | 167 | 357 | 227 | 77 | 52 | 61 |
| ව්‍යාපාර අධ්‍යයන හා මූල්‍ය | 354 | 599 | 621 | 493 | 397 | 506 |
| පශු සම්පත්, ධීවර හා පෝෂණ | 116 | 216 | 84 | 192 | 76 | 176 |
| **එකතුව** | **761** | **1300** | **1073** | **887** | **614** | **821** |

## 15. පර්යේෂණ, නව සොයා ගැනීම් හා ප්‍රකාශන පිළිබඳ තොරතුරු

| විෂය | ප්‍රකාශයට පත් කරන ලද | | වාණිජ මට්ටමට පත් කිරීම් | | ඉදිරිපත් කිරීම් | |
|---|---|---|---|---|---|---|
| | ජාතික | ජාත්‍යන්තර | ජාතික | ජාත්‍යන්තර | ජාතික | ජාත්‍යන්තර |
| අ. පර්යේෂණ සංඛ්‍යාව | 134 | 101 | - | - | 86 | 86 |
| ආ. නවසොයා ගැනීම් සංඛ්‍යාව | 01 | 05 | - | - | - | 05 |
| ඇ. වාර සඟරා සංඛ්‍යාව | 82 | 51 | - | - | 34 | 04 |
| ඈ. පොත් සංඛ්‍යාව | 13 | 02 | - | - | 01 | - |
| ඉ. ලිපි සංඛ්‍යාව | 49 | 53 | - | - | 01 | 05 |
| ඊ. වෙනත් | 12 | 01 | 03 | - | 02 | 01 |
| **එකතුව** | **291** | **213** | **03** | **-** | **124** | **101** |

### 15.1 කෘෂිකර්ම හා වැව්ලි කළමනාකරණ පීඨය

| විෂය | ප්‍රකාශයට පත් කරන ලද | | වාණිජ මට්ටමට පත් කිරීම් | | ඉදිරිපත් කිරීම් | |
|---|---|---|---|---|---|---|
| | ජාතික | ජාත්‍යන්තර | ජාතික | ජාත්‍යන්තර | ජාතික | ජාත්‍යන්තර |
| අ. පර්යේෂණ සංඛ්‍යාව | 78 | 36 | - | - | 26 | 21 |
| ආ. නවසොයා ගැනීම් සංඛ්‍යාව | - | - | - | - | - | - |
| ඇ. වාර සඟරා සංඛ්‍යාව | 43 | 29 | - | - | - | - |
| ඈ. පොත් සංඛ්‍යාව | 07 | - | - | - | - | - |
| ඉ. ලිපි සංඛ්‍යාව | 26 | 32 | - | - | - | - |
| ඊ. වෙනත් | - | - | - | - | - | - |
| **එකතුව** | **154** | **97** | **-** | **-** | **26** | **21** |

**15.2** ව්‍යවහාරිකවිද්‍යා පීඨය

| විෂය | ප්‍රකාශයට පත් කරන ලද | | වාණිජ මට්ටමට පත් කිරීම් | | ඉදිරිපත් කිරීම් | |
|---|---|---|---|---|---|---|
| | ජාතික | ජාත්‍යන්තර | ජාතික | ජාත්‍යන්තර | ජාතික | ජාත්‍යන්තර |
| අ. පර්යේෂණ සංඛ්‍යාව | 06 | 33 | - | - | 08 | 23 |
| ආ. නවසොයා ගැනීම් සංඛ්‍යාව | - | - | - | - | - | - |
| ඇ. වාර සඟරා සංඛ්‍යාව | 33 | 08 | - | - | 33 | - |
| ඈ. පොත් සංඛ්‍යාව | 01 | - | - | - | 01 | - |
| ඉ. ලිපි සංඛ්‍යාව | - | 05 | - | - | - | - |
| ඊ. වෙනත් | 02 | 01 | - | - | 02 | 01 |
| **එකතුව** | **42** | **47** | **-** | **-** | **44** | **26** |

**15.3** ව්‍යාපාර අධ්‍යයන හා මූල්‍ය පීඨය

| විෂය | ප්‍රකාශයට පත් කරන ලද | | වාණිජ මට්ටමට පත් කිරීම් | | ඉදිරිපත් කිරීම් | |
|---|---|---|---|---|---|---|
| | ජාතික | ජාත්‍යන්තර | ජාතික | ජාත්‍යන්තර | ජාතික | ජාත්‍යන්තර |
| අ. පර්යේෂණ සංඛ්‍යාව | 01 | 02 | - | - | 02 | 02 |
| ආ. නවසොයා ගැනීම් සංඛ්‍යාව | - | - | - | - | - | - |
| ඇ. වාර සඟරා සංඛ්‍යාව | 05 | 06 | - | - | - | - |
| ඈ. පොත් සංඛ්‍යාව | - | - | - | - | - | - |
| ඉ. ලිපි සංඛ්‍යාව | 16 | 16 | - | - | - | 01 |
| ඊ. වෙනත් | 01 | - | - | - | - | - |
| **එකතුව** | **23** | **24** | **-** | **-** | **02** | **03** |

**15.4 .** පශු සම්පත්, ධීවර හා පෝෂණ පීඨය

| විෂය | ප්‍රකාශයට පත් කරන ලද | | වාණිජ මට්ටමට පත් කිරීම් | | ඉදිරිපත් කිරීම් | |
|---|---|---|---|---|---|---|
| | ජාතික | ජාත්‍යන්තර | ජාතික | ජාත්‍යන්තර | ජාතික | ජාත්‍යන්තර |
| අ. පර්යේෂණ සංඛ්‍යාව | 49 | 30 | - | - | 50 | 40 |
| ආ. නවසොයා ගැනීම් සංඛ්‍යාව | 01 | 05 | - | - | - | 05 |
| ඇ. වාර සඟරා සංඛ්‍යාව | 01 | 08 | - | - | 01 | 04 |
| ඈ. පොත් සංඛ්‍යාව | 05 | 02 | - | - | - | - |
| ඉ. ලිපි සංඛ්‍යාව | 07 | - | - | - | 01 | 02 |
| ඊ. වෙනත් | 09 | - | 03 | - | - | - |
| **එකතුව** | **72** | **45** | **03** | **-** | **52** | **51** |

# 16. වර්ෂය තුළ අධ්‍යයන කාර්යය මණ්ඩලය විසින් සම්පූර්ණ කරන ලද පශ්චාද් උපාධි

## 16.1 කෘෂිකර්ම හා වැවිලි කළමනාකරණ පීඨය

| විෂය | 2014.12.31 දිනට පශ්චාද් උපාධිය සම්පූර්ණ කරන ලද අධ්‍යයන කාර්ය මණ්ඩල සමාජික සංඛ්‍යාව | 2014 වර්ෂය තුළ සම්පූර්ණ කරන ලද පශ්චාද් උපාධි | |
|---|---|---|---|
| | | දේශීය | විදේශීය |
| දර්ශනසූරි | 21 | - | 02 |
| දර්ශනපති | 01 | - | - |
| විද්‍යාපති | 06 | 01 | - |
| පශ්චාද් උපාධි ඩිප්ලෝමා | - | - | - |
| **එකතුව** | **28** | **01** | **02** |

## 16.2 ව්‍යවහාරිකවිද්‍යා පීඨය

| විෂය | 2014.12.31 දිනට පශ්චාද් උපාධිය සම්පූර්ණ කරන ලද අධ්‍යයන කාර්ය මණ්ඩල සමාජික සංඛ්‍යාව | 2014 වර්ෂය තුළ සම්පූර්ණ කරන ලද පශ්චාද් උපාධි | |
|---|---|---|---|
| | | දේශීය | විදේශීය |
| දර්ශනසූරි | 13 | - | 01 |
| දර්ශනපති | 02 | - | - |
| විද්‍යාපති/ කළමනාකරණ විද්‍යාපති | 15 | - | - |
| පශ්චාද් උපාධි ඩිප්ලෝමා | - | - | - |
| **එකතුව** | **30** | **-** | **01** |

## 16.3 ව්‍යාපාර අධ්‍යයන හා මූල්‍ය පීඨය

| විෂය | 2014.12.31 දිනට පශ්චාද් උපාධිය සම්පූර්ණ කරන ලද අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජික සංඛ්‍යාව | 2014 වර්ෂය තුළ සම්පූර්ණ කරන ලද පශ්චාද් උපාධි | |
|---|---|---|---|
| | | දේශීය | විදේශීය |
| දර්ශනසූරි | 06 | - | 03 |
| දර්ශනපති | - | - | - |
| කළමනාකරණ විද්‍යාපති/ වාණිජවිද්‍යාපති/විද්‍යාපති/සමාජීය විද්‍යාපති/ශාස්ත්‍රපති | 13 | 01 | - |
| පශ්චාද් උපාධි ඩිප්ලෝමා | - | - | - |
| **එකතුව** | **19** | **01** | **03** |

## 16.4 පශු සම්පත්, ධීවර හා පෝෂණ පීඨය

| විෂය | 2014.12.31 දිනට පශ්චාද් උපාධිය සම්පූර්ණ කරන ලද අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජික සංඛ්‍යාව | 2014 වර්ෂය තුළ සම්පූර්ණ කරන ලද පශ්චාද් උපාධි | |
|---|---|---|---|
| | | දේශීය | විදේශීය |
| දර්ශනසූරි | 14 | - | 01 |
| දර්ශනපති | 08 | 02 | - |
| විද්‍යාපති | 06 | - | - |
| පශ්චාද් උපාධි ඩිප්ලෝමා | 01 | - | - |
| **එකතුව** | **29** | **02** | **01** |

## 17. ත්‍යාග ලැබීම් පිළිබඳ තොරතුරු

| විෂය | ත්‍යාග සංඛ්‍යාව | අධ්‍යයන කාර්යය මණ්ඩලය මගින් හිමිකරගනු ලැබූ | සිසුන් විසින් හිමිකරගනු ලැබූ |
|---|---|---|---|
| දේශීය ත්‍යාග | 02 | 01 | 01 |
| ජාතික ත්‍යාග | 08 | 07 | 01 |
| ජාත්‍යන්තර ත්‍යාග | 04 | 04 | 01 |
| වෙනත් | 01 | 01 | - |
| එකතුව | **15** | **13** | **03** |

### 17.1 කෘෂිකර්ම හා වැවිලි කළමනාකරණ පීඨය

| විෂය | ත්‍යාග සංඛ්‍යාව | අධ්‍යයන කාර්යය මණ්ඩලය මගින් හිමිකරගනු ලැබූ | සිසුන් විසින් හිමිකරගනු ලැබූ |
|---|---|---|---|
| දේශීය ත්‍යාග | - | - | - |
| ජාතික ත්‍යාග | 07 | 05 | - |
| ජාත්‍යන්තර ත්‍යාග | 02 | 02 | - |
| වෙනත් | 01 | 01 | - |
| එකතුව | **10** | **08** | - |

***ජාත්‍යන්තර ත්‍යාග***

**මහාචාර්ය ඩී පී එස් ටී ජී අත්තනායක මහතා**

හතරවන ගෝලීය රබර් සමුළුව වික්හම් ත්‍යාගය (Wickham Award) (ගෝලීය ස්වාභාවික රබර් කර්මාන්ත අංශයේ තාක්ෂණ සොයාගැනීමේ අංශය )

මහචාර්ය ජේ එම් යූ කේ ජයසිංහ මහතා

ඇමරිකාවේ මැසචුසෙට් (Massachusetts) විශ්වවිද්‍යාලය මගින් පිරිනමන ලද ෆිල් බ්‍රයිට් පශ්චාද් අචාර්ය උපාධි පර්යේෂණ ශිෂ්‍යත්වය

***ජාතික මට්ටමේ ත්‍යාග***

මහචාර්ය ජේ එම් යූ කේ ජයසිංහ මහතා

- ශ්‍රී ලංකා පාරිසරික වෘත්තීය ආයතනය මගින් පිරිනමන ලද වරලත් පාරිසරික වෘත්තීය ත්‍යාගය
- ශ්‍රී ලංකා ජාතික පර්යේෂණ සභාව මගින් පිරිනමන් ලද ජාතික පර්යේෂණ කුසලතාත්‍යාගය - විද්‍යාත්මක ප්‍රකාශන

- SUSRED ත්‍යාගය - පශ්චාද් උපාධි පර්යේෂණ උපාධි උපදේශකත්වය සඳහා පිරිනමන ලදී. ශ්‍රී ලංකා ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිසම සහ ශ්‍රී ලංකා තාක්ෂණ පර්යේෂණ අමාත්‍යාශයේ දායකත්වයෙන් පිරිනමන ලදී.

ආචාර්ය පී අයි පී පෙරේරා මිය
ජාතික පර්යේෂණ කුසලතා ත්‍යාගය - විද්‍යාත්මක ප්‍රකාශණ සඳහා

ආචාර්ය ආර් එච් එම් කේ රත්නායක මිය
ජාතික පර්යේෂණ කුසලතාත්‍යාගය - විද්‍යාත්මක ප්‍රකාශන

ආචාර්ය ජේ සී එදිරිසිංහ මහතා
ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලයේ සමාජීය විද්‍යා හා මානව ශාස්ත්‍ර ජාත්‍යන්තර සමුළුවේ විශිෂ්ටතම කළමනාකරණ පර්යේෂණ පත්‍රිකාව

එච් එම් එල් කේ හේරත් මහතා
විද්‍යාත්මක පර්යේෂණ සඳහා වන ජනාධිපති ත්‍යාගය
විද්‍යාතා තාක්ෂණ අමාත්‍යාංශය සහ ජනාධිපති ලේකම් කාර්යාලය එක්ව සංවිධානය කරන ලදී

වෙනත් ත්‍යාග
මහාචාර්ය එන් එස් කෝට්ටෙආරච්චි මිය
විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ ජාත්‍යන්තර ආධාර ව්‍යාපෘතිය යටතේ 2014 අභිප්‍රේරණ ත්‍යාග

**17.2** ව්‍යාපාර අධ්‍යයන හා මූල්‍ය පීඨය

| විෂය | ත්‍යාග සංඛ්‍යාව | අධ්‍යයන කාර්යය මණ්ඩලය මගින් හිමිකරගනු ලැබූ | සිසුන් විසින් හිමිකරගනු ලැබූ |
|---|---|---|---|
| දේශීය ත්‍යාග | - | - | - |
| ජාතික ත්‍යාග | - | - | - |
| ජාත්‍යන්තර ත්‍යාග | 01 | 01 | - |
| වෙනත් | - | - | - |
| එකතුව | **01** | **01** | - |

*ජාත්‍යන්තර ත්‍යාග*

**ආචාර්ය එච් එම් එස් පී හේරත් මහතා - ජාත්‍යන්තර උපාධිධාරී ශිෂ්‍ය ව්‍යාපෘතිය**

**17.3** පශුසම්පත් ධීවර හා පෝෂණ පීඨය

| විෂය | ත්‍යාග සංඛ්‍යාව | අධ්‍යයන කාර්යය මණ්ඩලය මගින් හිමිකරගනු ලැබූ | සිසුන් විසින් හිමිකරගනු ලැබූ |
|---|---|---|---|
| දේශීය ත්‍යාග | 02 | 01 | 01 |
| ජාතික ත්‍යාග | 01 | 02 | 01 |
| ජාත්‍යන්තර ත්‍යාග | 01 | 01 | 01 |
| වෙනත් | - | - | - |
| එකතුව | **04** | **04** | **03** |

***දේශීය ත්‍යාග***

පළමු රුහුණු ජාත්‍යන්තර විද්‍යා හා තාක්ෂණ සමුළුව දෙවන අනුශූරතා ත්‍යාගය හොඳම පෝස්ටර් තරගය

පත්‍රිකා -එස් සිවන්නන් සහ එම් ඩී එස් ටී ද ක්‍රෲස් - ශ්‍රීලංකාවේ යාපනය ප්‍රදේශයේ නිල් කකුළුවන් කර්මාන්තය පිළිබඳ වෙළඳපොල ඇගයීම

ශ්‍රී ලංකා නැගෙනහිර විශ්වවිද්‍යාලයේ ජාත්‍යන්තර සමුළුවේ හොඳම ඉදිරිපත් කිරීම.

පත්‍රිකා - එම් ඩී එස් ටී ද ක්‍රෲස් සහ එස් සිවන්තන් - ශ්‍රී ලංකාවේ උතුරු පළාතේ නිල් කකුළු ධීවර කර්මාන්තය අතීත වර්තමාන හා අනාගත දෘෂ්ටිකෝණයෙන්

***ජාත්‍යන්තර ත්‍යාග***

ජාත්‍යන්තර මත්ස්‍ය ආර්ථික හා වෙළඳ ආයතනය(IIFET) 2014 ඕස්ට්‍රේලියානු සමුළුව නියෝජනය කරන ලද Yamamoto ත්‍යාගය (ජපන් ජාත්‍යන්තර මත්ස්‍ය පර්යේෂණ සංගමය මගින් පිරිනැමිණ)

පත්‍රිකා -යුගවේන්ද්‍ර කාසිවිසුවනතන් සහ එම් ඩී එස් ටී ද ක්‍රෲස් (2014) - "ශ්‍රී ලංකාවේ යාපනයේ මන්ඩතිව් ප්‍රදේශයේ වර්තමාන කඩොලාන තත්වය"


ජාතික ත්‍යාග - කේ ඩී පී පී ගුණතිලක මහතා - ශ්‍රී ලංකා ජාතික විද්‍යා පදනම පර්යේෂණ ප්‍රදාන 2014 - රු මිලියන 1.4

# 18. ශාරීරික අධ්‍යාපන අංශය

## 18.1 හැඳින්වීම

ශාරිරික අධ්‍යාපන අංශය අධ්‍යයන ක්‍රියාවලිය සඳහා උපාධි අපේක්ෂකයන්ගේ ශාරිරික හා මානසික සමබරතාව වර්ධනය කරගැනීමේ වැඩසටහන් මගින් දායකත්වය සපයයි. විශ්වවිද්‍යාලයේ අධ්‍යයන අනධ්‍යයන හා ශිෂ්‍ය ප්‍රජාව අතර සමගිය හා සහයෝගය වර්ධනය කරගැනීම සඳහා ඉතා වැදගත් වන අංශය මෙය වේ.

## 18.2 ශාරීරික අධ්‍යාපන අංශයේ කාර්ය මණ්ඩල සංයුතිය




## 18.3 බාහිර උපදේශකවරු

පහත සඳහන් ක්‍රීඩා ඉසව් සඳහා බාහිර උපදේශකවරුන් මගින් සේවය ලබාගන්නා අතර ඒ සඳහා විනිසුරු කඳවුරු පැවැත්වීම ද සිදු කෙරේ.

2014 වර්ෂයේ දී ශාරීරික අධ්‍යාපන අංශය සඳහා සුදුසුකම් ලත් බාහිර උපදේශකවරු නව (09) දෙනෙක් පහත සඳහන් ඉසව් සඳහා බඳවා ගන්නා ලදී.

| ක්‍රීඩා ඉසව්ව | නම | සුදුසුකම් |
|---|---|---|
| 1 කැරම් | බී ඩී ආර්කුමාර මයා | ජාත්‍යන්තර කැරම් ශූරතාව |
| 2 චෙස් | ජේ.එම්.සී.බී. රත්ගල්ල මහතා | හිටපු ක්‍රීඩක සහ වර්ණ ලාභී |
| 3 එල්ලේ | ජී. විමලසිරි මහතා | වයඹ පළාත් හොඳම ජාතික ක්‍රීඩකයා |
| 4 හොකි | ඩබ්ලිව්.එස්.එම්.ඩී. බොතේජු මහතා | ශ්‍රී ලංකා ගුවන් හමුදා හොකි කණ්ඩායමේ නියෝජිත |
| 5 කරාතේ | ඩබ් එස් ආර් ප්‍රනාන්දු මහතා | ජාත්‍යන්තර කළු පටි ශූර |
| 6 රගර් | බී.එම්.බී.ඩී. බණ්ඩාර මහතා | සුදුසුකම්ලත් දෙවන පෙළ රග්බි පුහුණුකරු |
| 7 පිහිනුම් | එන්.එම්.ජේ.කේ. නවරත්න මහතා | ශිල්ප ශාලිකා ආයතනයේ පිහිනුම් උපදේශක |
| 8 මේස පන්දු | ටී.එම්.කේ.පී.බී. තෙන්නකෝන් මහතා | පාසල් විනිසුරු |
| 9 බර ඉසිලීම | එල්.ආර්.සී.එල්.කේ. ලියනගෙදර මහතා | ජාතික ක්‍රීඩක |

## 18.4 වාර්ෂික ක්‍රීඩා වැඩසටහන්

### 18.4.1 පීඨාන්තර නවක ශිෂ්‍ය තරගාවලිය 2014

නව පරිශ්‍රයකට ප්‍රවේශ වන විට නවක ශිෂ්‍යයන්ගේ ක්‍රීඩා කුසලතාවර්ධනය කරලීම සඳහා නව්‍යමය ක්‍රීඩා කටයුතු අවශ්‍ය කෙරේ. මෙම අත්‍යවශ්‍ය අංගයන් අවබෝධකොට ගනිමින් ශාරීරික අධ්‍යාපන අංශය මගින් වාර්ෂිකව පීඨාන්තර නවක ශූරතා තරගාවලියක් පවත්වමින් විශ්වවිද්‍යාල සිසුන් ක්‍රීඩා කටයුතු සඳහා දිරිමත් කිරීමට කටයුතු කෙරේ. 2014 වර්ෂය තුළ දී ශාරීරික අධ්‍යාපන අංශය මගින් පීඨාන්තර නවක ශූරතා තරගාවලියක් සූදානම් කරන ලද අතර ගැහැණු පිරිමි ක්‍රීඩා ඉසව් එකොළහක් (11) මේ සඳහා සූදානම් කෙරිණි.

1. බැඩ්මින්ටන්
2. බාස්කට් බෝල්
3. කැරම්
4. චෙස්
5. ක්‍රිකට්
6. එල්ලේ
7. පාපන්දු
8. දැල්පන්දු
9. මේසපන්දු
10. පැසිපන්දු
11. බර ඉසිලීම


2014 මැයි මස 19-27 දින අතර තුර කුලියාපිටිය හා මකඳුර පරිශ්‍රයේ දී මෙම තරග ඉසව් පැවැත්විණි.

**අන්තර් පීඨ නවක ශිෂ්‍ය තරගාවලිය අවසන් ප්‍රතිඵලය**

ශූරතාව - ව්‍යවහාරිකවිද්‍යා පීඨය
පළමු අනුශූරතාව - ව්‍යාපාර අධ්‍යයන හා මූල්‍ය පීඨය
දෙවන අනුශූරතාව - කෘෂිකර්ම හා වැවිලි කළමනාකරණ පීඨය
සිව්වන ස්ථාන - පශුසම්පත් ධීවර හා පෝෂණ පීඨය

**අන්තර පීඨ නවක ශිෂ්‍ය සහභාගීත්වය**

| 2014 | පීඨය | | | | එකතුව |
|---|---|---|---|---|---|
| | **කෘෂි කර්ම හා වැවිලි කළමනාකරණ පීඨය** | **ව්‍යවහාරිකවිද්‍යා පීඨය** | **ව්‍යාපාර අධ්‍යයන හා මූල්‍ය පීඨය** | **පශුසම්පත් ධීවර හා පෝෂණ පීඨය** | |
| පිරිමි | 32 | 56 | 87 | 38 | 213 |
| ගැහැණු | 54 | 55 | 55 | 51 | 215 |
| එකතුව | 86 | 111 | 140 | 89 | 428 |
| 2014 ලියාපදිංචි ශිෂ්‍ය සංඛ්‍යාව | 142 | 163 | 43 | 125 | 872 |
| සහභාගීත්ව ප්‍රතිශතය | 61% | 68% | 32% | 71% | 49% |




### 18.4.2 අන්තර් පීඨ තරගාවලිය 2014

2014 ඔක්තෝම්බර මස 20වන දින සිට නොවැම්බර් මස 05 වන දින දක්වා අන්තර් පීඨ තරගාවලිය විශ්වවිද්‍යාල පරිශ්‍රයේ සහ ශිල්පශාලිකා පරිශ්‍රයේ දී පැවැත්විණි. ක්‍රීඩා තරග ඉසව් 23ක් පැවැත් වූ අතර මේ සඳහා පිහිණුම් තරග මෙන්ම ජවන හා පිටිය තරග ඉසව්ද පැවැත්විණි.

### 18.4.3 අභ්‍යන්තර පීඨ ශූරතාව

ශ්‍රී ලංකා විශ්වවිද්‍යාලයීය ක්‍රීඩා සංගමය මගින් 37වන අන්තර් විශ්වවිද්‍යාලයීය ක්‍රීඩා ශූරතාව 2014 මැයි මස 07 දින සිට අගෝස්තු මස 31 වන දින දක්වා පැවැත්විණි. ක්‍රීඩා තරග ඉසව් 22ක් විවිධ විශ්වවිද්‍යාලයන්හි දී පැවැත්විණි. ශ්‍රී ංකා වයඹ විශ්වවිද්‍යාලයේ ශාරීරික අධ්‍යාපන අංශය මේසපන්දු ශූරතාව සංවිධානය සම්බන්ධයෙන් මුල් තැන ගෙන ක්‍රියා කළ අතර එය 2014 සැප්තැම්බර් මස 24 සහ 25 දිනයන්හි දී වයඹ විශ්වවිද්‍යාලයීය අභ්‍යන්තර ක්‍රීඩාගාරයේ දී පැවැත්විණි. එසේම කැරම් ශූරතාව 2014 ජූනි මස 28 සහ 29 දිනයන්හි දී ශ්‍රී ලංකා කැරම් සංගමයේ දී ශාරීරික අධ්‍යාපන අංශය මගින් සංවිධානය කෙරිණි.

**2014 අන්තර් විශ්වවිද්‍යාලයීය ක්‍රීඩා ශූරතාවේ ජයග්‍රහණයන්**

සමස්ත ජයග්‍රහණ - විශ්වවිද්‍යාල 14ක් අතර ක්‍රීඩා ඉසව් තිහකින් (30) 8වෙනි ස්ථානය හිමි විය.

**කේවල ඉසව්**

| **නම** | **තරග ඉසව්ව** | **ස්ථානය** |
|---|---|---|
| එච් එම් වී එල් හේරත් | මල්ලවපොර 120kg පංතිය | ශූරතාව |
| කේ ඒ එච් අනුරුද්ධිකා | ජවන හා පිටිය | ශූරතාව |
| | කවපෙත්ත විසි කිරීම | |


| | | |
|---|---|---|
| ඩී ආර් එස් වී රාජකරුණා | පිහිනුම් (කාන්තා) 50m | අනුශූරතාව |
| ඩී ආර් එස් වී රාජකරුණා | පිහිනුම් (කාන්තා) ළය ආර 50m | දෙවන අනුශූරතාව |
| ඩී එච් ඒ එස් බණ්ඩාර | මල්ලවපොර 55kg බර පංතිය | දෙවන අනුශූරතාව |
| බී ඒ එස් ඒ තිලකරත්න | මල්ලවපොර 74kg බර පංතිය | දෙවන අනුශූරතාව |

**කණ්ඩායම් ඉසව්**


| **ඉසව්ව** | **ස්ථානය** |
|---|---|
| එල්ලේ (පිරිමි) | අනුශූරතාව |
| බැඩ්මින්ටන් (පිරිමි / ගැහැණු ) | අර්ධ අවසාන |
| පා පන්දු (පිරිමි ) | අර්ධ අවසාන |
| දැල් පන්දු (ගැහැණු ) | අර්ධ අවසාන |
| වොලි බෝල් (පිරිමි / ගැහැණු ) | අර්ධ අවසාන |

**2014 අන්තර් විශ්වවිද්‍යාලයීය ශූරතාව සහභාගීත්වය**

| 2014 | පීඨය | | | | එකතුව |
|---|---|---|---|---|---|
| | කෘෂි කර්ම හා වැවිලි කළමනාකරණ පීඨය | ව්‍යවහාරිකවිද්‍යා පීඨය | ව්‍යාපාර අධ්‍යයන හා මූල්‍ය පීඨය | පශුසම්පත් ධීවර හා පෝෂණ පීඨය | |
| පිරිමි | 36 | 80 | 103 | 27 | 246 |
| ගැහැණු | 10 | 32 | 48 | 03 | 93 |
| එකතුව | 46 | 112 | 151 | 30 | 339 |
| 2014 ලියාපදිංචි ශිෂ්‍ය සංඛ්‍යාව | 454 | 461 | 1521 | 420 | 2856 |
| සහභාගීත්ව ප්‍රතිශතය | 10% | 24% | 10% | 7% | 12% |



ව්‍යවහාරිකවිද්‍යා පීඨය ඉහළ ශිෂ්‍ය සහභාගීත්ව ප්‍රතිශතයක් පෙන්නුම් කළ අතර (24%) සාපේක්ෂව අනෙකුත් පීඨයන්හි සහභාගීත්ව අගය පහළ මට්ටමක පැවතුණි.




## 18.5 වෙනත් ක්‍රීඩා තරග

සලකා බලන වර්ෂයේ අප විශ්වවිද්‍යාලයේ ශිෂ්‍යයන් පහත සඳහන් බාහිර තරගාවලි සඳහා සහභාගී වී ඇති අතර එමගින් සිසුන්ගේ අත්දැකීම් හා හැකියාව වර්ධනය කර ගැනීමට හැකි වී ඇත.

1. UMIF බැඩ්මින්ටන් තරගාවලිය 2014
   (මොරටුව විශ්වවිද්‍යාලය මගින් සංවිධානය කරන ලදී)
2. අප විශ්වවිද්‍යාල පරිශ්‍රයේ දී තරගාවලි කිහිපයක් සංවිධානය කෙරිණි.
3. Mora Hockey 7's ශූරතාව 2014
   (මොරටුව විශ්වවිද්‍යාලය මගින් සංවිධානය කරන ලදී)
4. 14th Mora seven's Rugby තරගාවලිය 2014
   (මොරටුව විශ්වවිද්‍යාලය මගින් සංවිධානය කරන ලදී)
5. Fasters බැඩ්මින්ටන් තරගාවලිය 2014
   (කැලණිය විශ්වවිද්‍යාලය මගින් සංවිධානය කරන ලදී)
6. Pera Tagby තරගාවලිය 2014
   (පේරාදෙණිය විශ්වවිද්‍යාලය මගින් සංවිධානය කරන ලදී)
7. Hockey 6's ශූරතාව 2014
   (කැලණිය විශ්වවිද්‍යාලය මගින් සංවිධානය කරන ලදී)
8. වයඹ පළාත් - All Island බැඩ්මින්ටන් ශූරතාව 2014
   (වයඹ පළාත් බැඩ්මින්ටන් සංගමය මගින් සංවිධානය කෙරිණි.
9. Mora Smashes මේස පන්දු තරගාවලිය 2014
   (මොරටුව විශ්වවිද්‍යාලය මගින් සංවිධානය කරන ලදී)
10. Knockout Baseball ශූරතාව 2014
    (වයඹ විශ්වවිද්‍යාලය මගින් සංවිධානය කරන ලදී)

ජාතික මට්ටමේ තරග

1. ජනාධිපති කුසලාන කැරම් ශූරතාව 2014
   ශ්‍රී ලංකා කැරම් සම්මේලනය මඟින් සංවිධානය කෙරිණි.
2. 45වන ජාතික කැරම් ශූරතාව 2014
   ශ්‍රී ලංකා කැරම් සම්මේලනය මඟින් සංවිධානය කෙරිණි.
3. වසර මැද කැරම් ශූරතාව 2014
   ශ්‍රී ලංකා කැරම් සම්මේලනය මඟින් සංවිධානය කෙරිණි.
4. දොළොස්වෙනි විවෘත RANGERS කැරම් ශූරතාව
   ශ්‍රී ලංකා කැරම් සම්මේලනය මඟින් සංවිධානය කෙරිණි.
5. III අදියර ක්‍රිකට් තරගාවලිය 2014
   කුරුණෑගල දිස්ත්‍රික් ක්‍රිකට් සංගමය මගින් මෙහෙය වන ලදී
6. Novices බර ඉසිලීමේ ශූරතාව 2014
   ශ්‍රී ලංකා බර ඉසිලීමේ සංගමය විසින් සංවිධානය කෙරිණි.
7. ජ්‍යෙෂ්ඨ ජාතික හොකී ශූරතාව 2014
   ශ්‍රී ලංකා හොකී සම්මේලනය මගින් සංවිධානය කෙරිණි.

## 18'6 විශේෂ වැඩසටහන්

සමාජයට සෞඛ්‍ය සම්පන්න සහ ප්‍රීතිමත් ශ්‍රම බලකායක් ගොඩනැගීමේ අරමුණින් අපේ අංශය කැපවීමෙන් කටයුතු කරයි. එම අරමුණින් අපේ ශිෂ්‍යයන් සහ කාර්ය මණ්ඩලය සඳහා විස්තරාත්මක වැඩසටහන් ඉදිරිපත් කරන්නෙමු.

### 18.6.1 නම්නීකරණ වැඩසටහන.

අලුතින් විශ්වවිද්‍යාලවලට පැමිණෙන සිසුන් සඳහා ශාරීරික අධ්‍යාපන අංශයේ කාර්යභාරය පිළිබඳව හඳුන්වා දෙමින් එහි මෙහෙවර හා දැක්ම, වෘත්තීය තත්වය ක්‍රියාකාරකම් සහ අනාගත ප්‍රතිලාභ සහ විශ්වවිද්‍යාල ක්‍රීඩා කටයුතුවල නියැලීමේ ඇල්ම පිළිබඳව දැනුවත් කිරීම සඳහා වැඩසටහන් ක්‍රියාත්මක විය.

### 18.6.2 අධ්‍යයන සහායක වැඩමුළුව.

ක්‍රීඩා විද්‍යා හා අභ්‍යාස පිළිබඳ වැඩමුළුවක් තෙවන් වසර ක්‍රීඩා පෝෂණ සිසුන් සඳහා පෝෂණ අධ්‍යයන අංශයේ ඉල්ලීම මත මෙහෙයවන ලදී. ඔවුන්ගේ අධ්‍යයන විෂයන්ට අදාළව දැනුම වර්ධනය කරගැනීම සඳහා මෙය මහඟු අවස්ථාවක් විය.

## 18.7 මූල්‍ය ප්‍රකාශය

**වාර්ෂික වියදම**

| **අංකය** | **විස්තරය** | **ගණන (රු)** |
|---|---|---|
| 01 | අන්තර්පීඨ පළමු වසර සිසුන්ගේ ශූරතාව | 44,880.00 |
| 02 | අන්තර්පීඨ ශූරතාව | 62,170.00 |
| 03 | අන්තර් විශ්වවිද්‍යාලයීය ශූරතාව | 521,623.00 |
| 04 | ක්‍රීඩා උපකරණ | 7,632,600.00 |
| 05 | ක්‍රීඩා ඇඳුම් | 588,952.00 |
| 06 | පුහුණු හා පුහුණු තරග | 50,385.00 |
| 07 | බාහිර තරග | 117,037.00 |
| 08 | සුළු මුදල් | 25,295.00 |
| 09 | දුරකථන බිල්පත් | 27,992.00 |
| 10 | SLUSA දායකත්ව මුදල් | 100,000.00 |
| 11 | බාහිර උපදේශක ගාස්තු | 244,412.00 |
| | **වාර්ෂික මුළු වියදම** | **9,415,346.00** |

## 18.8 ක්‍රීඩා ක්ෂේත්‍රයේ යහපත් අනාගතයක් උදෙසා සැලකිය යුතු කරුණු.

1) එකම කාලවකවානුවක දී සියලු පීඨයන්හි අධ්‍යයන කටයුතු ඇරඹීම.

2) අවම වශයෙන් ප.ව. 4.30ට පමණ සිසුන් අධ්‍යයන කටයුතුවලින් නිදහස් කිරීම.

3) සිසුන් ශාරීරික අධ්‍යාපන කටයුතුවලට යොමු කිරීම සඳහා අධ්‍යයන කාර්යමණ්ඩලයේ සහයෝගය ලබා දීමේ මට්ටම ඉහළ දැමීම.

4) විශ්වවිද්‍යාලය නියෝජනය කරමින් සිසුන් ක්‍රීඩා කටයුතුවල නියැලෙන විට දේශණ සඳහා සහන සැලැස්වීම සහ ක්‍රමවේදයක් සැකසීම.

## 19. වෘත්තීය මාර්ගෝපදේශන ඒකකය

ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලයේ වෘත්තීය මාර්ගෝපදේශන ඒකකය 2003 ජනවාරි මස ස්ථාපනය කරන ලද්දකි. මෙය විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ මගපෙන්වීම යටතේ පිහිටුවන ලද අතර විශ්වවිද්‍යාල සිසුන්ගේ වෘත්තීය හා මෘදු කුසලතාඉහළ නැංවීමේ අභිලාසයෙන් පිහිටුවන ලදී. ඒ අනුව විශ්වවිද්‍යාලයීය සිසුන් හා ආයතන අතර යම් සබඳතාවක් මේ හරහා ගොඩ නැගෙයි. ආරම්භයේ සිට වෘත්තීය මාර්ගෝපදේශන ඒකකය මගින් ඉහත පරමාර්ථය පදනම් කොටගත් නොයෙකුත් අවස්ථාවන් සංවිධානය කරනු ලැබ ඇත. මෙම අංශය උපකුලපති තුමා යටතේ ඍජුව පාලනය වෙයි.

තම අධ්‍යයන පසුබිමේ සිට වෘත්තීය ඉලක්කයන් කරා යොමුවීමට සිසුන්ට සාර්ථක දිරිගැන්වීමක් වෘත්තීය මාර්ගෝපදේශන ඒකකය මගින් සිදු කෙරේ. මේ අනුව වෘත්තීය මාර්ගෝපදේශන ඒකකය සමබර අන්දමින් ඍජු සේවා, අධ්‍යාපන වැඩසටහන් සහ සම්පත් ද්‍රව්‍ය ආදිය සැපයීම සිදු කොට ඇත.

ඒ අනුව ශිෂ්‍යයන්ට

- අර්ථවත් රැකියා සොයාගැනීමට උපකාරී වීම
- පුහුණුව සඳහා ආයතන සොයාගැනීම
- ඔවුන්ගේ වෘත්තීය අභිලාසයන්ට සරිලන පරිදි අමතර අධ්‍යාපන සුදුසුකම් ලබාගැනීමට උපකාරී වීම

යන පහසුව ලැබෙයි.

ව්‍යාපෘති සඳහා සහභාගී වීමට සිදුවන උපාධි අපේක්ෂකයනට මෘදු කුසලතාපිළිබඳ වැඩමුළු සහ සම්මන්ත්‍රණ, ව්‍යවසායකත්ව සහ අනෙකුත් ක්ෂේත්‍රයන්හි පුද්ගල සංවර්ධන වැඩසටහන් ප්‍රයෝජනවත් වෙයි.

වෙළඳ ලෝකයේ පැවැත්ම සඳහා ඔවුන්ට මේවා අතිශයින්ම වැදගත් වෙයි. මෙම වැඩසටහන් සඳහා සහභාගි වන සිසුන් පමණක් පෞද්ගලික සම්මුඛ පරීක්ෂණ ස්වාභාවයෙන් පවත්වනු ලබන වෘත්තීය වෙලඳපොළ (පෞද්ගලික ආයතන සහ සිසුන්ගේ සහභාගීත්වයෙන් සිදු කෙරෙන ) සඳහා සහභාගිවීමට සුදුසුකම් ලබති.

### දැක්ම

යාවජීව අධ්‍යාපනය, ආර්ථික සමෘද්ධිමත් භාවය, මානසික ස්ථාවරත්වය සහ සහ සමාජ සංචලනය සහ අවසන් ඉලක්කය කරා මෙහෙය වන සංකීර්ණ කාර්යමය ලෝකයේ ප්‍රශස්ත වෘත්තීය අවස්ථා ලඟාකර දෙන තත්වයෙන් උසස් සහ අත්‍යවශ්‍ය වෘත්තීය සහ මෘදු කුසලතාවලින් සමන්විත උපාධිධාරීන් පිරිසක් ලෙස දැනුවත්භාවය ඇතිකිරීම සහ සවිබල ගැන්වීම.


### මෙහෙවර

වෘත්තීය හා මෘදු කුසලතාවර්ධනය කරගැනීමට උපකාරී වන වැඩසටහන් මෙන්ම ආයතනික සම්බන්ධතාව වර්ධනය කිරීම මගින් සිසුන් තත්වයෙන් උසස් වෘත්තිකයන් බවට පත්කරලීමෙන් උද්යෝගී ගෝලීය පුරවැසියන් වීමට අවස්ථාව අපි ඵලසා දෙන්නෙමු.

**අරමුණු**

- වෘත්තීය සංවර්ධනය වෙනුවෙන් සම්මන්ත්‍රණ, වැඩමුළු, දේශන සහ පුහුණුවීම් වැනි විවිධ ක්‍රියාකාරකම් සංවිධානය කිරීම.
- සිසුන්ට ගැලපෙන හා තාත්වික වෘත්තීන් තෝරාගැනීමට සහ වෘත්තීය මග පෙන්වීමට සහාය වීම
- අධ්‍යාපනික සංවර්ධනය උදෙසා දායක වීමට තරුණයින් පෙළඹවීම
- සිසුන්ට ඔවුන්ගේ අධ්‍යයන ගමන් මග සාර්ථක කර ගැනීම සඳහා ඔවුන්ගේ කෙටි කාලීන හා දිගු කාලීන අරමුණු පෙලගැස්වීමට මග පෙන්වීම.
- අන්තර්ජාලය හරහා වෘත්තීය පුහුණු අවස්ථා හා රැකියා අවස්ථා පිළිබඳ දත්ත ගබඩාවක් ඇති කිරීම.
- ශිෂ්‍යත්ව / පුහුණු වැඩසටහන්, රැකියා සහ ඉගෙන ගැනිමේ අවස්ථා පිළිබඳ කළමනාකරණය කිරීම සහ තොරතුරු ලබාදීම.
- සම්මුඛ පරීක්ෂණ සඳහා සූදානම් වීමට ජීව දත්ත සකස් කිරීමට සහ සිසුන්ගේ සන්නිවේදන කුසලතාවැඩිදියුණු කර ගැනීමට උදව් වීම.

## 19.4 අපගේ ආයතනික සැලැස්ම




## 19.5 කාර්ය මණ්ඩලය

| **තනතුර** | **නම** |
|---|---|
| අධ්‍යක්ෂ වෘත්තීය මාර්ගෝපදේශන | ආචාර්ය ඩී සී අබේසිංහ මහතා |
| වෘත්තීය උපදේශක | එස් ඩී ජී ජයසූරිය මහතා |
| පරිගණක යෙදවුම් සහකාර | එන් සී එස් ජනකසිරි මහතා |

මීට අතරව එක් පීඨයකින් එක් නියෝජිතයකු බැගින් පීඨ හතර සඳහා සම්බන්ධීකාරකවරු පත්කොට ඇත

| **සම්බන්ධීකාරකවරයාගේ නම** | **පීඨයේ නම** |
|---|---|
| අචාර්ය එන් ආර් අබේනායක මිය | කෘෂිකර්ම හා වැව්ලි කළමනාකරණ පීඨය |
| ඩී එම් ජයසේන මහතා | ව්‍යවහාරිකවිද්‍යා පීඨය |
| ඩබ් ඒ ඩී කේ ජයේන්ද්‍රිකා මිය | ව්‍යාපාර අධ්‍යයන හා මූලය පීඨය |
| බී පී ඒ ජයවීර මයා | පශු සම්පත් ධීවර හා පෝෂණ පීඨය |

## 19.6 2014 වර්ෂය තුළ මෙහෙය වන ලද පුහුණු දෙනුවත් කිරීමේ වැඩසටහන්

පහත සඳහන් සටහනෙහි 2014 වර්ෂය තුළ මෙම ඒකකය මගින් මෙහෙය වන ලද වැඩසටහන් පිළිබඳ තොරතුරු අන්තර් ගත වේ.

| අංකය | වැඩසටහන | සම්පත් හා තාක්ෂණ ඒකකුව | විෂය පථය | ඉලක්ක කණ්ඩායම | දිනය | සහභාගි වූ සංඛ්‍යාව | ස්ථානය |
|---|---|---|---|---|---|---|---|
| 01 | කලා වැඩමුළුව | කෘෂිකර්ම හා වැවිලි කළමනාකරණ පීඨයේ කලා කවය | සේව නියුක්ති කුසලතා වර්ධනය | කෘෂිකර්ම පීඨයේ කලා කවයේ සිසුන් | 2014 ජනවාරි 11 | සිසුන් 15 යි | මාකඳුර පරිශ්‍රය |
| 02 | EDEX වෘත්තීය ප්‍රදර්ශනය | රාජකීය ආදී ශිෂ්‍ය සංගමය | වෘත්තීය අභිමුඛ තොරතුරු සම්පාදනය | වයඹ විශ්වවිද්‍යාලයේ උපාධි අපේක්ෂකයින් | 2014 ජනවාරි 18 | සිසුන් 50 යි | බණ්ඩාරණායක ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාව |
| 03 | කවුළුව (කලා කවය වැඩසටහන) | කෘෂිකර්ම හා වැවිලි කළමනාකරණ පීඨයේ කලා කවය | සේව නියුක්ති කුසලතා වර්ධනය | මාකඳුර පරිශ්‍රයේ උපාධි අපේක්ෂකයින් | 2014 ජනවාරි 22 | සිසුන් 500 යි | මාකඳුර පරිශ්‍රය |
| 04 | නායකත්වයල ජීවන කුසලතා හා වෘත්තීය සංවර්ධන වැඩමුළුව | පිරිස් කළමනාකරණ ආයතනය | සේව නියුක්ති කුසලතා වර්ධනය | මාකඳුර පරිශ්‍රයෙ තෙවන වසර උපාධි අපේක්ෂකයින් | 2014 පෙබරවාරි 02 | සිසුන් 80 යි | මාකඳුර පරිශ්‍රය |
| 05 | වෘත්තීය මාර්ගෝපදේශනය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන | ආචාර්ය ඩී සී අබේසිංහ මහතා අධ්‍යක්ෂ වෘත්තීය මාර්ගෝපදේශන ඒකකය | වෘත්තීය සම්බන්ධතා තොරතුරු ලබා දීම | ප්‍රථම වසර සිසුන් කෘෂිකර්ම හා වැවිලි කළමනාකරණ පීඨය | 2014 මාර්තු 06 | සිසුන් 110 | මාකඳුර පරිශ්‍රය |
| 06 | බාහිර පුහුණුව සහ ඓතිහාසික යාපහුව නැරඹීම | ආචාර්ය ඩී සී අබේසිංහ මහතා අධ්‍යක්ෂ වෘත්තීය මාර්ගෝපදේශන ඒකකය | සේව නියුක්ති කුසලතා වර්ධනය | ප්‍රථම වසර සිසුන් කෘෂිකර්ම හා වැවිලි කළමනාකරණ පීඨය | 2014 මාර්තු 24 | සිසුන් 130 | යාපහුව කඳු ප්‍රදේශය |
| 07 | වෘත්තීය මාර්ගෝපදේශනය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන | ආචාර්ය ඩී සී අබේසිංහ මහතා අධ්‍යක්ෂ වෘත්තීය මාර්ගෝපදේශන ඒකකය | වෘත්තීය සම්බන්ධතා තොරතුරු ලබා දීම | ප්‍රථම වසර සිසුන් පශු සම්පත් ධීවර හා පෝෂණ පීඨය | 2014 මාර්තු 27 | සිසුන් 90 | මාකඳුර පරිශ්‍රය |
| 08 | කෘෂිකර්ම හා වැවිලි කළමනාකරණ පීඨය විභාග සඳහා සාර්ථකව මුහුණ දීම | ආචාර්ය ඩී සී අබේසිංහ මහතා අධ්‍යක්ෂ වෘත්තීය මාර්ගෝපදේශන ඒකකය | සේව නියුක්ති කුසලතා වර්ධනය පර්යේෂණය හා සංවර්ධන කුෂලතා වර්ධනය | ප්‍රථම වසර සිසුන් කෘෂිකර්ම හා වැවිලි කළමනාකරණ පීඨය | 2014 අප්‍රේල් 02 | සිසුන් 130 | මාකඳුර පරිශ්‍රය |
| 09 | පශු සම්පත් ධීවර හා පෝෂණ පීඨය විභාග සඳහා සාර්ථකව මුහුණ දීම | ආචාර්ය ඩී සී අබේසිංහ මහතා අධ්‍යක්ෂ වෘත්තීය මාර්ගෝපදේශන ඒකකය | සේව නියුක්ති කුසලතා වර්ධනය පර්යේෂණය හා සංවර්ධන කුෂලතා වර්ධනය | ප්‍රථම වසර සිසුන් පශු සම්පත් ධීවර හා පෝෂණ පීඨය | 2014 අප්‍රේල් 28 | සිසුන් 120 | මාකඳුර පරිශ්‍රය |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 10 | කොළඹ තොග වෙළඳාම ව්‍යාපාර අධ්‍යයන මූල්‍ය පීඨය | තුසිත මීගහකුඹුර මහතා කළමනාකරු | ව්‍යවසායකත්ව කුසලතා වර්ධනය | ව්‍යාපාර අධ්‍යයන මූල්‍ය පීඨය තෙවන වසර සිසුන් | 2014 මැයි 06 | සිසුන් 80යි | කුලියාපිටිය පරිශ්‍රය |
| 11 | ඔබේ රැකියාවෙන් සාර්ථක වන්නෙ කෙසේද? | මොහාන් පල්ලියගුරු මහතා | වෘත්තීය සම්බන්ධතා තොරතුරු ලබා දීම | පළමු දෙවන හා තෙවන වසර සිසුන් | 2014 මැයි 21 | සිසුන් 700 යි | කුලියාපිටිය පරිශ්‍රය |
| 12 | තේ රස බැලීම වැඩමුළුව | උපාලි ප්‍රේමලාල් මහතා නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි | පර්යේෂණ සංවර්ධන කුෂලතා | තෙවන වසර සිසුන් කෘෂිකර්ම හා වැවිලි කළමනාකරණ පීඨය | 2014 ජූනි 09 | සිසුන් 32 | මාකඳුර පරිශ්‍රය |
| 13 | නායකත්ව සංවර්ධන කඳවුර | මොහාන් පල්ලියගුරු මහතා | සේව නියුක්ති කුසලතා සංවර්ධනය | පළමු වසර හා දෙවන වසර සිසුන් කෘෂිකර්ම හා වැවිලි කළමනාකරණ පීඨය | 2014 ජූනි 12, 13, 14 දිනයන් හිදී | සිසුන් 100 | පුහුණු මධ්‍යස්ථානය පිටබැද්දර අකුරැස්ස |
| 14 | කොකා කෝලා සමාගම | - | අත්දැකීම හා සේවා නියුක්ති කුසලතා වර්ධනය | වයඹ විශ්වවිද්‍යාලයීය උපාධි අපේක්ෂකයින් | 2014 ජූනි 11 | සිසුන් 20 | කුලියාපිටිය සහ මාකඳුර පරිශ්‍ර |
| 15 | සම්මුඛ පරීක්ෂණවලට මුහුණ දීම සහ ඉල්ලුම්පත්‍ර සැකසීම | එම් ජිෆ්රියා මහතා අධ්‍යක්ෂ | අත්දැකීම හා සේවා නියුක්ති කුසලතා වර්ධනය | පළමු වසර හා දෙවන වසර සිසුන් | 2014 ජූනි 18 | සිසුන් 130 | මාකඳුර පරිශ්‍රය |
| 16 | නායකත්ව සංවර්ධන කඳවුර | මොහාන් පල්ලියගුරු මහතා | අත්දැකීම හා සේවා නියුක්ති කුසලතා වර්ධනය | පලමු වසර හා දෙවන වසර සිසුන් | 2014 ජූනි 20, 21, 22 දිනයන් හිදී | සිසුන් 100 | මීරිගම බාලදක්ෂ කඳවුර |
| 17 | ප්‍රගමනය කලා කවය වැඩසටහන | ජයලත් මනෝරත්න මහතා | සේවා නියුක්ති කුසලතා වර්ධනය | මාකඳුර පරිශ්‍රයේ උපාධි අපේක්ෂකයින් | 2014 ජූලි 23 | සිසුන් 500 | මාකඳුර පරිශ්‍රය |
| 18 | ඔබේ රැකියාවෙන් සාර්ථක වන්නේ කෙසේද සහතික ප්‍රදානය | මොහාන් පල්ලියගුරු මහතා | සේවා නියුක්ති කුසලතා වර්ධනය | උපාධි අපේක්ෂකයින් සහ අනධ්‍යයන කාර්ය මණ්ඩලය | 2014 ඔක්තෝබර් 01 | සිසුන් 200 | මාකඳුර පරිශ්‍රය |
| 19 | උපාධිධාරී ව්‍යාපාරික උද්‍යානය වැඩසටහන | සමන් වනසිංහ මහතා කථිකාචාර්ය කොළඹ විශ්ව විද්‍යාලය | සේවා නියුක්ති කුසලතා වර්ධනය | වයඹ විශ්ව විද්‍යාලයීය උපාධිධාරීන් හා උපාධි අපේක්ෂකයින් | 2014 ඔක්තෝබර් 04 | - | මාකඳුර පරිශ්‍රය |
| 20 | ඉල්ලුම්පත්‍ර ලිවීමේ වැඩමුළුව | සමන් වනසිංහ මහතා කථිකාචාර්ය කොළඹ විශ්ව විද්‍යාලය | සේවා නියුක්ති කුසලතා වර්ධනය | තෙවන වසර සහ සිව්වන වසර සිසුන් | 2014 ඔක්තෝබර් 14 | සිසුන් 40 | මාකඳුර පරිශ්‍රය |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 21 | සම්මුඛ පරීක්ෂණවලට මුහුණ දීම සහ ඉල්ලුම්පත්‍ර සැකසීම | එම් ජිෆ්රියා මිය | සේවා නියුක්ති කුසලතා වර්ධනය | සිව්වන වසර සිසුන් ව්‍යාපාර අධ්‍යයන හා මූල්‍ය පීඨය | 2014 ඔක්තෝබර් 15 | සිසුන් 200 | කුලියාපිටිය පරිශ්‍රය |
| 22 | ජෝන් කීල්ස් පදනම සමග මූලික සාකච්ඡාව | ජෝන් කීල්ස් පදනම | - | සියලුම පීඨාධිපතිවරු සහ සම්බන්ධීකාරකවරු | 2014 ඔක්තෝබර් 24 | - | කුලියාපිටිය පරිශ්‍රය |
| 23 | ගී සර වියන සංගීත වැඩසටහන | ධම්මික බණ්ඩාර සහා ඩැන්ස්ටර් පෙරේරා මහත්වරු | සේවා නියුක්ති කුසලතා වර්ධනය | කුලියාපිටිය පරිශ්‍රයේ උපාධි අපේක්ෂකයින් | 2014 නොවැම්බර් 18 | සිසුන් 500 | කුලියාපිටිය පරිශ්‍රය |
| 24 | මෘදු කුසලතා සංවර්ධන වැඩසටහන | ජෝන් කීල්ස් පදනම | සේවා නියුක්ති කුසලතා වර්ධනය | තෙවන වසර සහ සිව්වන වසර සිසුන් | 2014 නොවැම්බර් 20,21,22 | සිසුන් 500 | කුලියාපිටිය පරිශ්‍රය |
| 25 | වෘත්තීය මාර්ගෝපදේශනය පිළිබඳ දැනුවත් කිරීම | ආචාර්ය ඩී සී අබේසිංහ මහතා අධ්‍යක්ෂ වෘත්තීය මාර්ගෝපදේශණ ඒකකය | වෘත්තීය සංවර්ධනය හා තොරතුරු ලබා දීම | කෘෂිකර්ම හා වැවිලි කළමනාකරණ පීඨය පළමු වසර සිසුන් | 2014 දෙසැම්බර් 31 | සිසුන් 100 | මාකඳුර පරිශ්‍රය |

**19.6 වර්ෂයේ වැඩසටහන් සමාලෝචනය**

2013 වර්ෂය තුළ පීඨ හතරෙහි සිසුන් සඳහා වැඩසටහන් 25 ක් ක්‍රියාත්මක කිරීමට වෘත්තීය මාර්ගෝපදේශ ඒකකයට හැකි විය.

| **පීඨය** | වැඩසටහන් |
|---|---|
| කෘෂිකර්ම හා වැවිලි කළමනාකරණ පීඨය | 06 |
| ව්‍යවහාරිකවිද්‍යා පීඨය | 00 |
| ව්‍යාපාර අධ්‍යයන හා මූල්‍ය පීඨය | 02 |
| පශු සම්පත්, ධීවර හා පෝෂණ පීඨය | 02 |
| මාකඳුර පරිශ්‍රයේ පීඨ දෙක | 05 |
| කුලියාපිටිය පරිශ්‍රයේ පීඨ දෙක | 02 |
| විශ්වවිද්‍යාලයේ පීඨ හතර | 08 |
| **එකතුව** | **25** |

**19.7 2014 වර්ෂයේ අපගේ වැඩසටහන්වලට සම්බන්ධ වූ සිසුන්හට ලැබෙන වරප්‍රසාද හා දීමනා**

- නායකත්ව පුහුණු
- ශිෂ්‍ය සමාගම් වැඩසටහන්
- බාහිර පුහුණු වැඩමුළු
- කර්මාන්තමය පුහුණුව
- රැකියා සඳහා ස්ථානගතවීම
- අයදුම්පත්‍ර ලිවීම ප්‍රගුණ කිරීම
- පෞද්ගලික උපදේශන
- ශිෂ්‍ය දත්ත එකතුව
- රැකියා වෙළඳ පොල
- පුද්ගල පෞරුෂ හා ආකල්ප වර්ධනය

**19.8 2014 විශේෂ ජයග්‍රහණ**

- කුලියාපිටිය පරිශ්‍රයේ රැකියා වෙළඳපොළ සංවිධානය කිරීම
- EDEX අධ්‍යාපනික ප්‍රදර්ශනයට සහභාගි වීම
- වර්ෂය තුළ වැඩසටහන් 25 ක් ක්‍රියාත්මක කිරීම

**19.9 2014 වර්ෂයේ සංවර්ධන වැඩසටහන්**

- **වෘත්තීය මාර්ගෝපදේශ ඒකකයේ මානව සම්පත් සංවර්ධන කටයුතු**
    - පර්යේෂණ කටයුතු සඳහා දායක වීම
    - නව පුහුණු සහ සංවර්ධන වැඩසටහන් සඳහා සහභාගීත්වය
    - උසස් අධ්‍යාපනයට සහ ක්ෂේත්‍ර චාරිකාවලට සම්බන්ධවීම

➢ **භෞතික සම්පත් සංවර්ධනය**

| ඒකකය | ප්‍රමාණය |
|---|---|
| වර්ණ ලේසර් මුද්‍රණ යන්ත්‍ර | 02 |
| කැම්කෝඩර් | 02 |
| ලැප් ටොප් පරිගණක | 10 |
| යූ පී එස් | 03 |
| පරිගණක මේස | 20 |
| පරිගණක ඇඳි පුටු | 20 |
| වැසිකිළි | 01 |
| පොත් සහ සඟරා (පුස්තකාලය සඳහා) | - |
| වානේ අල්මාරි (6'×4'×1.5) | 01 |

**සිසුන් සඳහා නව වැඩසටහන්**

- ආකෘති සම්මුඛපරීක්ෂණ - පටිගත කිරීම් සහිතව
- සමාජීය වගකීම් වැඩසටහන් සහ සේවා
- අධ්‍යයන චාරිකා සහ පර්යේෂණ සඳහා සහභාගීත්වය
- ශිෂ්‍ය තොරතුරු ජාලගත කිරීම
- ව්‍යවසායකත්ව සංවර්ධන වැඩසටහන්
- බඳවා ගැනීම් ඒජන්සි සමග සම්බන්ධතා ගොඩ නංවා ගැනීම

## 19.10 සමාප්තිය

වෘත්තීය මාර්ගෝපදේශන ඒකකය 2014 වර්ෂයේ දී වැඩසටහන් 25ක් මෙහෙය වීය. මේ තුළින් අපගේ ශිෂ්‍යයන්හට පහත සඳහන් පුද්ගල කුසලතා ඉහළ නංවා ගැනීමට හැකිවිය

- **නව චින්තනය**
- **උනන්දුව ඇතිකර ගැනීම**
- **නිර්මාණාත්මකබව**
- **නම්‍යශීලී බව**
- **සම්පත්දායකත්වය**
- **කාර්යශූර**
- **ශක්‍යතාපිරි**
- **අවංක**
- **ස්වයං ප්‍රලෝභන**
- **ධනාත්මක ආකල්ප පිරි**
- **උපායශීලී**
- **වගකීම් දරන**
- **වෙලඳ ක්ෂේත්‍රයට අවතීර්ණ**
- **සිතීමේ හැකියාවෙන් යුත්**
- **විනය ගරුක**
- **දැඩිව ක්‍රියාවන්හි එල්බගත්**
- **විනෝදකාමී**
- **උනන්දුවෙන් පිරි**

## 19.11 වර්ෂය තුළ සිදු කරන ලද සියලු කාර්යන් සඳහා වැය වූ මුළු වියදම

| අංකය | වැඩසටහන | වෘත්තීය මාර්ගෝපදේශ ඒකකයෙන් ප්‍රතිපාදන වෙන් කිරීම | HETC අරමුදල් |
|---|---|---|---|
| 1 | කලා වැඩමුළුව | 13256 | - |
| 2 | EDEX වෘත්තීය ප්‍රදර්ශනය | - | - |
| 3 | කවුළුව (කලා කවය වැඩසටහන) | 10456.00 | - |
| 4 | නායකත්වයල ජීවන කුසලතාසහ වෘත්තීය සංවර්ධන වැඩසටහන | 61200ග00 | - |
| 5 | වෘත්තීය මාර්ගෝපදේශනය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන | නැත | - |
| 6 | බාහිර පුහුණුව ඓතිහාසික යාපහුව නැරඹීම | 30718ග00 | - |
| 7 | වෘත්තීය මාර්ගෝපදේශණ දැනුවත්කිරීමේ වැඩසටහන | නැත | නැත |
| 8 | විභාග වලදී සාර්ථක සාර්ථක වන්න - කෘෂිකර්ම හා වැවිලි කළමනාකරණ පීඨය | නැත | නැත |
| 9 | විභාග වලදී සාර්ථක සාර්ථක වන්න - පශු සම්පත්, ධීවර හා පෝෂණ පීඨය | නැත | නැත |
| 10 | කොළඹ කොටස් හුවමාරුව පිළිබඳ වැඩමුළුව - ව්‍යාපාර අධ්‍යයන හා මූල්‍ය පීඨය | 784.00 | නැත |
| 11 | ඔබේ වෘත්තියේ සාර්ථක වන්නේ කෙසේද? | 864.00 | නැත |
| 12 | තේ රස පරීක්ෂණය වැඩමුළුව | 6307.00 | නැත |
| 13 | සම්මුඛ පරීක්ෂණ කොකා කෝලා | 1255.00 | නැත |
| 14 | බාහිර පුහුණුව - නායකත්ව කඳවුර<br>කෘෂිකර්ම හා වැවිලි කළමනාකරණ පීඨය හා පශු සම්පත්, ධීවර හා පෝෂණ පීඨය | නැත | 275,000.00 |
| 15 | සම්මුඛ පරීක්ෂණ සඳහා මුහුණ දීම සහ අයදුම්පත් ලිවීම වැඩමුළුව | නැත | නැත |
| 16 | බාහිර පුහුණුව - නායකත්ව වැඩමුළුව<br>ව්‍යාපාර අධ්‍යයන හා මූල්‍ය පීඨය හා ව්‍යවහාරිකවිද්‍යා පීඨය | නැත | 275000.00 |
| 17 | ප්‍රගමනය (කලා කව වැඩසටහ) | 14975ග00 | නැත |
| 18 | ඔබගේ වෘත්තියේ සාර්ථක වන්නේ කෙසේද<br>සහතික පත්‍ර ප්‍රදානය | 4210.00 | නැත |
| 19 | උපාධිධාරී ව්‍යාපාරික උද්‍යානය වැඩසටහන | 3350.00 | නැත |
| 20 | අයදුම්පත් ලිවීම (ජීව දත්ත) වැඩමුළුව | නැත | නැත |
| 21 | අයදුම්පත් ලිවීම සහ සම්මුඛ පරීක්ෂණවලට මුහුණදීම වැඩමුළුව | 11660.00 | නැත |
| 22 | ජෝන් කීල්ස් පදනම සමග මූලික සාකච්ඡා | නැත | නැත |
| 23 | ගීසර වියන (සංගීතමය වැඩසටහන) | 8600.00 | නැත |
| 24 | මෘදු කුසලතාසංවර්ධන වැඩසටහන | 213,500.00 | නැත |
| 25 | වෘත්තීය මාර්ගෝපදේශණ දැනුවත් කිරීමේ වැඩසටහන | නැත | නැත |
| | **එකතුව** | **383,190.00** | **550000.00** |

# 20. තොරතුරු සන්නිවේදන තාක්‍ෂණ මධ්‍යස්ථානය කුලියාපිටිය පරිශ්‍රය

## 20.1 හැඳින්වීම

කුලියාපිටිය පරිශ්‍රයේ තොරතුරු සන්නිවේදන තාක්‍ෂණ මධ්‍යස්ථානය මගින් කුලියාපිටිය පරිශ්‍රයේ විශ්වවිද්‍යාල ප්‍රජාව සඳහා තොරතුරු තාක්‍ෂණික සේවාව සහ තොරතුරු තාක්‍ෂණ පුහුණු වැඩසටහන් සැපයේ. මේ මගින් සිසුන් සඳහා තොරතුරු තාක්ෂණ පුහුණුවල කාර්ය මණ්ඩලය සහ බාහිර වෘත්තිකයන්ගේ තොරතුරු තාක්ෂණ පුහුණුව සඳහා සේවය ලබාදෙයි. මෙම අංශය මගින් අධ්‍යයන කටයුතු සඳහා නොමඳ දායකත්වයක් ලබාදෙයි. එමගින් තොරතුරු තාක්ෂණ සක්‍යතාවල සුදුසු පරිසරාත්මක පසුබිමක් ඔස්සේ ලබාදෙන අතර අධ්‍යාපන හා පර්යේෂණ වැඩසටහන් සඳහා පරිගණක පහසුව සැපයේ.ඒ අනුව තොරතුරු තාක්ෂණයේ නවතම උපාංග භාවිතයෙන් සේවය සැපයීම සිදුකෙරේ. මෙම සේවාවන්ට විද්‍යුත් තැපෑල, අන්තර්ජාල පහසුකම්ල ඉගෙනුම් කළමනාකරණ පද්ධතිය, අන්තර්ජාල නඩත්තුව ආදිය ඇතුලත් වේ. තොරතුරු තාක්ෂණ යටිතල පහසුකම්ල විද්‍යුත් අධ්‍යයන ඇරඹුම් (ඉගෙනුම් ආධාරක පරිගණක ගත කිරීම, ඉගෙනුම් කළමනාකරණ පද්ධති ) මෙමගින් සැපයේ. අධ්‍යයනාංශ සහ ඒකක සඳහා ඔවුන්ගේ තොරතුරු මාර්ගගත (Online) පද්ධතිය හරහා සැපයීම සිදු කෙරේ.

## 20.2 පුහුණු / දැනුවත් කිරීමේ වැඩසටහන් /මෙහෙය වන ලද පාඨමාලා

- ව්‍යවහාරිකවිද්‍යා පීඨයේ අභ්‍යන්තර ශිෂ්‍යයන් සඳහා ඩිප්ලෝමා සහ උසස් සහතික පත්‍ර පාඨමාලා මෙහෙයවීම.
- බාහිර අයදුම්කරුවන් සඳහා සහතික පත්‍ර පාඨමාලාව (මුදල් අය කෙරේ)
- බාහිර සිසුන් සඳහා තොරතුරු තාක්‍ෂණ ඩිප්ලෝමා පාඨමාලාව (මුදල් අය කෙරේ)
- රාජ්‍ය සේවකයන් සඳහා පරිගණක දැණුම ලබාදීමේ වැඩසටහන
- කුලියාපිටිය පරිශ්‍රයේ පීඨ දෙකෙහි සිසුන් සඳහා උපාධි අපේක්ෂක තොරතුරු තාක්ෂණ විභාග සඳහා සේවය සැපයිණි.

## 20.3 ව්‍යාපාර අධ්‍යයන හා මූල්‍ය පීඨය සහ ව්‍යවහාරිකවිද්‍යා පීඨය සඳහා පරිගණක විද්‍යාගාර පහසුකම්

මෙම මධ්‍යස්ථානය සඳහා පරිගණක විද්‍යාගාර තුනක් ඇත. මෙයින් විශාලතම විද්‍යාගාරයේ පරිගණක 40ක් අඩංගුවන අතර අනෙකුත් විද්‍යාගාර දෙකෙහි 20 බැගින් වන පරිදි පරිගණක පහසුව ඇත. මෙම විද්‍යාගාර පෙ.ව. 8.00සිට ප.ව. 8.00 දක්වා සතියේ දිනවල විවෘතව තැබෙන අතර සෙනසුරාදා දිනවල පෙ.ව. 8.00 සිට ප.ව. 4.00 දක්වා විවෘතව පවතී.

## 20.4 අයවැය

| | | |
|---|---|---|
| ප්‍රාග්ධන | - | 1.2 මිලියන |
| පුනරාවර්තන | - | 3.4 මිලියන |

## 20.5 කාර්යමණ්ඩලය

| | |
|---|---|
| පද්ධති ඉංජිනේරු | - 01 |
| උපදේශක - පරිගණක තාක්‍ෂණ | - 01 |
| කථිකාචාර්ය (ආධුනික) පරිගණක තාක්‍ෂණ | - 03 |
| පරිගණක යෙදුම් සහකාර | - 02 |
| විද්‍යාගාර සහායක | - 01 |
| කම්කරු | - 01 |
| කාර්මික නිලධාරී | - 01 |

## 20.6 වර්ෂය තුළ ප්‍රගතිය

- පරිගණක රැහැන් ජාලය පුළුල් කිරීම
- විශ්වවිද්‍යාලයේ වෙබ් අඩවිය සංවර්ධනය කිරීම සහ නඩත්තු කටයුතු
- බාහිර සිසුන් සඳහා ඩිප්ලෝමා පාඨමාලවන් ආරම්භ කිරීම
- රැහැන් රහිත ජාලය පුළුල් කිරීම

## 20.7 දුෂ්කරතාවන්

- කාර්ය මණ්ඩලය සඳහා යටිතල පහසුකම් සැපයීමට ප්‍රතිපාදන හිඟ වීම
- වැඩිවන ශිෂ්‍ය සංඛ්‍යාවට සාපේක්ෂව පරිගණක විද්‍යාගාර පුළුල් කිරීම සඳහා ඉඩකඩ ප්‍රමාණවත් නොවීම
- මෙම මධ්‍යස්ථානය ස්ථාපිතව ඇත්තේ පරිගණක මධ්‍යස්ථානයකට සුදුසු නොවන ඉතා පැරණි ගොඩනැගිල්ලකය

## 20.8 අනාගත සංවර්ධනය සඳහා යෝජනා

- මෙම ගොඩනැගිල්ල ඉතා පැරණි සහ පරිගණක මධ්‍යස්ථානයකට සුදුසු නොවන හෙයින් කුලියාපිටිය පරිශ්‍රයේ තොරතුරුතාක්ෂණ මධ්‍යස්ථානය සඳහා නව ගොඩනැගිල්ලක් අවශ්‍ය කෙරේ
- ඉගෙනුම් කළමනාකරණ පද්ධතිය (Learning Management System) අධ්‍යයන කාර්ය මණ්ඩලය සඳහා හඳුන්වා දීම
- බාහිර පුද්ගලයන් සඳහා වැඩමුළු පැවැත්වීම
- පරිගණක විද්‍යාගාරයේ පුළුල් කිරීම් සිදු කරමින් වැඩිවන ශිෂ්‍ය සංඛ්‍යාවට පහසුකම් සැපයීම
- රැහැන් රහිත ජාලය පුළුල් කිරීම
- කාර්ය මණ්ඩල පුහුණුව සාමාන්‍ය තොරතුරු තාක්ෂණ සහතික පත්‍ර පරීක්ෂණය සඳහා කාර්ය මණ්ඩලය පුහුණු කිරීම

## 20.9 වෙනත් අදාළ තොරතුරු

බහුසේවා මධ්‍යස්ථානයක් (Multi Service Centre) වශයෙන් තොරතුරු තාක්ෂණ මධ්‍යස්ථානය දියුණු කිරීම අවශ්‍ය වන අතර එමගින් විශ්වවිද්‍යාලයටත් බාහිර පාර්ශ්වයන්ටත් පුළුල් සේවාවන් සැපයිය හැකිය.

# 21. තොරතුරු සන්නිවේදන තාක්‍ෂණ මධ්‍යස්ථානය - මාකඳුර පරිශ්‍රය

## 21.1 හැඳින්වීම

සිසුන්ගේ ශීඝ්‍රයෙන් දියුණුවන විෂය ක්ෂේත්‍රවලට අදාළ තොරතුරු තාක්‍ෂණ අභියෝගයන්ට මුහුණ දීමට හැකි සේවාවක් සැපයීම සඳහා මාකඳුර තොරතුරු සන්නිවේදන තාක්‍ෂණ මධ්‍යස්ථානය පිහිටුවා ඇත. එමෙන්ම මේ නිසා ඔවුන්ට පරිගණක සාක්ෂරතාව මෙන්ම ඉහළ වෘත්තීය කාර්යය සාධනයක් ලබා ගැනීමට පහසුකම් සැලසී ඇත.

මෙම ඒකකය මඟින් කෘෂිකර්ම හා වැවිලි  කළමනාකරණ පීඨය සඳහා තොරතුරු තාක්‍ෂණ හා උසස් පරිගණක භාවිතාව පිළිබඳ පාඨමාලා ඉදිරිපත් කරන අතර පශු සම්පත්, ධීවර හා පෝෂණ පීඨය සඳහා පරිගණක තාක්‍ෂණ පාඨමාලාව පවත්වනු ලැබේ. එමෙන්ම අධ්‍යයනාංශ මඟින් පවත්වන සංඛ්‍යානය ආශ්‍රිත පාඨමාලා සඳහා විශේෂයෙන්ම ප්‍රායෝගික පරීක්‍ෂණවල දී මෙම ඒකකය මඟින් සේවාව සැපයේ. ඊට අමතරව විශ්වවිද්‍යාලය මඟින් පවත්වනු ලබන කෘෂිකර්ම හා වැවිලි  කළමනාකරණ බාහිර උපාධි පාඨමාලාව හදාරන සිසුන්ට පරිගණක තාක්‍ෂණය සහ විද්‍යුත් වාණිජ්‍ය හා තොරතුරු කළමනාකරණ පද්ධති යන පාඨමාලා පවත්වනු ලැබේ. එමෙන්ම පළාතේ බාහිර ප්‍රජාවට ප්‍රයෝජනවත් වන පරිගණක තාක්‍ෂණයට සම්බන්ධ පාඨමාලා කීපයක්ම පවත්වමින් තොරතුරු සන්නිවේදන තාක්‍ෂණ මධ්‍යස්ථානය මඟින් වඩාත් පුළුල් සේවාවක් සැපයේ.

මෙම මධ්‍යස්ථානය සතියේ දිනවල පෙරවරු 8.00 සිට පස්වරු 8.00 දක්වාත්, සෙනසුරාදා දිනවල පෙරවරු 8.00 සිට පස්වරු 5.00 දක්වාත්, විභාග කාලය තුළ දී සතියේ දිනවල පෙරවරු 8.00 සිට පස්වරු 10.00 දක්වාත් විවෘතව පවතී.

## 21.2 මෙහෙයවන ලද පුහුණු / දැනුවත් කිරීමේ වැඩසටහන්

- 2014 මාර්තු මස DIT සහ CCAS ශිෂ්‍යයන් සඳහා "පරිගණක දෘඩාංග එකලස් කිරීම" පිළිබඳ එක්දින වැඩමුළුවක් මෙහෙය වීය.
- 2014 මැයි මස දී පරිගණක යෙදවුම් සහ කුසලතා පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව පස්වෙනි (05) ශිෂ්‍ය කණ්ඩායම අධ්‍යයන කටයුතු අවසන් කෙරිණි.
- 2014 දෙසැම්බර් මස වන විට තොරතුරු තාක්ෂණ ඩිප්ලෝමාවේ තුන්වන් (03) ශිෂ්‍ය කණ්ඩායම අවසන් කෙරිණි.
- "e-learning" ක්‍රමවේදය හඳුන්වා දීම පිළිබඳ වැඩමුළු 03ක් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ HETC ව්‍යාපෘතිය යටතේ සිසුන්, කාර්යමණ්ඩලය සඳහා පැවැත්විණි.
- "ඉගෙනුම් කළමනාකරණ පද්ධතිය සංවර්ධනය කිරීම " යටතේ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ HETC ව්‍යාපෘතිය යටතේ අධ්‍යයන කාර්යමණ්ඩලය සඳහා වැඩමුළු දෙකක් පැවැත්විණි.
- පරිගණක යෙදවුම් සහ කුසලතා පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව හයවෙනි (06) ශිෂ්‍ය කණ්ඩායම 2014 ඔක්තෝබර් මස දී ආරම්භ කෙරිණි.
- 2014 නොවැම්බර් මස දී තොරතුරු තාක්ෂණ ඩිප්ලෝමාවා සඳහා හතරවන (04) ශිෂ්‍ය කණ්ඩායම බඳවා ගන්නා ලදී.
- නව තොරතුරු තාකෂණ ඩිප්ලෝමාව කෘෂිකර්ම හා වැවිලි  කළමනාකරණ පීඨය සහ පශු සම්පත්, ධීවර හා පෝෂණ පීඨයේ උපාධි අපේක්ෂකයන් සඳහා හඳුන්වා දෙන ලදී.
- අවශ්‍යතා විශ්ලේෂණයක් සිදු කොට පාඨමාලා ඇගයීම් වැඩමුළුවක් කාර්යමණ්ඩලය, සිසුන් සහ HETC ව්‍යාප්තියේ සේවයේ නිරතවන්නන් සඳහා සිදු කෙරිණි.

- ඇරඹුම් ක්‍රමවේදය සහ තොරතුරු පද්ධති කළමනාකරණ ක්‍රමවේදය පිළිබඳ වැඩමුළු දෙකක් විශ්වවිද්‍යාලයේ පරිගණක යෙදවුම් සහකාරවරුන් සහ තාක්ෂණ නිලධාරීන් සඳහා කාර්යමණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානයේ සහයෝගයෙන් පැවැත්විණි
- තොරතුරු සන්නිවේදන තාක්ෂණ වැඩමුළුවක් 2014 සැප්තැම්බර් මස දී නාවික සහ සාමුද්‍රික ඇකඩමියේ පුහුණුවන නැවියන් සඳහා පැවැත්විණි
- වෘත්තීය පුහුණු අධිකාරිය යටතේ ඇති කුරුණෑගල දිස්ත්‍රික්කයේ වෘත්තීය පුහුණු මධ්‍යස්ථානයන්හි පුහුණුවන්නන් සඳහා ,අන්තර්ජාලකරණය, පිළිබඳව වැඩමුළුවක් පැවැත්විණි.

## 21.3 පර්යේෂණ කටයුතු

**ප්‍රකාශණ** - වීරසිංහ කේ. ඒ. එස්. එල්. රිචර්ඩ් සහ ඇන්ඩි ඩී පර්කින්ස් - 2014 Development of an interactive online database for teaching plant materials, Wayamba International Conference (WINC) 2014 අගෝස්තු 29-30 කුලියාපිටියල ශ්‍රී ලංකා

ගජනායක බී කාංචන, එස් වීරසිංහ සහ කේ ආර් රෙඩී - 2014 "Screening Garden Roses for easthetic Quality and abiotic stress tolerance. Wayamba International Conference" (WINC) 2014 අගෝස්තු 29-30 කුලියාපිටිය, ශ්‍රී ලංකා

## 21.4 කාර්යය මණ්ඩලය

| | |
|---|---|
| පද්ධති ඉංජිනේරු | - 01 |
| උපදේශක - පරිගණක තාක්‍ෂණ | - 01 |
| කථිකාචාර්ය (ආධුනික) පරිගණක තාක්‍ෂණ | - 02 |
| පරිගණක යෙදුම් සහකාර | - 01 |
| විද්‍යාගාර සහායක | - 01 |
| කම්කරු | - 01 |
| තාක්ෂණ නිලධාරි | - 01 |

- ආචාර්ය ඩබ් ජේ ජී කේ එස් වීරසිංහ මිය ඇයගේ ආචාර්ය උපාධිය නිම කිරීමෙන් පසු 2014 මැයි මස දී ආපසු පැමිණියාය
- එච් ඩබ් එච් ප්‍රේමචන්ද්‍ර මහතා කොන්ත්‍රාත් පදනම මත පරිගණක උපදේශක ලෙස 2014 මැයි මස 12 දින සිට වසරක කාලයක් සඳහා බඳවා ගන්නා ලදී
- එස් බී එච් සී පී හේරත් මහතාගේ සේවය තාවකාලිකව පදනම මත පරිගණක උපදේශක ලෙස 2014 දෙසැම්බර් මස 02 දින සිට වසරක කාලයක් සඳහා දීර්ඝ කෙරිණි
- එච් ඒ ඩී කේ ජයතිලක මහතා 2014 පෙබරවාරි මස සිට ඔහුගේ අචාර්ය උපාධිය සඳහා අධ්‍යයන නිවාඩු ලබා ඇත

## 21.5 අයවැය

මිලියන 2.0 ක මුදලක් තොරතුරු සන්නිවේදන තාක්‍ෂණ මධ්‍යස්ථානය සඳහා වෙන් කරන ලද අතර පරිගණක පද්ධතිය නගා සිටුවීම සඳහා වැය කෙරිණි.

තොරතුරු සන්නිවේදන තාක්‍ෂණ මධ්‍යස්ථානය වෙත ලැබුණු රුපියල් මිලියන 11.5 ක් නේවාසිකාගාර පරිගණක විද්‍යාගාර සහ කෘෂිකර්ම හා වැවිලි කළමනාකරණ පීඨය සහ පශු සම්පත්, ධීවර හා පෝෂණ පීඨයේ අන්තර්ජාල අභිවෘධියේ කටයුතු සඳහා වැය කෙරිණි.

## 21.6 වසර තුළ ප්‍රගතිය

- HETC ප්‍රතිපාදන වැය කොට විශ්වවිද්‍යාලයේ WiFi ජාල පහසුකම් වැඩිදියුණු කෙරිණි.
- විශ්වවිද්‍යාලයේ අන්තර්ජාල පහසුකම් ශිෂ්‍යනේවාසිකාගාරය දක්වා දීර්ඝ කෙරිණි.
- HETC ප්‍රතිපාදන වැය කොට නව ශිෂ්‍ය නේවාසිකාගාරය අසල කුඩා පරිගණක විද්‍යාගාරයක් ආරම්භ කරන ලදී.
- 2014 අප්‍රේල් මාසයේ දී මාකඳුර පරිශ්‍රයේ සියලු අංශයන් සඳහා Anti - Virus Guard යොදන ලදී.
- අන්තර්ජාල ග්‍රාහක පහසුව (Bandwidth) 10mbps සිට 40mbps දක්වා පුළුල් කරන ලද අතර වේගය 50mbps සිට 100mbps දක්වා වර්ධනය කෙරිණි.

## 21.7 බාධාවන්

- පරිගණක විද්‍යාගාර සඳහා භෞතික ඉඩකඩ ප්‍රමාණවත් නොවීම
- අවශ්‍ය ප්‍රමාණයට දේශන ශාලා සහ කාර්ය මණ්ඩල කාමර පහසුකම් නොමැති වීම

## 21.8 අනාගත සංවර්ධනය සඳහා යෝජනා

වර්ග මීටර 2000ක ඉඩකඩක් සහිත ගොඩනැගිලක තොරතුරු සන්නිවේදන තාක්ෂණ මධ්‍යස්ථානය සඳහා අවශ්‍ය කෙරේ.

## 21.9 අදාළ වෙනත් තොරතුරු

ඩබ් ඩී සමන්වික්‍රම මහතා NOC-LEARN මඟින් සංවිධානය කරන ලද (2014 ජනවාරි මස) NOC රැස්වීම සහ විශ්වවිද්‍යාල ජාලකරණ සැලසුම් වැඩමුළුව සඳහා සහභාගි විය

## 22. ඉංග්‍රීසි ඉගැන්වීමේ ඒකකය - කුලියාපිටිය පරිශ්‍රය

### 22.1 දැක්ම

ඉංග්‍රීසි ඉගැන්වීමේ ඒකකයේ දැක්ම වනුයේ ශ්‍රී ලංකාවේ උසස් අධ්‍යාපන ක්ෂේත්‍රයේ ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීමේ ප්‍රධාන මධ්‍යස්ථානය බවට පත් වීමය.

### 22.2 මෙහෙවර

ඉංග්‍රීසි ඉගැන්වීමේ ඒකකයේ මෙහෙවර වනුයේ ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීම හා ඉගෙන ගැනීම සම්බන්ධ තෝරාගත් ක්‍රමවේද මඟින් උපාධි අපේක්ෂකයින්ගේ භාෂා ප්‍රවීණතාව වැඩි දියුණු කිරීම.

- ඵලදායී ක්‍රමවේද මගින් කතාව, කියවීම, ලිවීම සහ සවන්දීම පිළිබඳ මනා පුහුණුවක් ලබාදීම.
- ශාස්ත්‍රීය, සමාජීය, හා වෘත්තීය ප්‍රජාවේ ක්‍රියාකාරී කොටසක් බවට පත්වීම සඳහා සිසුන් පෙළඹවීම.
- ජාතික සංවර්ධනයට අවශ්‍ය මානව සම්පත් දියුණු කිරීම සඳහා පහසුකම් සැලසීම පිණිස ඵලදායි සංනිවේදන කුසලතා ලබා දීම.

කුලියාපිටිය ඉංග්‍රීසි ඉගැන්වීමේ ඒකකය මඟින් සිසුන්ට ඔවුන්ගේ අනාගතය හමුවේ ඇති අභියෝගවලට මුහුණ දීම සඳහා අවශ්‍ය භාෂා නිපුණතාව ලබා ගැනීමටත්, ඔවුන්ගේ අවංකභාවය වැඩි දියුණු කර, අනුවර්තනීය සහ සක්‍රීය ඵලදායී පුරවැසියන් ලෙස රටට බිහිකිරීමත් අපේක්ෂා කරනු ලැබේ. ජාතික සංවර්ධනය සඳහා විශාල වශයෙන් දායක වීමට සහ අන්‍යෝන්‍ය සම්බන්ධතාවය වර්ධනය කිරීම මෙම පාඨමාලාව හැදෑරීම තුළින් අවස්ථාව උදාකරගත හැක. ශිෂ්‍ය කේන්ද්‍රගත ඉගැනුම් ක්‍රම හඳුන්වාදීම තුළින් ශිෂ්‍ය ක්‍රියාකාරකම්වලට වැඩි අවස්ථාවක් ලබා දීමෙන් ඉංග්‍රීසි භාෂාවේ ප්‍රවීණත්වය ලබා ගැනීම සඳහා සිසුනට උසස් බලාපොරොත්තුවක් ඇති කෙරේ.

### 22.3 කාර්යය මණ්ඩලය

**අධ්‍යයන කාර්යය මණ්ඩලය**

ඊ එම් එච් ජේ එදිරිසිංහ මහතා - සමායෝජක

එම් කේ එස් එම් සමරනායක මහතා - කථිකාචාර්ය

ඩබ්ලිව් එස් ඒ ප්‍රනාන්දු මිය - කථිකාචාර්ය

කේ එම් දිසානායක මහතා - කථිකාචාර්ය (අධ්‍යයන නිවාඩු ලබා සිටියි)

**තාවකාලික උපදේශකවරු**

එන් පී සී ජේ විජේවර්ධන මෙය

ඒ ප්‍රියදර්ශනී මෙය

එල් ජයවික්‍රම මෙය

එල් බණ්ඩාරනායක මයා

**අනධ්‍යයන කාර්යය මණ්ඩලය**

ඩී ජී ආර් එම් විජේසිංහ මෙය (පරිගණක යෙදුම් සහකාර)

ඩබ්ලිව් පී ඩී සිරිවර්ධන මයා (කාර්යාල කම්කරු)

## 22.4 2014 වසරේදී පවත්වන ලද අධ්‍යයන පාඨමාලා

**I) ව්‍යවහාරිකවිද්‍යා පීඨය සඳහා**

- නවක  සිසුන් සඳහා කඩිනම් ඉංග්‍රීසි පාඨමාලාව.
- පළමු වසර සිසුන් සඳහා පවත්වන ඉංග්‍රීසි භාෂා ප්‍රවීණතා පාඨමාලාව
- දෙවන වසර සිසුන් සඳහා පවත්වන ඉංග්‍රීසි භාෂා ප්‍රවීණතා පාඨමාලාව
- තුන්වන මට්ටමේ සිසුන් සඳහා ව්‍යාපාර ඉංග්‍රීසි පිළිබඳ සහතිකපත්‍ර පාඨමාලාව
- තුන්වන මට්ටමේ සිසුන් සඳහා ඉංග්‍රීසි භාෂා උසස් මට්ටමේ ප්‍රවීණතා පාඨමාලාව.

**II) ව්‍යාපාර අධ්‍යයන හා මූල්‍ය පීඨය.**

- ප්‍රථම වසර සිසුන් සඳහා ඉංග්‍රීසි I ව්‍යාකරණ පදනම් පාඨමාලාව (ELTU 1110)
- ප්‍රථම වසර සිසුන් සඳහා ඉංග්‍රීසි II ලේඛන පාඨමාලාව (ELTU 1210)
- දෙවන වසර සිසුන් සඳහා ව්‍යාපාර සන්නිවේදන I පාඨමාලාව (BSF 2131)
- දෙවන වසර සිසුන් සඳහා ව්‍යාපාර සන්නිවේදන II පාඨමාලාව (BSF 2251)

උපාධි අපේක්ෂකයින්ගේ ඉංග්‍රීසි ප්‍රවීණතාව සඳහා විශ්වවිද්‍යාලය තුළ පවත්වන ලද පාඨමාලාවලට අමතරව බාහිර ප්‍රජාව සඳහා ද 2013 වසරේ දි විවිධ බාහිර පාඨමාලාවන් හා වැඩමුළු සංවිධානය කර ඇත. පාසල් සිසුන් සඳහා අ.පො.ස (සා.පෙළ) විභාග සඳහා සම්මන්ත්‍රණ හා වැඩමුළු පවත්වා ඇත. එක් අවුරුදු ඉංග්‍රීසි ඩිප්ලෝමා 7වන කණ්ඩායම 2013 දී සම්පූර්ණ කරන ලද අතර සිසුන් 249 දෙනෙකු පමණ සාර්ථකව පාඨමාලාව නිම කර ඇත.

"යුනිවෙලා" පුද්ගලික ආයතනයේ සහභාගීත්වයෙන් තුන්වන වසරේ උපාධි අපේක්ෂකයින්ට සම්මුඛ පරීක්ෂණවලට පෙනී සිටීමට අවශ්‍ය කුසලතා වර්ධනය කිරීම සඳහා වැඩසටහන් ක්‍රියාත්මක කර ඇති අතර ඒවා ශිෂ්‍යයන්ට ඉතාමත් ඵලදායී වී ඇත.

සහකාර ලේඛකාධිකාරී/සහකාර මූල්‍යාධිකාරී තනතුරු සඳහා බඳවා ගැනීමේ විභාගයට සූදානම් වන මාකඳුර සහ කුලියාපිටිය පරිශ්‍රයේ අනධ්‍යයන කාර්යය මණ්ඩලයේ මහත්ම මහත්මීන් සඳහා තුන් මාසයක ඉංග්‍රීසි භාෂා ප්‍රවීණතා පාඨමාලාවක් පවත්වන ලදි.

## 22.5 සැලසුම් කර ක්‍රියාත්මක කරන ලද බාහිර ක්‍රියාකාරකම්

උපාධි අපේක්ෂයන්ගේ ඉංග්‍රීසි භාෂා ප්‍රවීණතාවය සහ හැකියාවන් වැඩි දියුණු කිරීම සඳහා පහත ක්‍රියාකාරකම් සැලසුම් කර ඇත.

අ. ඉංග්‍රීසි භාෂා විෂය මාලාව ප්‍රතිශෝධනය (දැනට ප්‍රතිශෝධනය කරමින් පවතී)

ආ. ඉංග්‍රීසි භාෂා මධ්‍යස්ථානයේ පහසුකම් සංවර්ධනය කිරීම (භාෂා ඉගැන්වීමේ මෘදුකාංග සවිකිරීම නිම කරන ලදි)

ඇ. විෂය මාලාවට ඉලෙක්ට්‍රොනික මාධ්‍ය හරහා ඉගැන්වීම අන්තර්ගත කිරීම (ව්‍යාපාර ඉංග්‍රීසි සහතික පත්‍ර පාඨමාලාව සඳහා සම්පූර්ණ කර ඇත)

ඈ. ඉංග්‍රීසි අංශයේ ගුරුවරුන් සඳහා පුහුණු වැඩසටහන් සංවිධානය කිරීම (වැඩසටහන් දෙකක් සම්පූර්ණ කර ඇත)

ඉ. භාෂා කඳවුරු සංවිධානය කිරීම (සාර්ථකව නිම කර ඇත)

ඊ. ඉංග්‍රීසි දින තරඟ සංවිධානය (පීඨ මට්ටමින් පවත්වන ලද තරඟ සාර්ථකව නිම කරන ලද අතර විශ්වවිද්‍යාල මට්ටමින් පැවැත්වීමට නියමිතය)

උ. බිත්ති පුවත්පත්/සඟරා/වාර සඟරා යනාදිය නිර්මාණය කිරීම සඳහා උපාධි අපේක්ෂකයන් යොමු කිරීම (නිම කරන ලදී )

## 22.6 දුෂ්කරතා

2005 වසර සිට සෑම වසරකම කුලියාපිටිය පරිශ්‍රයේ පීඨ දෙක සඳහා බඳවා ගන්නා ශිෂ්‍ය ප්‍රමාණය වැඩිකරනු ලැබුව ද අවශ්‍ය සේවක ප්‍රතිපාදන ඇති කිරීම හෝ කථිකාචාර්යවරුන් බඳවා ගැනීම හෝ කර නැත. එසේ තිබිය දී කථිකාචාර්යයවරු තුන්දෙනෙක් තම උපරිම ශක්ති ප්‍රමාණයෙන් මෙම පීඨ දෙකෙහි සිසුන්ගේ ඉංග්‍රීසි භාෂා දැනුම දියුණු කිරීම සඳහා කැපවී සිටිති. නව කථිකාචාර්යවරුන් ලබා දෙන්නේ නම් වඩාත් හොඳ සේවාවක් ලබා දිය හැකි අතර ස්ථිර ආචාර්ය තනතුරු හිඟය නිසා ඇතිවන ගැටලු එවිට අවම වනු ඇත. එමෙන්ම මධ්‍යස්ථානය නිසි පරිදි ක්‍රියාත්මක වීම සඳහා කථිකාචාර්යයවරුන්ගේ සේවය ද අත්‍යවශ්‍යව ඇත.

භාෂා විද්‍යාගාරයේ පවත්වන වැඩසටහන් නිසියාකාරව සිදුකිරීම සඳහා කාර්මික නිලධාරීවරයෙකු නොමැතිකම විශාල ගැටලුවකි. එම නිසා භාෂා විද්‍යාගාරය සඳහා කාර්මික නිලධාරිවරයෙකු පත් කිරීම පිළිබඳව ඉක්මනින් අවධානය යොමු කළ යුතුව ඇත.

# 23. ඉංග්‍රීසි ඉගැන්වීමේ ඒකකය - මාකඳුර පරිශ්‍රය

## 23.1 හැඳින්වීම

මාකඳුර පරිශ්‍රයේ පිහිටි පීඨ දෙකෙහි පළමු දෙවන සහ තෙවන වසර සිසුන් සඳහා ඉංග්‍රීසි පාඨමාලා මෙම ඒකකය මගින් පවත්වනු ලැබේ. කෘෂිකර්ම හා වැවිලි කළමනාකරණ පීඨයේ පළමු වසර සිසුන් සඳහා " අධ්‍යයන ඉංග්‍රීසි" පාඨමාලාව පැවැත්විණි. "විද්‍යාව සඳහා ඉංග්‍රීසි" පාඨමාලාව පශු සම්පත්, ධීවර හා පෝෂණ පීඨයේ පළමු වසර සිසුන් සඳහා පැවැත්විණි. "අධ්‍යයන ලේඛනය" පාඨමාලාව කෘෂිකර්ම හා වැවිලි කළමනාකරණ පීඨයේ දෙවන වසර සිසුන් සඳහා පැවැත්විණි. එසේම පශු සම්පත්, ධීවර හා පෝෂණ පීඨයේ දෙවන වසර සිසුන් සඳහා " අධ්‍යයන ඉංග්‍රීසි" පාඨමාලාව ද පවත්වන ලදී. ව්‍යාපාරික ඉංග්‍රීසි සහතික පත්‍ර පාඨමාලාව කෘෂිකර්ම හා වැවිලි කළමනාකරණ පීඨයේ දෙවන සහ තුන්වන වසර සිසුන් සඳහා පැවැත්විණි. විශ්වවිද්‍යාලයේ මාකඳුර පරිශ්‍රයේ පීඨ දෙක සඳහා කඩිනම් ඉංග්‍රීසි පාඨමාලා සාර්ථක අන්දමින් පවත්නා ලද අතර එය පීඨ දෙකෙහිම 2014 පෙබරවාරි සිට අප්‍රේල් දක්වා ක්‍රියාත්මක විය.

## 23.2 පවත්වන ලද පුහුණු හා දැනුවත් කිරීමේ වැඩ සටහන්

ඉංග්‍රීසි භාෂා ඉගැන්වීමේ ඒකකය මගින් 2014 ජූනි මස දී භාෂා කඳවුර පවත්වන ලදී. මෙය මාකඳුර පරිශ්‍රයේ ඉංග්‍රීසි ඉගැන්වීමේ ඒකකයේ කාර්ය මණ්ඩලය විසින් පවත්වන ලදී. මෙම එක් දින වැඩසටහන සඳහා පශු සම්පත්, ධීවර හා පෝෂණ පීඨයේ සිසුහු 50 දෙනෙක් සහභාගි වූහ. HETC ව්‍යාපෘතිය මගින් ප්‍රතිපාදන සපයන ලද විශ්වවිද්‍යාල ඉංග්‍රීසි භාෂා පරීක්ෂණය 2014 වර්ෂයේ දී පැවැත්විණි.

ලිඛිත පරීක්ෂණය සහ මාර්ගගත (Online) පරීක්ෂණය ජූලි මස දී ද කථන පරීක්ෂණය නොවැම්බර් මස දී ද පැවැත්විණි. වෙනත් විශ්වවිද්‍යාල වලින් පැමිණි අචාර්යවරුන් සඳහා ඉංග්‍රීසි ඉගැන්වීමේ ඒකකය මගින් පහසුකම් සැපයිණි. HETC ව්‍යාපෘතිය මගින් සංවිධානය කරන ලද විෂයමාලා සංශෝධන වැඩමුළුව සඳහා මාකඳුර පරිශ්‍රයේ සියලු කාර්ය මණ්ඩලය සහභාගි විය. විෂය මාලාව සහ ඉගැනුම් ආධාරක UTEL තත්වයන්ට අනුව සැකසිණි. ඉංග්‍රීසි දින තරග සඳහා මාකඳුර පරිශ්‍රයේ පීඨ දෙකට අයත් සිසුහු සහභාගි වූහ .කඩිනම් ඉංග්‍රීසි පාඨමාලාව සඳහා බඳවා ගන්නා ලද උපදේශකයන් ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීම පිළිබඳ සමායෝජක විසින් පුහුණුවක් ලබා දෙන ලදී. එසේම ඉගැන්වීමේ ක්‍රමවේදය පිළිබඳව ද සාකච්ඡා කිහිපයක් පවත්වමින් දැනුවත් කෙරිණි.

එසේම කාර්ය මණ්ඩලයේ දැනුම හුවමාරු කරගැනීමේ අදහසින් නියමිත රැස්වීම් පැවැත්විණි. e-learning මගින් ඉංග්‍රීසි සහතික පත්‍ර පාඨමාලාවේ iv වන ශිෂ්‍ය කණ්ඩායම 2014 ඔක්තෝබර් මස ආරම්භ කෙරිණි. මේ සඳහා සිසුහු 15 දෙනෙක් සහභාගි වූහ.

## 23.3 කාර්යය මණ්ඩල තත්වය

මාකඳුර ඉංග්‍රීසි භාෂා ඉගැන්වීමේ ඒකකයේ එක් ස්ථිර ඉංග්‍රීසි උපදේශිකාවක් සහ තාවකාලික ඉංග්‍රීසි උපදේශකවරු හතරදෙනෙකුගෙන් සමන්විත වේ. එසේම එක් බාහිර ඉංග්‍රීසි උපදේශකවරයෙකුගේ සේවය ද ලබා ගැනේ. ඊට අමතරව පරිගණක යෙදුම් සහකාරවරයෙක් සහ කම්කරු ශ්‍රේණියේ සේවක මහතෙක් සිටිති.

මෙම පරිගණක යෙදවුම් සහකාර තනතුර සහ කම්කරු තනතුර සඳහා රාජකාරි ලැයිස්තුවක් (Duty List ) සකසා දී ඇති අතර එය ලේඛකාධිකාරී කාර්යාලයේ උපදෙස් පරිදි සිදුවිණි.

## 23.4 ගතවූ වර්ෂයේ ප්‍රගතිය

පීඨ මට්ටමින් ඉංග්‍රීසි දින තරග පවත්වන ලද අතර එමඟින් විශ්වවිද්‍යාල මට්ටමින් තරග සඳහා ඉදිරිපත් වීමට ශිෂ්‍යයන් උනන්දු කරවීම සිදු විය. මැයි මස දී විශ්වවිද්‍යාල මට්ටමේ තරග පැවැත්විණි. මෙම තරගයේදී මෙම සිසුන් හට ස්ථානයක් ලබා ගැනීමේ හැකියාව ලැබුණි. UTEL සහතික පත්‍ර ප්‍රදානය ගලධාරී හෝටලයේ දී ජුනි මස දී පැවැත්විණි. සියලු ඉංග්‍රීසි වැඩසටහන් සාර්ථකව පැවැත්විණි. e-learning මඟින් ඉංග්‍රීසි ඉගෙනීමේ සහතික පත්‍ර පාඨමාලාව තුන්වන ශිෂ්‍ය කණ්ඩායම සඳහා මාකඳුර පරිශ්‍රයේ දී පැවැත්විණි. කෘෂිකර්ම හා වැවිලි කළමනාකරණ පීඨයේ සිසුන් සඳහා ව්‍යාපාර ඉංග්‍රීසි සහතික පත්‍ර පාඨමාලාව පැවැත්විණි. උනන්දුවක් ඇති සිසුහු බොහොමයක් මේ සඳහා සහභාගි වී සාමර්ථ්‍යය ලැබූහ. ඉංග්‍රීසි ඉගැන්වීමේ ඒකකයේ ප්‍රධාන ප්‍රවිෂ්ඨය උපකුලපති මහාචාර්ය එස් ජේ බී ඒ ජයසේකර මහතා අතින් උත්සවාකාරයෙන් විවෘත විය. එදිනම e-learning පාඨමාලාවේ සහතිකපත් ප්‍රදානයද සිදු කෙරිණි. කෘෂිකර්ම හා වැවිලි කළමනාකරණ පීඨයේ විෂයමාලා සංශෝධන රැස්වීම සඳහා සමායෝජක සහභාගි විය. නව ඉංග්‍රීසි විෂය මාලාවක් සැලසුම් කරන අද අතර එය පීඨයේ සංශෝධිත විෂය මාලාව සමග අනුමත විය.

## 23.5 බාධාවන්

ඉංග්‍රීසි ඉගැන්වීමේ අංශය සඳහා ස්ථිර කාර්ය මණ්ඩලයේ හිඟය ප්‍රධාන බාධාවක් ලෙස පෙන්වා දිය හැකිය.

## 23.6 යෝජනා

මාකඳුර පරිශ්‍රයේ ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීමේ ඒකකය සඳහා ස්ථිර අචාර්ය මණ්ඩලය බඳවා ගැනීමේ අවශ්‍යතාවය අවධාරණය කෙරේ. අංශයේ උපදේශකයින් සඳහා තාක්ෂණික උපකරණ භාවිතය පිළිබඳව අවබෝධයක් ලබාදිය යුතුය. එය e learning වැඩසටහන සඳහා අවශ්‍ය සාධකයකි.

# 24. වෛද්‍ය මධ්‍යස්ථානය

වයඹ විශ්වවිද්‍යාලයේ වෛද්‍ය මධ්‍යස්ථාන දෙකක් ක්‍රියාත්මක වේ. එයින් එකක් කුලියාපිටිය පරිශ්‍රයේ ස්ථාපිත වී ඇති අතර අනෙක මාකඳුර පරිශ්‍රයේ ස්ථාපනය කර ඇත. මෙමගින් 2014 වර්ෂය තුළ දී සෞඛ්‍ය ප්‍රවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කෙරිණිග 2013 වර්ෂයේ මෙන්ම 2014 වර්ෂයේදීද කුලියාපිටිය පරිශ්‍රයේ කාර්ය මණ්ඩලය සාත්තු සේවකයකු, මහජන සෞඛ්‍ය පරීක්ෂකවරයකු, ඖෂධවේදියෙක=, ලසු ලේඛිකාවක සහ කම්කරුවෙකු ගෙන් සමන්විත විය. මාකඳුර පරිශ්‍රයේද ලසු ලේඛිකා තනතුර හැර අනෙකුත් තනතුරු සමානව ඇත.

**වෛද්‍ය පරීක්ෂණ**

විශ්වවිද්‍යාලයීය වෛද්‍ය නිලධාරී විසින් අලුතෙන් පත්කරන ලද කාර්ය මණ්ඩලයේ සහ සේවා දීර්ඝ කිරීම් අවශ්‍ය වන කාර්ය මණ්ඩලය සඳහා වෛද්‍ය නිර්දේශයන් ලබාදීම සිදු විය.

සුළු අසනීප සඳහා කාර්යමණ්ඩලයට සහ ශිෂ්‍ය ප්‍රජාවට ප්‍රතිකාර කිරීම වෛද්‍ය මධ්‍යස්ථානය මගින් සිදු විය.විශේෂ වෛද්‍ය අවධානයක් අවශ්‍යවන අය සඳහා කුලියාපිටිය මූලික රෝහල වෙත යොමු කිරීම සිදු විය.

2014 වර්ෂය තුළ සෞඛ්‍ය ප්‍රවර්ධන වැඩසටහන් බොහොමයක් සිදු කෙරිණි.

1. බෝ නොවන රෝග සම්බන්ධයෙන් දැනුවත් සහ සුවනාරි සායනයන් පැවැත්වීම
2. දඩාවතේ යන සුනඛයින් වන්ධ්‍යාකරණයට ලක් කිරීම
3. මදුරු මර්ධන වැඩසටහන්

සාමාන්‍යයෙන් 2014 වර්ෂය තුළ කුලියාපිටිය සහ මාකඳුර පරිශ්‍රයන්හී සීමාවන්ට යටත්ව කණ්ඩායමක් ලෙස සමස්ත විශවවිද්‍යාල ප්‍රජාව සඳහාම උපකාර කිරීමට වෛද්‍ය නලධාරී ඇතුළු කණ්ඩායමට හැකියාව ලැබුණි

## 25. පුනරාවර්තන වියදම් විස්තර

| විෂය | 2013<br>රු. | 2014<br>රු. |
|---|---|---|
| අ. පුද්ගල වැටුප් හා වේතන | 386,682,763 | 467,368,504 |
| ආ. ගමන් වියදම් | 1,762,597 | 3,691,942 |
| ඇ. සැපයීම් | 30,631,815 | 35,804,775 |
| ඈ. නඩත්තු | 9,551,845 | 12,219,804 |
| ඉ. කොන්ත්‍රාත් සේවා | 114,608,404 | 120,510,792 |
| ඊ. වෙනත් | 17,779,217 | 28,229,796 |
| **එකතුව** | **561,061,641** | **670,825,613** |

## 26. ප්‍රාග්ධන වියදම් තොරතුරු

| විෂය | 2013<br>රු. | 2014<br>රු. |
|---|---|---|
| අ. ගෘහභාණ්ඩ සහ කාර්යාලීය උපකරණ අත්පත්කර ගැනීම් | 53,389,781 | 123,843,857 |
| ආ. යන්ත්‍රෝපකරණ අත්පත්කර ගැනීම් | - | - |
| ඇ. ගොඩනැගිලි සහ සවිකිරීම් අත්පත්කර ගැනීම් | - | - |
| ඈ. ඉඩකඩම් අත්පත්කර ගැනීම් | 4,013,750 | 7,000,000 |
| ඉ. වෙනත් (පොත් සහ අනෙකුත් භාණ්ඩ) | 9,668,442 | 7,365,575 |
| **එකතුව** | **67,071,973** | **138,209,432** |

## 27. මූල්‍ය ප්‍රගතිය පිළිබඳ තොරතුරු (වියදම්)

| විෂය | 2014 වර්ෂයේ ප්‍රතිපාදන<br>රු. | 2014 වර්ෂය වියදම<br>රු. | ඉතිරිය /හිඟය<br>රු. |
|---|---|---|---|
| අ. පුනරාවර්තන (ව්‍යාපෘති හැර) | 708,000,000 | 670,825,613 | 37,174,387 |
| ආ. ව්‍යාපෘති හැර මූලධන | 222,675,000 | 177,786,902 | 44,888,098 |
| ඇ. ව්‍යාපෘති – දේශීය අරමුදල් | 455,000,000 | 441,144,104 | 13,855,896 |
| ඈ. ව්‍යාපෘති - විදේශීය අරමුදල් | 31,499,115 | 22,583,728 | 8,915,387 |
| **එකතුව** | **1417,174,115** | **1,312,340,347** | **104,833,768** |

## 28. මූල්‍ය ප්‍රගතිය පිළිබඳ තොරතුරු (උපයන ලද ආදායම්)


| ආදායම් ප්‍රභවය | 2014 වර්ෂයේ ප්‍රතිපාදන රු. | 2014 වර්ෂයේ එකතුව රු. | ඌනතාවය/අතිරික්තය රු. |
|---|---|---|---|
| අ. උපාධිඅපේක්ෂක අධ්‍යයන | - | 7,590,250 | - |
| ආ. පශ්චාද් උපාධි අධ්‍යයන | - | 14,210,507 | - |
| ඇ. උපදේශන | - | - | - |
| ඈ. අනෙකුත් | - | 64,598,889 | - |
| **එකතුව** | **-** | **86,399,646** | **-** |

## 29. 2014 - මූල්‍ය ක්‍රියාකාරීත්ව විශ්ලේෂණය

| විෂය | සමීකරණය | එක් ශිෂ්‍යයෙකු සඳහා වියදම රු. |
|---|---|---|
| අ. ඒක ශිෂ්‍ය පුනරාවර්තන වියදම (RE) | ඒක ශිෂ්‍ය පුනරාවර්තන වියදම් / ශිෂ්‍ය සංඛ්‍යාව | 234,882.92 |
| ආ. ඒක ශිෂ්‍ය ප්‍රාග්ධන වියදම් (CE) | ඒක ශිෂ්‍ය ප්‍රාග්ධන වියදම් / ශිෂ්‍ය සංඛ්‍යාව | 48,392.66 |
| **එකතුව** | | **283,275.58** |

### 2010 - 2014 තුළ ඒක ශිෂ්‍ය පිරිවැය පීඨ මට්ටමින් (මහපොළ සහ ශිෂ්‍යාධාර ගෙවීම් ද ඇතුළුව)

| පීඨය | 2010 | 2011 | 2012 | 2013 | 2014 |
|---|---|---|---|---|---|
| කෘෂිකර්ම හා වැවිලි කළමනාකරණ පීඨය | 256,350.77 | 288,119.98 | 336,214.07 | 331,148.20 | 331,530.51 |
| ව්‍යවහාරිකවිද්‍යා පීඨය | 250,292.34 | 270,115.82 | 323,446.62 | 312,817.53 | 317,772.87 |
| ව්‍යාපාර අධ්‍යයන හා මූල්‍ය පීඨය | 163,537.26 | 178,654.05 | 208,554.66 | 195,487.07 | 171,190.70 |
| පශු සම්පත්, ධීවර හා පෝෂණ පීඨය | 295,012.88 | 322,380.81 | 374,896.40 | 349,456.13 | 365,408.97 |



## 30. ව්‍යාපෘති පිළිබඳ විස්තර (දේශීය අරමුදල්)

| නම සහ තොරතුරු | ණය/ප්‍රතිපාදන | අරමුදල් ප්‍රභවය | මුළු පිරිවැයේ එකතුව රු. |
|---|---|---|---|
| දේශන ශාලා ( II කොටස – I අදියර සහ II කොටස – II අදියර ) ව්‍යවහාරිකවිද්‍යා පීඨය, කුලියාපිටිය | - | ශ්‍රී ලංකා රජය | 118,200,000 |
| දේශන ශාලා ( II කොටස – I අදියර සහ II කොටස – II අදියර ) පශු සම්පත්, ධීවර හා පෝෂණ පීඨය | - | ශ්‍රී ලංකා රජය | 97,000,000 |
| වෛද්‍ය මධ්‍යස්ථානය ෙ II අදියර - කුලියාපිටිය | - | ශ්‍රී ලංකා රජය | 17,500,000 |
| වෛද්‍ය මධ්‍යස්ථානය I අදියර - මාකඳුර | | | 7,500,000 |
| දේශන ශාලා අදියර I – ව්‍යාපාර අධ්‍යයන හා මූල්‍ය පීඨය, කුලියාපිටිය | - | ශ්‍රී ලංකා රජය | 165,000,000 |
| අධ්‍යයන කාර්යය මණ්ඩලය සඳහා කේවල නේවාසිකාගාර, මාකඳුර | - | ශ්‍රී ලංකා රජය | 49,000,000 |
| අධ්‍යයන කාර්යය මණ්ඩලය සඳහා කේවල නේවාසිකාගාර, කුලියාපිටිය | - | ශ්‍රී ලංකා රජය | 49,000,000 |
| දේශන ශාලා අදියර II - කෘෂිකර්ම හා වැවිලි කළමනාකරණ පීඨය, මාකඳුර | - | ශ්‍රී ලංකා රජය | 125,000,000 |
| නේවාසිකාගාර අදියර IV - කුලියාපිටිය | - | ශ්‍රී ලංකා රජය | 69,000,000 |
| නේවාසිකාගාර අදියර V - මාකඳුර | - | ශ්‍රී ලංකා රජය | 69,000,000 |
| නේවාසිකාගාර අදියර VI - මාකඳුර | - | ශ්‍රී ලංකා රජය | 69,000,000 |
| මාකඳුර පරිශ්‍රයේ ප්‍රවේශ මාර්ගය | - | ශ්‍රී ලංකා රජය | 23,400,000 |
| ක්‍රීඩාපිටිය වැඩිදියුණු කිරීම්, කුලියාපිටිය | - | ශ්‍රී ලංකා රජය | 50,000,000 |
| පීඨ ගොඩනැගිල්ල III අදියර – පශුසම්පත්, ධීවර හා පෝෂණ පීඨය- මාකඳුර | - | ශ්‍රී ලංකා රජය | 169,500,000 |
| වෛද්‍ය මධ්‍යස්ථානය අදියර II - මාකඳුර | - | ශ්‍රී ලංකා රජය | 17,500,000 |
| දේශන ශාලා අදියර III - ව්‍යවහාරිකවිද්‍යා පීඨය, කුලියාපිටිය | - | ශ්‍රී ලංකා රජය | 367,000,000 |
| පරිපාලන ගොඩනැගිල්ල අදියර II කුලියාපිටිය | - | ශ්‍රී ලංකා රජය | 100,000,000 |
| ගෘහස්ථ ක්‍රීඩාංගණය | - | ශ්‍රී ලංකා රජය | 250,000,000 |
| ආපන ශාලා I අදියර කුලියාපිටිය | - | ශ්‍රී ලංකා රජය | 45,000,000 |
| ශ්‍රවණාගාරය | - | ශ්‍රී ලංකා රජය | 205,000,000 |
| නැනෝ තාක්ෂණ විද්‍යාගාරය | - | ශ්‍රී ලංකා රජය | 30,000,000 |

# 31. ව්‍යාපෘති වියදම් තොරතුරු (දේශීය අරමුදල්)

| නම | පිරිවැයේ එකතුව රු. | 2013 වියදම රු. | 2014 වර්ෂයේ වියදම රු. | 31.12.2014 වන විට මුළු වියදම | භෞතික ප්‍රගතිය % |
|---|---|---|---|---|---|
| **ඉදිකිරීම් ව්‍යාපෘති ඉදිරියට ගෙන ඒම** | | | | | |
| පීඨ ගොඩනැගිල්ල – දෙවන අදියර (පළමු සහ දෙවන කොටස) ව්‍යවහාරික විද්‍යා පීඨය - කුලියාපිටිය | 118,200,000 | 2,849,595 | 47,284,970 | 50,134,565 | 100% |
| ව්‍යාපාර අධ්‍යයන හා මූල්‍ය පීඨය - අදියර ෂ | 165,000,000 | 27,775,426 | | 96,242,202 | 100% |
| වෛද්‍ය මධ්‍යස්ථානය අදියර I - මාකඳුර | 7,500,000 | - | 2,964,679 | 8,142,314 | 100% |
| වෛද්‍ය මධ්‍යස්ථානය දෙවන අදියර- කුලියාපිටිය | 17,500,000 | 4,013,960 | 94,548 | 5,965,424 | 100% |
| කේවල කාර්යය මණ්ඩල නේවාසිකාගාර - අධ්‍යයන, කුලියාපිටිය | 49,000,000 | 1,891,645 | 2,161,645 | 12,586,811 | 75% |
| ප්‍රවේශ මාර්ගය මාකඳුර | 23,400,000 | 15,618,632 | 4,199,396 | 19,818,028 | 100% |
| කේවල කාර්යය මණ්ඩල නේවාසිකාගාර අධ්‍යයන, මාකඳුර | 49,000,000 | 16,042,762 | | 21,267,670 | 100% |
| පීඨ ගොඩනැගිල්ල අදියරII – කෘෂිකර්ම හා වැවිලි කළමනාකරණ පීඨය - මාකඳුර | 125,000,000 | 21,789,729 | 21,480,880 | 147,599,501 | 100% |
| පරිපාලන සංකීර්ණය - කුලියාපිටිය | - | - | 3,255,000 | 88,568,297 | 100% |
| නේවාසිකාගාර ව්‍යාපෘතිය අදියර සඩ - කුලියාපිටිය | 69,000,000 | 18,642,177 | 8,718,999 | 50,217,169 | 100% |
| නේවාසිකාගාර ව්‍යාපෘතිය පස්වන අදියරල හයවන අදියර - මාකඳුර | 69,000,000 | 16,067,689 | 32,068,475 | 70,125,622 | 100% |
| කුලියාපිටිය ක්‍රීඩා භූමියේ තණකොළ වැවීම හා වෙනත් වැඩි දියුණු කිරීම් | 50,000,000 | 7,578,665 | 3,132,118 | 22,925,024 | 65% |
| පීඨ ගොඩනැගිල්ල් පශුසම්පත්, ධීවර හා පෝෂණ පීඨය- මාකඳුර | 169,500,000 | 27,416,906 | 19,717,982 | 47,822,850 | - |
| ආපනශාලාව අදියර ෂ කුලියාපිටිය | 45,000,000 | - | 10,998,441 | 10,998,441 | 85% |
| **දැයට කිරුළ ව්‍යාපෘති** | | | | | |
| ක්‍රීඩාගාරය | 250,000,000 | 42,499,680 | 62,856,010 | 105,355,690 | 85% |
| ශ්‍රවණාගාරය | 205,000,000 | 24,776,786 | 206,121,681 | 230,898,467 | 100% |
| නැනෝ තාක්ෂණ විද්‍යාගාරය | 30,000,000 | 2,993,304 | 13,089,275 | 16,082,579 | 95% |
| **එකතුව** | | **229,956,956** | **441,144,099** | **1,004,750,653** | |

## 32. 2014 වර්ෂයේ යටිතල පහසුකම් ලැබීම් පිළිබඳ තොරතුරු

| යටිතල පහසුකම් තොරතුරු | වියදම රු. | භෞතික ප්‍රගතිය |
|---|---|---|
| පීඨ ගොඩනැගිල්ල - පශුසම්පත්, ධීවර හා පෝෂණ පීඨය<br>දෙවන කොටස (පළමු අදියර )<br>දෙවන කොටස (දෙවන අදියර) | 4,028,000 | 100% |
| පීඨ ගොඩනැගිල්ල - ව්‍යවහාරිකවිද්‍යා පීඨය<br>දෙවන කොටස (පළමු අදියර )<br>දෙවන කොටස (දෙවන අදියර) | 1,210,000<br>800,000 | 100% |
| පීඨ ගොඩනැගිල්ල - කෘෂිකර්ම හා වැවිලි කළමනාකරණ පීඨය, දෙවන කොටස | 21,480,000 | 100% |
| පීඨ ගොඩනැගිල්ල - ව්‍යාපාර අධ්‍යයන හා මූල්‍ය පීඨය පළමු කොටස | 13,400,400 | 100% |
| වෛද්‍ය මධ්‍යස්ථානය පළමු කොටස - මාකඳුර | 2,310,000 | 100% |
| වෛද්‍ය මධ්‍යස්ථානය දෙවන කොටස – කුලියාපිටිය | - | - |
| කේවල කාර්යය මණ්ඩල නේවාසිකාගාර - මාකඳුර | - | - |
| කේවල කාර්යය මණ්ඩල නේවාසිකාගාර - කුලියාපිටිය | - | - |
| නේවාසිකාගාර හතරවන අදියර, කුලියාපිටිය | 5,660,000 | 100% |
| නේවාසිකාගාර පස්වන අදියර, මාකඳුර | 19,290,000 | 100% |
| නේවාසිකාගාර හයවන අදියර, මාකඳුර | 12,780,000 | 100% |
| ප්‍රවේශ මාර්ගය මාකඳුර පරිශ්‍රයේ | 4,040,000 | 100% |
| ක්‍රීඩාපිටිය වැඩිදියුණු කිරීම, කුලියාපිටිය | 6,130,000 | 75% |
| පීඨ ගොඩනැගිල්ල තුන්වන අදියර<br>පශුසම්පත්, ධීවර හා පෝෂණ පීඨය<br>තුන්වන අදියර | 8,950,000 | 25% |
| වෛද්‍ය මධ්‍යස්ථානය II කොටස - මාකඳුර | 3,690,000 | 30% |
| දේශන ශාලා III කොටස - ව්‍යවහාරිකවිද්‍යා පීඨය කුලියාපිටිය | 40,670,000 | 20% |
| පරිපාලන ගොඩනැගිල්ල II අදියර | 19,210,000 | - |
| කැන්ටිම අදියර I කුලියාපිටිය | 10,990,000 | 85% |
| ක්‍රීඩාගාරය | 51,590,000 | 100% |
| ශ්‍රවණාගාරය | 168,180,000 | 100% |
| නැනෝ තාක්ෂණ විද්‍යාගාරය | 8,820,000 | 95% |

**1971 අංක 38 දරණ මුදල් පනතේ 13(6) ජේදයේ ප්‍රකාර ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලයේ 2014 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන හා වාර්ෂික ගිණුම් ප්‍රකාශන පිළිබඳ ව්‍යවස්ථාපිත වාර්තාව**

1. මෙම මූල්‍ය ප්‍රකාශය 1978 අංක 16 දරණ විශ්වවිද්‍යාල පනතේ 106(1) සහ 107(බී) ජේදයන්ට හා කලින් කල නීතිගත කරන ලද සංශෝධනවලට හා 1971 අංක 38 දරණ මුදල් පනතට අනුව පිළියෙල කොට ඉදිරිපත් කරනු ලැබේ.

   (i) ගිණුම් ප්‍රකාශන ඉදිරිපත් කිරීම හා අර්ථ නිරූපනය කිරීම සංගතතාවක් පවත්වා ගනිමින් හා රාජ්‍ය අංශයේ ආයතන සඳහා වූ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත හා විශ්වවිද්‍යාලයේ වාර්ෂික ගිණුම් වාර්තා ඉදිරිපත් කිරීමේදී සාමාන්‍යයෙන් පිළිපදිනු ලබන පොදුවේ පිළිගත් පරිචයන්ට අනුකූලව මෙම ගිණුම් අර්ථ නිරූපනය හා ඉදිරිපත් කිරීම සිදු කොට ඇත.

**අ <u>මූල්‍ය හෙළිදරව්ව</u>**

(1) **රජයේ ප්‍රතිපාදන**

| | රු. | 2014 | 2013 |
|---|---|---|---|
| පුනරාවර්තන වියදම් සඳහා රජයේ ප්‍රතිපාදන | රු. | 683,346,522 | 536,532,163.00 |
| මහපොළ ශිෂ්‍යත්ව ගෙවීම් සඳහා රජයේ ප්‍රතිපාදන | රු. | 26,053,650 | 16,271,250.00 |
| ශිෂ්‍යාධාර ගෙවීම් සඳහා රජයේ ප්‍රතිපාදන | රු. | 13,981,700 | 16,145,800.00 |
| මූලධන101 පුනරුත්තාපන වැඩසටහන | රු. | 2,773,842 | 33,800,000.00 |
| මූලධන 102 වත්කම් අත්පත් කර ගැනීම | රු. | 37,500,000 | 65,300,000.00 |
| මූලධන 103 ස්ථිර ඉදිකිරීම් | රු. | 142,575,000 | 255,250,000.00 |
| තොරතුරු තාක්ෂණය සඳහා විශේෂ මූලධන ප්‍රතිපාදන | රු. | 443,000,000 | 800,000.00 |
| වෙනත් විශේෂ ප්‍රතිපාදන | රු. | 25,324,867 | 800,000 |
| **එකතුව** | රු. | **1,374,555,581** | **924,099,213** |

(2) 2014 වර්ෂයේ දී ආදායම ඉක්මවා ගිය වියදම වූ රු. (101,915,818.73) 2013 වර්ෂයේ දී රු. (135,852,594.55). මෙය ප්‍රධාන වශයෙන්ම ගිණුම්කරණ ක්ෂය වීම නිසා සිදුව ඇත.

(3) පසුගිය වසරේ විශ්වවිද්‍යාල කාර්ය මණ්ඩලය සඳහා ගෙවූ ණය හා අත්තිකාරම් මුදලින් අයකර ගත යුතු වූ රු. 45,663,554.94 මුදල මෙම වසරේදී රු. 27,861,660.21.

(4) 2013 වසරේදී රු. 39,391,173.23 වූ විශ්වවිද්‍යාලය මඟින් රැස් කරන ලද අරමුදල ආයෝජනයෙහි වටිනාකම ශේෂ පත්‍ර දිනය වන විට රු. 22,696,269.16 ක් විය.

(5) අභ්‍යන්තර ආදායම් ප්‍රභවය

| 2014 | 2013 රු. | වෙනස රු. | වෙනස ප්‍රතිශතයක් ලෙස % |
|---|---|---|---|
| 16,451,043.70 | 9,595,083.80 | 6,855,959.90 | 71.45% |

**a)** විශ්වවිද්‍යාලය මගින් පවත්වාගෙන යනු ලබන බැංකු ගිණුම්වල 2014.12.31 දිනට ශේෂයන් එදිනට අදාළ මුදල් පොත් සමඟ සසඳන ලද අතර ශේෂ තහවුරු කිරීම් විගණකාධිපති වෙත සෘජුවම යොමු කරන ලෙස අදාළ බැංකුවලට උපදෙස් දෙන ලදී. මෙම ශේෂයන් කෙටි කාලීන බැදීම්වලට සමාන වේ.

| **පශ්චාද් උපාධි පාඨමාලා** | | **2014** | **2013** |
|---|---|---|---|
| ව්‍යාපාර පරිපාලනපති පාඨමාලාව – ව්‍යාපාර අධ්‍යයන හා මූල්‍ය පීඨය | රු. | 10,304,590 | 7,940,000 |
| පශ්චාද් උපාධි ඩිප්ලෝමා - ව්‍යාපාර අධ්‍යයන හා මූල්‍ය | රු. | 3,905,917 | 9,642,200 |
| **බාහිර උපාධි පාඨමාලා** | | | |
| කෘෂිකර්ම කළමනාකරණ පාඨමාලාව – මාකඳුර | රු. | 7,590,250 | 5.470,000 |
| **ඩිප්ලෝමා පාඨමාලා** | | | |
| ඉංග්‍රීසි ඩිප්ලෝමාව | රු. | 7,848,133 | 9,753,200 |
| රක්ෂණ ඩිප්ලෝමාව – ව්‍යාපාර අධ්‍යයන හා මූල්‍ය පීඨය | රු. | 6,087,500 | 4,732,500 |
| රක්ෂණය පිළිබඳ උසස් ඩිප්ලෝමාව | රු. | 2,197,000 | 1,619,000 |
| **සහතික පත්‍ර පාඨමාලා** | | | |
| තොරතුරු තාක්ෂණය පිළිබඳ සහතික පත්‍ර – කුලියාපිටිය | රු. | 237,800 | 550,600 |
| බාහිර පරිගණක පාඨමාලා – මාකඳුර | රු. | 3,794,600 | 4,753,300 |
| **පර්යේෂණ ප්‍රතිපාදන** | | | |
| NSF ප්‍රතිපාදන | රු. | 8,924,055 | 3,697,000 |
| IUCN ව්‍යාපෘති | රු. | - | - |
| CARP ව්‍යාපෘති | රු. | 1,644,536 | - |
| SANDEE | රු. | 1,070,268 | - |
| U.G.C (P.G.R) | රු. | 755,066 | - |
| පර්යේෂණ ප්‍රතිපාදන | රු. | 3,593,312 | - |
| NCAS ප්‍රතිපාදන | රු. | 1,5000,000 | - |
| **අනෙකුත් ප්‍රතිපාදන** | | | |
| IDRC | රු. | 17,282,354 | 20,904,248 |
| **කාර්ය මණ්ඩල ක්‍රියාකාරකම්** | රු. | 2,000,000 | - |
| WINC | රු. | 7,664,325 | - |
| **එකතුව** | රු. | **86,399,646** | **69,062,048** |

**b)** ශේෂ පත්‍රයේ ගබඩා තොග ලෙස දක්වා ඇති ශේෂ වන රු. 22,958,427.26 ගබඩා තොග භෞතික සත්‍යාපනයෙන් ලබාගත් ශේෂය වන අතර අතිරික්ත හා ඌන ශේෂයන් තොග ගැලපුම් ගිණුමට ගලපන ලදී. තොග සත්‍යාපනය වත්කම්වල හිමිකම පැවැත්ම හා වටිනාකම අනුව ගණනය කළ අතර තොග වෙනුවෙන් විශ්වවිද්‍යාලයේ පවත්වාගෙන යන ගිණුම් ලේඛන සමඟ සසදන ලදී.

**c)** මූලධන කෙරීගෙන යන වැඩ ගිණුමෙහි 2014.12.31 දිනට ශේෂ පත්‍රයේ සඳහන් වන රු. 606,404,460.49 අගයන ලද්දේ ශ්‍රී ලංකා ගණකාධිකරණ ප්‍රමිත අනුවය.

**d)** පොදු සංචිත ගිණුමේ 2014.12.31 දිනට ශේෂය රු. 948,026,343 ක් වන අතර 2013 වර්ෂයේදි රු. 846,625,186.66 කි. මෙය 2014 වර්ෂයෙන් වෙන් කළ විශ්‍රාම පාරිතෝෂික හා ස්ථාවර වත්කම් ක්ෂය වීම් පොදු සංචිතයට ගැලපීමේ ප්‍රතිඵලයක් ලෙස දැක්විය හැක.

කෙසේ වෙතත් වාර්ෂික ගිණුම් වාර්තාවලට ස්ථාවර වත්කම් ක්ෂය කිරීමේ සංකල්පය යොදා ගැනීම වි.වි.ප්‍ර.කො. අංක 649 දරණ 05.10.1995 දිනැති චක්‍රලේඛය මගින් හඳුන්වාදෙන ලද අතර 2013 වර්ෂයේ ස්ථාවර වත්කම් ක්ෂය ගැලපීම රු. 130,977,795.83 කි.

**e)** 2014.12.31 දිනට විශ්‍රාම පාරිතෝෂික දීමනා වෙන් කිරීමට රු. 89,904,407.50 ක් වන අතර එය විශ්‍රාම පාරිතෝෂික දීමනා පිළිබඳ පනත හා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ උපදෙස් අනුව වෙන් කර ඇත.

### ආ) <u>අයවැය පාලනය</u>

වැඩසටහන් අයවැය ලේඛණය 2014 වර්ෂයේ දි ද ඵලදායි කළමනාකරණ උපක්‍රමයක් ලෙස භාවිත කරන ලදී.

### ඇ) <u>දේපල, පිරියත හා කාර්යාලයීය උපකරණ පිළිබඳ ස්ථාවර වත්කම් ලේඛනය</u>

මෙම ස්ථාවර වත්කම් ලේඛන පිළියෙල කිරීම ක්‍රියාත්මක වෙමින් පවතී.

### ඈ) <u>පාලන ගිණුම් සැසඳිම</u>

උපලේඛන හා සියලුම පාලන ගිණුම් සසඳන ලද අතර එම සසඳන ලද උපලේඛන ගිණුම් වාර්තා සමඟ ඉදිරිපත් කර ඇත.

### පොදු කරුණු

අවසාන වශයෙන් 2014 වර්ෂය තුළ විශ්වවිද්‍යාලයට පාලනය කළ නොහැකි කපා හැරීම් සීමා කිරීම් හා මිල උච්චාවචනයන් වැනි දුෂ්කරතා යටතේ වැඩකටයුතු සිදුකරගෙන යාමට සිදු වූ නමුත් එම බාධා මැඩගෙන 2014 වර්ෂයට අදාළ අධ්‍යයන හා අනධ්‍යයන සැලසුම්වල සාර්ථකත්වය ළඟාකර ගත් බව දන්වනු කැමැත්තෙමි.

මහාචාර්ය එස්.ජේ.බී.ඒ.ජයසේකර
උපකුලපති
වයඹ විශ්වවිද්‍යාලය
18 පෙබරවාරි 2014

# 2014 දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා මූල්‍ය තත්ත්වය

රු ' 000

| | සටහන | 2014 දෙසැම්බර් 31 දිනට | | 2013 දෙසැම්බර් 31 දිනට | |
|---|---|---|---|---|---|
| **වත්කම්** | | | | | |
| **ජංගම වත්කම්** | | | | | |
| බැංකු ගිණුම් ශේෂය | **1** | 95,444 | | 59,274 | |
| ඉතිරිකිරීම් තැන්පත් | **2** | 919 | | 376 | |
| වෙළඳ හා වෙනත් ලැබීම් | **3** | 1,852 | | 1,088 | |
| වට්ටෝරුගත/ගබඩාගත | **4** | 22,958 | | 22,729 | |
| ඉදිරියට කළ ගෙවීම් | | 2,872 | | 2,151 | |
| කාර්යය මණ්ඩල අත්තිකාරම් | **5** | 387 | | 595 | |
| මූලධන අත්තිකාරම් | **6** | 144,650 | | 173,754 | |
| සේවා සහ සැපයුම් සඳහා අත්තිකාරම් | **7** | 884 | | 2,252 | |
| අනෙකුත් ජංගම වත්කම් | **8** | 6894 | | 6,723 | |
| | | | 276,865 | | 268,942 |
| **ජංගම නොවන වත්කම්** | | | | | |
| දිගුකාලීන ආයෝජන | **9** | 39,391 | | 22,696 | |
| දේපල, පිරියත සහ උපකරණ | **10** | 1,156,324 | | 957,663 | |
| නොනිමි වැඩ | **11** | 606,404 | | 291,448 | |
| කාර්යය මණ්ඩල ණය | **12** | 45,247 | 1,847,366 | 27,267 | 1,299,074 |
| **වත්කම්වල එකතුව** | | | 2,124,231 | | 1,568,016 |
| **වගකීම්** | | | | | |
| **ජංගම වගකීම්** | | | | | |
| විවිධ ණය හිමියෝ | **13** | 12,231 | | 23,729 | |

| | | | | | |
|---|---|---|---|---|---|
| තැන්පත් | **14** | 1,153 | | 2,269 | |
| වියදම් ණය හිමියෝ | **15** | 18,208 | | 22,868 | |
| වෙනත් | **16** | 119,737 | 151,329 | 110,654 | 159,520 |
| **ජංගම නොවන වගකීම්** | | | | | |
| මූලධන - වැයවූ මූලධන ප්‍රතිපාදන | | 1,949,564 | | 1,631,610 | |
| මූලධන - වැයවූ ප්‍රතිපාදන / නොනිමි | | 606,404 | | 291,448 | |
| වැය නොවූ මූලධන ප්‍රතිපාදන | **17** | 12,754 | | 39 | |
| විශේෂ ප්‍රතිපාදන | | 200,790 | | 200,373 | |
| පරිත්‍යාග අරමුදල් | **18** | 763 | | 666 | |
| විශේෂ අරමුදල් | **19** | 26,533 | | 21,729 | |
| පාරිතෝෂික වෙන්කිරීම් | | 89,904 | 2,886,712 | 75,041 | 2,220,906 |
| **වගකීම්වල එකතුව** | | | **3,038,810** | | **2,380,426** |
| **ශුද්ධ වත්කම්වල එකතුව** | | | **(913,810)** | | **(812,410)** |
| ඒකාබද්ධ අරමුදල | | (948,026) | | (846,626) | |
| සංචිත | | 34,216 | (913,810) | 34,216 | (812,410) |
| **ශුද්ධ වත්කම්/කොටස්වල එකතුව** | | | **(913,810)** | | **(812,410)** |

| | | |
|---|---|---|
| ................................ | ................................. | ....................................... |
| (මහාචාර්ය එස් ජේ බී ඒ ජයසේකර) | (ජී පියරත්න මයා) | (ඩී ඒ යූ ධර්මදාස මයා) |
| උපකුලපති | ලේඛකාධිකාරී | වැඩ බලන මූල්‍යාධිකාරී |

**2014 දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා මූල්‍ය කාර්යය සාධන ප්‍රකාශනය**

| **මෙහෙයුම් ආදායම** | **මෙම වර්ෂය** 2014 (රුපියල් '000) | **පසුගිය වර්ෂය** 2013 (රුපියල් '000) |
|---|---|---|
| පුනරාවර්තන වියදම් සඳහා රජයේ ප්‍රතිපාදන | 683,346 | 536,532 |
| ශිෂ්‍යාධාර සඳහා රජයේ ප්‍රතිපාදන | 13,982 | 16,146 |
| මහපොළ ශිෂ්‍යත්ව සඳහා රජයේ ප්‍රතිපාදන | 26,053 | 16,271 |
| පුනරාවර්තන ප්‍රතිපාදන (පුනරුත්තාපන ස්වභාවයේ) | 2,774 | 1,119 |
| ආයෝජන පොලිය | 1,506 | 34 |
| කාර්ය මණ්ඩල ණය පොලිය | 1,227 | 1,057 |
| දේපල කුලිය | 1,116 | 808 |
| පැරණි භාණ්ඩ අලෙවිය | 291 | 1,621 |
| එළදා විකිණීම | 504 | 642 |
| විවිධ ලැබීම් | 9,299 | 3,530 |
| ලියාපදිංචි ගාස්තු (උපාධි අපේක්ෂකයින්) | 2,325 | 1,730 |
| විභාග ගාස්තු (උපාධි අපේක්ෂකයින්) | 55 | 62 |
| පුස්තකාලයීය දඩ | 129 | 111 |
| **මෙහෙයුම් ආදායම් එකතුව** | **742,607** | **579,663** |
| **මෙහෙයුම් වියදම (ක්ෂයවීම් ඇතුළුව)** | | |
| පුද්ගල වැටුප් හා වේතන (සටහන 01) | 467,368 | 386,683 |
| ගමන් වියදම් | 3,692 | 1,763 |
| සැපයුම් හා පාරිභෝජන | 35,805 | 30,632 |
| නඩත්තු | 15,220 | 9,552 |
| ගිවිසුම්ගත සේවා | 120,511 | 114,608 |
| ක්ෂයවීම් | 130,887 | 120,963 |
| අනෙකුත් මෙහෙයුම් වියදම් | 28,230 | 17,779 |
| මහපොළ හා ශිෂ්‍යාධාර ගෙවීම් | 40,035 | 32,417 |
| පුනරුත්තාපන වියදම් (පුනරාවර්තන ස්වභාවයේ) | 2,774 | 1,119 |

| | | |
|---|---|---|
| **සමස්ත මෙහෙයුම් වියදම** | **844,522** | **715,516** |
| **ශුද්ධ අතිරික්තය (ඌනතාව) ගත වූ කාලය තුළ** | | **(135,853)** |
| | | |
| ඉදිරියට ගෙනා පෙර වර්ෂ ශේෂය | 846,626 | (712,426) |
| වර්ෂයේ ඌනතාව | 101,915 | (135,853) |
| එකතු කිරීම් - පෙර වර්ෂයේ ආදායම් | | |
| වෙනත් ගැලපීම් | 515 | 1,653 |
| අඩු කිරීම් - පෙර වර්ෂයේ වියදම් | | |
| වෙනත් ගැලපීම් | | |
| **ඉ/ගෙ පොදු සංචිතය** | **948,026** | (**846,626**) |
| | | |
| සටහන 01 | | |
| වැටුප් හා වේතන | 182,270 | 173,101 |
| අතිකාල හා නිවාඩු දින ගෙවීම් | 13,439 | 11,517 |
| වෙනත් දීමනා | 200,814 | 144,539 |
| විශ්‍රාම ප්‍රතිලාභ (වි.වි.අ.අ., සේ.නි.භා.අ., විශ්‍රාම වැටුප්, පාරිතෝෂික) | 70,845 | 57,526 |
| **සමස්ත පුද්ගල ගෙවීම්** | **467,368** | **386,683** |

.................................. .................................... ......................................

(මහාචාර්ය එස් ජේ බී ඒ ජයසේකර) (ජී පියරත්න මයා) (ඩී ඒ යූ ධර්මදාස මයා)

උපකුලපති ලේඛකාධිකාරී මූල්‍යාධිකාරී

# 2013 දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශය

| | 2014 දෙසැම්බර් 31 දිනට<br>රු ' 000 | 2012 දෙසැම්බර් 31 දිනට<br>රු ' 000 |
|---|---|---|
| **මෙහෙයුම් ක්‍රියාකාරීත්වයෙන් ලද මුදල් ප්‍රවාහය** | | |
| අතිරික්තය/(ඌනතාවය) සාමාන්‍ය ක්‍රියාකාරීත්වය | (101,915) | (135,853) |
| **එකතු කිරීම්: සංචලනය නොවන මුදල්** | | |
| ක්ෂය | 130,887 | 120,963 |
| පාරිතෝෂික වෙන්කිරීම් | 17,267 | 11,197 |
| පාරිතෝෂික ගෙවීම් | (2,404) | (2,927) |
| පෙර වර්ෂයේ ගැලපීම් - පෙර වර්ෂය වෙනුවෙන් ලද ආදායම් | 515 | |
| පෙර වර්ෂයේ ගැලපීම් - පෙර වර්ෂය වෙනුවෙන් කළ ගෙවීම් | | |
| තොගයේ වැඩිවීම්/අඩුවීම් | (229) | (5,213) |
| ණයගැතියෝ වැඩිවීම්/අඩුවීම් | (764) | (89) |
| කාර්යය මණ්ඩල ණය වැඩිවීම්/අඩුවීම් | (17,980) | (1,717) |
| කාර්යය මණ්ඩල අත්තිකාරම් වැඩිවීම්/අඩුවීම් | 208 | 372 |
| සැපයුම් සහ සේවා අත්තිකාරම් වැඩිවීම්/අඩුවීම් | (1,368) | (1,112) |
| ඉදිරියට කළ ගෙවීම් වැඩිවීම්/අඩුවීම් | (726) | (810) |
| අනෙකුත් ජංගම වත්කම් වැඩිවීම්/අඩුවීම් | (29,104) | (1,788) |
| විවිධ ණයහිමියෝ වැඩිවීම්/අඩුවීම් | 171 | 8,788 |
| තැම්පත් වැඩිවීම්/අඩුවීම් | (11,498) | (622) |
| වියදම් ණයහිමියෝ වැඩිවීම්/අඩුවීම් | 1,116 | 8,496 |
| අනෙකුත් ජංගම වගකීම් වැඩිවීම්/අඩුවීම් | 4,660 | 34,202 |
| **ශුද්ධ මෙහෙයුම් ක්‍රියාකාරීත්වයෙන් ලද මුදල් ප්‍රවාහය** | 9083 | 33,887 |
| **ශුද්ධ මෙහෙයුම් ක්‍රියාකාරීත්වයෙන් ලද මුදල් ප්‍රවාහය** | 46,969 | 33,887 |

| | | |
|---|---|---|
| **ආයෝජන ක්‍රියාකාරීත්වයේ මුදල් ප්‍රවාහය** | | |
| පිරියත හා උපකරණ මිලදී ගැනීම් | (329,548) | (361,310) |
| සීමිත අරමුදල් ආයෝජන | (16,625) | (5,854) |
| පරිත්‍යාග අරමුදල් | 97 | 270 |
| **ශුද්ධ ආයෝජන ක්‍රියාකාරීත්වයේ මුදල් ප්‍රවාහය** | (661,646) | (366,894) |

| | 2014දෙසැම්බර් 31 දිනට රු ' 000 | 2012දෙසැම්බර් 31 දිනට රු ' 000 |
|---|---|---|
| **මූල්‍ය ක්‍රියාකාරීත්වයේ මුදල් ප්‍රවාහය** | | |
| මූලධන ප්‍රතිපාදන - පුනරුත්තාපන හා වැඩිදියුණු කිරීම් | 37,500 | 32,000 |
| මූලධන ප්‍රතිපාදන - වත්කම් අත්පත්කර ගැනීම් | 142,575 | 65,300 |
| මූලධන ප්‍රතිපාදන - ස්ථිර ඉදිකිරීම් | 443,000 | 255,250 |
| විශේෂ ප්‍රතිපාදන | 8,600 | 1,800 |
| විශේෂ ලැබීම් | 16,725 | 9,199 |
| පුනරාවර්තන ස්වාභාවයේ ප්‍රාග්ධන ප්‍රදාන | 4804 | |
| CARP අරමුදල | (2774) | - |
| විශේෂ ප්‍රධාන | 417 | |
| **ශුද්ධ මූල්‍ය ක්‍රියාකාරීත්වයේ මුදල් ප්‍රවාහය** | **650,847** | **363,549** |
| **ශුද්ධ වැඩිවීම්/(අඩුවීම්)** | **36,170** | **30,542** |
| | **59,274** | **28,732** |
| | **95,444** | **59,274** |

| මුදල් සහ මුදල් සමාන දෑ පිළිබඳ විශ්ලේෂණය | 2014 දෙසැම්බර් 31 දිනට | 2012 දෙසැම්බර් 31 දිනට |
|---|---|---|
| මහජන බැංකුව කුලියාපිටිය - ගි. අ. 028100151586123 | 14,085 | 15,904 |
| මහජන බැංකුව මාකඳුර - ගි. අ. 100120000171 | 12,636 | 9,460 |
| මහජන බැංකුව මාකඳුර - ගි. අ. 100140000165 | 346 | 304 |
| ලංකා බැංකුව කුලියාපිටිය - ගි. අ. 0002874770 | 11,943 | 10,985 |
| ලංකා බැංකුව කුලියාපිටිය - ගි. අ. 00001473507 | 14,725 | 6,933 |
| ලංකා බැංකුව කුලියාපිටිය - ගි. අ. 0001473508 | 3,647 | 738 |
| ලංකා බැංකුව කුලියාපිටිය - ගි. අ. 0001473388 | 12,626 | 39 |
| මහජන බැංකුව මාකඳුර - ගි. අ. 100120000963 | 6,155 | 4,240 |
| මහජන බැංකුව මාකඳුර - ගි. අ. 100130041538 | 801 | 1,027 |
| මහජන බැංකුව මාකඳුර - ගි. අ. 100140044857 | 18,349 | 9,644 |
| මහජන බැංකුව මාකඳුර - ගි. අ. 137100230000165 | 131 | |
| එකතුව | 95,444 | 59,274 |

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
AUDITOR GENERAL'S DEPARTMENT

මගේ අංකය / எனது இல. / My No.: NW/PTB/WU/1/14/45
ඔබේ අංකය / உமது இல. / Your No.:
දිනය / திகதி / Date: 2015 සැප්තැම්බර් / 7 දින

උපකුලපති,

ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලය.

**ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලයේ 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 108 (1) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව.**

---

ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලයේ 2014 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 107 (5) උප වගන්තිය සහ 108 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. විශ්වවිද්‍යාල පනතේ 108 (1) උප වගන්තිය ප්‍රකාර විශ්වවිද්‍යාලයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. විශ්වවිද්‍යාල පනතේ 108 (2) උප වගන්තිය ප්‍රකාර විස්තරාත්මක වාර්තාවක් විශ්වවිද්‍යාලයේ උපකුලපති වෙත යථා කාලයේදී නිකුත් කරනු ලැබේ.

1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම.

---

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.



අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව, - இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை.- No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka
+94-11-2887028-34 +94-11-2887223 oaggov@sltnet.lk www.auditorgeneral.gov.lk

## 1.3 විගණකගේ වගකීම

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000 - 1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.
මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරී වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් තක්සේරු කිරීම් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් විශ්වවිද්‍යාලයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගැයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගැයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) හා (4) උපවගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

# 2. මූල්‍ය ප්‍රකාශන

## 2.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2014 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 2.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති

පොත් අගය ශූන්‍ය ලෙස පෙන්වා තිබු නමුත් විශ්වවිද්‍යාලයේ මෙහෙයුම් කාර්යයන් සඳහා තවදුරටත් යොදා ගනිමින් පැවති එකතුව රු. 54,793,397 ක් වටිනා ස්ථාවර වත්කම් විෂයයන් 04 ක් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 07 ප්‍රකාරව ප්‍රත්‍යාගණනය ක්‍ර සාධාරණ අගය පොත්වල දැක්වීමට කටයුතු කර නොතිබුණි.

### 2.2.2 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) රාජ්‍ය ප්‍රදාන ගිණුම් තැබීම හා රාජ්‍ය ප්‍රදාන මගින් ස්ථාපිත කර ඇති වත්කම් ක්‍රමක්ෂය කිරීම සම්බන්ධ ගිණුම්කරණ ප්‍රතිපත්ති විශ්වවිද්‍යාල විසින් හඳුනාගෙන නොතිබුණි. සමාලෝචිත වර්ෂය අවසානයට රාජ්‍ය ප්‍රදාන ප්‍රමාණය රු. 2,568,722,000 ක් වූ අතර, එය නියෝජනය වූ ජංගම නොවන වත්කම්වල ශුද්ධ අගය රු. 1,156,324,406 ක් විය.

(ආ) සමාලෝචිත වර්ෂයේදී මහාභාණ්ඩාගාරයෙන් වයඹ විශ්වවිද්‍යාලය සඳහා ලද මුළු ප්‍රාග්ධන මූල්‍ය ප්‍රදානය රු. 604,100,000 ක් වූ අතර, පුනරාවර්තන මූල්‍ය ප්‍රදානය රු.703,275,000 ක් විය. කෙසේ වුවද මූල්‍ය ප්‍රකාශ අනුව ප්‍රාග්ධන ප්‍රදානය රු. 624,675,000 ක් හා පුනරාවර්තන ප්‍රදානය රු. 682,700,000 ක් වූ අතර අයභාර ප්‍රදාන රු. 20,575,000 ක් ප්‍රාග්ධන ප්‍රදාන ලෙස ගිණුම් ගතකර තිබීම මෙම වෙනසට හේතු වී තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව හඳුනාගෙන තිබුණු පිරිවැය රු. 45,644 ක් වූ භාවිතයට ගත නොහැකි භාණ්ඩ සහ පිරිවැය රු. 1,708,108 ක් වූ පරිහරණයට නොගන්නා භාණ්ඩවල සාධාරණ අගය පෙන්නුම් කිරීම සඳහා අවශ්‍ය ගැලපීම් සිදුකර නොතිබුණි.

(ඈ) ඉදිකිරීම් නිමකර විධිමත් පරිදි විශ්වවිද්‍යාලයට භාරදී නොතිබූ මාකඳුර පරිශ්‍රයේ වූ ශිෂ්‍ය නේවාසිකාගාර ගොඩනැගිලි දෙක සඳහා විශ්වවිද්‍යාලය විසින් වැය කර තිබුණු රු. 5,341,038 ක මුදල ගොඩනැගිලි යටතේ ප්‍රාග්ධනිත කර තිබුණි.

(ඉ) භාණ්ඩ සමීක්ෂණ වාර්තා අනුව ප්‍රයෝජනයට ගත නොහැකි භාණ්ඩ ලෙස හඳුනාගත් පිරිවැය රු. 2,638,573 ක් වූ දේපල පිරියත හා උපකරණ අපහරණය කර තිබුණද එහි පිරිවැය හා සමුච්චිත ක්ෂය ප්‍රමාණය පොත්වලින් ඉවත් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඊ) ප්‍රාග්ධන වත්කම් පුනරුත්ථාපනය සහ වැඩිදියුණු කිරීම සඳහා වූ ප්‍රතිපාදන වශයෙන් සමාලෝචිත වර්ෂයේදී ලැබුණු රු. 37,500,000 ක් මූලධන ආධාර මුදලින් රු. 2,774,000 ක් පුනරාවර්තන කාර්යයන් සඳහා වැය කර තිබූ අතර එය පුනරාවර්තන වියදම් ලෙස ගිණුම්ගත කර තිබුණි.

(උ) විශ්වවිද්‍යාලය නමින් වූ රාජ්‍ය බැංකු දෙකක පැවති රු. 306,500 ක් වූ තැන්පතු හඳුනාගෙන ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඌ) 2012 වර්ෂයේදී ගබඩාවේ ඇතිව තිබුණු රු. 31,250 ක තොග ඌනතාවය හා ආරම්භ කිරීමට යෝජිත වූ එහෙත් ආරම්භ නොකළ ව්‍යාපාර පරිපාලනය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව සඳහා වැය කර තිබුණු රු. 144,448 ක මුදල ඇතුළුව මුළු එකතුව වූ රු. 175,698 ක් විධිමත් අනුමැතියකින් තොරව මුදල් කමිටු තීරණ පරිදි කපා හැර තිබුණි.

(එ) ශ්‍රී ලංකා කෘෂිකර්ම පර්යේෂණ ප්‍රතිපත්ති සහා පාඨමාලාව හා බාහිර පුහුණු පාඨමාලාව වෙනුවෙන් විශ්වවිද්‍යාලය විසින් වැය කර තිබූ පිළිවෙලින් රු. 38,114 ක්, රු. 61,215 ක් ලෙස එකතුව රු. 99,329 ක මුදල අදාළ පාඨමාලාවල වැයක් ලෙස ගිණුම්ගත නොකර විශ්වවිද්‍යාලයේ වැයක් ලෙස ගිණුම්ගත කර තිබුණි.

2.2.3 විගණනය සඳහා සාක්ෂි නොවීම

එකතුව රු. 1,111,768,027 ක් වූ ස්ථාවර වත්කම් සඳහා ඉඩම් ඔප්පු, පැවරුම් නියෝග, ස්ථාවර වත්කම් ලේඛන හා උපලේඛන යනාදී සාක්ෂි විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) වර්ෂ 03 සිට වර්ෂ 19 දක්වා කාලපරාසයක සිට පැවත එන කාර්ය මණ්ඩල ණය රු. 8,990 ක්, ආපදා ණය ශේෂය රු. 116,356 ක්, පුස්තකාල පොත් හා සඟරා මිලදී ගැනීමට ලබාදුන් අත්තිකාරම් රු. 470,597 ක් සහ ඉදිකිරීමේ අත්තිකාරම් රු. 2,486,208 ක් පියවීමට කටයුතු කර නොතිබුණි.

(ආ) වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන රු. 482,503 ක ගෙවිය යුතු මුදල් පියවීම සඳහා කටයුතු කර නොතිබුණි.

(ඇ) වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන වෙනත් වගකීම් විෂයයන් 06 ක එකතුව වූ රු. 719,550 ක්ද, ගෙවිය යුතු ගිණුම් ශේෂය තුළ වූ රු. 1,751,587 ක්ද සමාලෝචිත වර්ෂය අවසානයට ගිණුම් ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ඇ) 2006, 2008 හා 2009 වර්ෂයන්හිදී සහරා දෙකක් මිලදී ගැනීම සඳහා ලබාදී තිබූ අත්තිකාරම්වලින් රු. 307,045 ක් සමාලෝචිත වර්ෂය අවසාන වන විටද පියවාගෙන නොතිබුණි.

2.4 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ XIX පරිච්ඡේදයේ 4.1 ප්‍රකාරව හා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ 2013 අගෝස්තු 29 දිනැති අංක 12/2013 දරන චක්‍රලේඛය | I චක්‍රලේඛ විධිවිධානයන්ගෙන් බැහැරව නිල නිවාස පහසුකම් සැපයීම් වෙනුවෙන් ලේඛකාධිකාරීවරයාට හා පුස්තකාලාධිපතිවරයාට පාලක සභා තීරණයන් මත මාසිකව රු.10,000 බැගින් සමාලෝචිත වර්ෂයේදී රු. 220,000 ක දීමනාවක් ගෙවා තිබුණි. මෙවැනි දීමනාවක් රජයේ නිලධාරින්ට ගෙවීම සඳහා වූ අනුමැතියක් විගණනයට ඉදිරිපත් නොවුණි. |
| | II තවද විශ්වවිද්‍යාලයේ විධායක නිලධාරීන්ගේ නේවාසිකාගාරයේ පදිංචිව සිටීම හේතුවෙන් ලේඛකාධිකාරීවරයාගෙන් සමාලෝචිත වර්ෂයේදී රු.7,950 ක් අයකර තිබුණි. ඒ අනුව ලේඛකාධිකාරීවරයා කිසියම් මුදලක් ගෙවා විශ්වවිද්‍යාල පරිශ්‍රයේ ලැගුම් ගන්නේය යන සැකය විගණනයේදී බැහැර කළ නොහැක. |
| (ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | |
| (i) මුදල් රෙගුලාසි 271 (2) (අ) (ආ) | 2001 වර්ෂයේ සිට 2013 දෙසැම්බර් 31 දින දක්වා නෝගෙවන ලද රු.111,113 ක වැටුප් සම්බන්ධයෙන් රෙගුලාසි ප්‍රකාරව කටයුතු නොකර ජංගම වගකීම් ලෙස පෙන්වා තිබුණි. |
| (ii) මුදල් රෙගුලාසි 396 (ඇ) | වටිනාකම රු. 200,649 ක්වූ නිකුත් කරන ලද නමුත් ගෙවීම සඳහා ඉදිරිපත් නොකළ මාස 06 ක කාලය ඉක්ම වූ චෙක්පත් 16 ක් සම්බන්ධයෙන් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. |

| | |
|---|---|
| (ඇ) 2011 පෙබරවාරි 11 දිනැති අංක 02/2014 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛය | චක්‍රලේඛය මගින් පෙන්වාදී තිබූ ක්‍රමවේදය අනුගමනය නොකර වයඹ විශ්වවිද්‍යාලයේ කථිකාචාර්යවරුන් හා අනිකුත් නිලධාරීන් 157 දෙනෙකුට පර්යේෂණ දීමනාව ලෙස සමාලෝචිත වර්ෂයේදී රු. 24,238,719 ක් ගෙවා තිබුණි. මෙම දීමනාව රජයේ අනිකුත් ජොෂ්ඨ නිලධාරීන්ටද ගෙවිය හැකිවන සේ වැඩපිළිවෙලක් මෙම චක්‍රලේඛය මගින් යෝජනා කර තිබුණද එම යෝජනා ක්‍රමයේ කොන්දේසි නොතකා ඉතා ලිහිල් පදනමක් මත විශ්වවිද්‍යාල කාර්ය මණ්ඩලයට මෙම දීමනා ගෙවා ඇති බව නිරීක්ෂණය විය. |

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විශ්වවිද්‍යාලයේ කටයුතුවල මූල්‍ය ප්‍රතිඵලය රු. 101,915,000 ක ඌනතාවයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය රු. 135,853,000 ක ඌනතාවයක් විය. ඒ අනුව ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 33,938,000 ක වර්ධනයක් නිරීක්ෂණය විය.

### 3.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) මූල්‍ය කාර්යසාධනය

මූල්‍ය කාර්යසාධනය සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

**(i).** සමාලෝචිත වර්ෂයේ විශ්වවිද්‍යාලය විසින් උපයාගත් ආදායම සියයට 71 කින් වර්ධනය වී තිබුණද, එහි ඇතුළත් ආයෝජන ආදායම් ඉකුත් වර්ෂය සමඟ සැසඳීමේදී රු. 1,472,000 කින් වැඩිවී තිබූ අතර, එය ප්‍රතිශතය ලෙස සියයට 4,329 ක් විය. එසේම ආයෝජනවල වටිනාකම ඉකුත් වර්ෂය සමඟ සැසඳීමේදී සියයට 73 කින් වර්ධනය වී තිබුණි. මෙම තත්ත්වයට හේතුව් ඇත්තේ ඉකුත් වර්ෂයේදී විගණනයෙන් පෙන්වා දුන් පරිදි ජංගම ගිණුම්වල තිබූ අතිරික්ත ශේෂයන් කෙටි කාලීනව ආයෝජනය කර පොලී ආදායමක් උපයා ගැනීමේ ක්‍රමවේදයක් වර්ෂය තුළදී අනුගමනය කිරීම විය.

**(ii).** ඉකුත් වර්ෂය සමග සැසඳීමේදී සමාලෝචිත වර්ෂය තුළදී විශ්වවිද්‍යාලයේ මුළු වියදම සියයට 18 කින් වර්ධනය වී තිබුණි. වැටුප් හා වේතන, ගමන් වියදම් හා යැපීම් දීමනා, සැපයුම් හා පාරිභෝජන ද්‍රව්‍ය, කොන්ත්‍රාත් සේවා, අනිකුත් පුනරාවර්තන වියදම්, ශිෂ්‍යාධාර සහ නඩත්තු සේවා යන වියදම්හි රු.117,427,271 ක වර්ධනයක් නිරීක්ෂණය වූ අතර ඒවායේ ප්‍රතිශතය සියයට 5 ක සිට සියයට 109 ක් දක්වා වූ පරාසයක පැවතුණි. මෙම වියදම් වැඩිවීම තුළ නිලධාරීන්ට ගෙවා ඇති ගමන් වියදම්වල සැලකිය යුතු වර්ධනයක් ඇති වී තිබුණි.

(ආ) මූල්‍ය තත්ත්වය

මූල්‍ය තත්ත්වය සම්බන්ධයෙන් පහත නිරීක්ෂණ කරනු ලැබේ.

(i). සමාලෝචිත වර්ෂය අවසානයට ජංගම නොවන වත්කම් ඉකුත් වර්ෂය සමඟ සැසඳීමේදී සියයට 42 කින් වර්ධනයට දේපල පිරියත හා උපකරණවල වටිනාකම සියයට 20 කින් වැඩිවීම හා කෙරීගෙන යන වැඩවල වටිනාකම සියයට 108 කින් වැඩිවීම ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

(ii). ජංගම නොවන වගකීම් ඉකුත් වර්ෂය සමඟ සැසඳීමේදී සියයට 29 කින් වර්ධනය වී තිබූ අතර, ඉකුත් වර්ෂයේදී රු. 39,000 ක්වූ වැය නොවූ මුලධන ආධාර සමාලෝචිත වර්ෂයේදී රු. 12,754,000 ක් දක්වා වැඩි වී තිබුණි. එය යහපත් ප්‍රවණතාවයක් නොවන බව නිරීක්ෂණය විය.

(iii). සමුච්චිත අරමුදල දිගින් දිගටම හීන වෙමින් පැවති අතර, සමාලෝචිත වර්ෂය අවසානයට එය තවදුරටත් රු.මිලියන 101 කින් හීන වී තිබුණි. එහි ප්‍රතිශතය පෙර වර්ෂය සමඟ සැසඳීමේදී සියයට 11 ක් විය.

3.3 විශ්වවිද්‍යාලයට එරෙහිව ආරම්භ කර ඇති නෛතික සිද්ධි

විශ්වවිද්‍යාලය සමඟ 2012 වර්ෂයේදී රු. 27,000,952 ක කොන්ත්‍රාත් වටිනාකමක් මත කුලියාපිටිය පරිශ්‍රයේ තනි පුද්ගල නේවාසිකාගාරයක් ඉදිකිරීම සඳහා ගිවිසුමකට එළඹ, කොන්ත්‍රාත්තුව අතරමග නතර කර දැමූ පෞද්ගලික කොන්ත්‍රාත්කරුවකු විසින්, ඔහුගේ ඇපකර වටිනාකම වූ රු. 6,000,000 ක් අය කිරීම අත් හිටුවන ලෙසට විශ්වවිද්‍යාලයට එරෙහිව අධිකරණයේ නඩුවක් ගොනුකර තිබුණි. මේ හේතුව මත ගිවිසුම ප්‍රකාරව 2012 අගෝස්තු මස අවසන් කිරීමට නියමිතව තිබූ කොන්ත්‍රාත්තුව 2015 ජුලි වන විටද ඉටු කර නොතිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

### 4.1 කාර්යසාධනය

සමාලෝචිත වර්ෂයේදී හා පෙර වර්ෂයේදී එක් එක් පීඨයන් සඳහා දරා ඇති වියදම, ශිෂ්‍ය සංඛ්‍යාව සහ ඒක ශිෂ්‍ය පිරිවැය පිළිබඳ වූ තොරතුරු පහත දැක්වේ.

| | පීඨය | විස්තරය | | පෙර වර්ෂය 2013 | සමාලෝචිත වර්ෂය 2014 | වැඩිවීම ප්‍රතිශතයක් ලෙස සියයට |
|---|---|---|---|---|---|---|
| (i) | ව්‍යාපාර අධ්‍යයන හා මූල්‍ය පීඨය | වියදම | රු. | 73,543,884 | 91,453,057 | 24 |
| | | ශිෂ්‍ය සංඛ්‍යාව | | 1,312 | 1,521 | 15 |
| | | ඒක ශිෂ්‍ය පිරිවැය | රු. | 56,055 | 60,126 | 07 |
| (ii) | ව්‍යවහාරික විද්‍යා පීඨය | වියදම | රු. | 74,208,889 | 95,292,894 | 28 |
| | | ශිෂ්‍ය සංඛ්‍යාව | | 428 | 461 | 07 |
| | | ඒක ශිෂ්‍ය පිරිවැය | රු. | 173,385 | 206,709 | 19 |
| (iii) | කෘෂිකර්ම හා වැවිලි කළමනාකරණ පීඨය | වියදම | රු. | 84,163,292 | 100,091,898 | 18 |
| | | ශිෂ්‍ය සංඛ්‍යාව | | 439 | 454 | 03 |
| | | ඒක ශිෂ්‍ය පිරිවැය | රු. | 191,716 | 220,446 | 15 |
| (iv) | පශු සම්පත් ධීවර හා පෝෂණ විද්‍යා පීඨය | වියදම | රු. | 82,539,376 | 106,824,982 | 29 |
| | | ශිෂ්‍ය සංඛ්‍යාව | | 393 | 420 | 06 |
| | | ඒක ශිෂ්‍ය පිරිවැය | රු. | 210,024 | 254,345 | 21 |

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය තුළ පශු සම්පත් ධීවර හා පෝෂණ පීඨය සහ කෘෂිකර්ම හා වැවිලි කළමනාකරණ පීඨයේ ඒක ශිෂ්‍ය පිරිවැය අනෙකුත් පීඨවලට සාපේක්ෂව ඉහළ අගයක් ගෙන තිබුණු අතර, එය ව්‍යාපාර අධ්‍යයන හා මූල්‍ය පීඨයේ ඒක ශිෂ්‍ය පිරිවැයට සාපේක්ෂව ප්‍රතිශතයක් ලෙස පිළිවෙලින් සියයට 423 ක් හා සියයට 366 ක් විය.

(ආ) ඉකුත් වර්ෂයට සාපේක්ෂව ව්‍යාපාර අධ්‍යයන හා මූල්‍ය පීඨයේ සියයට 7 කින්ද, ව්‍යවහාරික විද්‍යා පීඨයේ සියයට 19 කින්ද, කෘෂිකර්ම හා වැවිලි කළමනාකරණ පීඨයේ සියයට 15 කින්ද, පශු සම්පත් ධීවර හා පෝෂණ විද්‍යා පීඨයේ සියයට 21 කින්ද ඒක ශිෂ්‍ය පිරිවැයෙහි වැඩිවීමක් නිරීක්ෂණය විය.

(ඇ) විශ්වවිද්‍යාලයේ පීඨ හතරක් සඳහා තෝරාගත් ශිෂ්‍යයන්ගෙන් සැලකිය යුතු සංඛ්‍යාවක් විවිධ හේතු මත වෙනත් විශ්වවිද්‍යාලවලට මාරු වී ගොස් තිබුණි. අධ්‍යයන වර්ෂය තුළ විශ්වවිද්‍යාලයේ ලියාපදිංචි ශිෂ්‍යයන්ගෙන් 155 දෙනෙකු වෙනත් විශ්වවිද්‍යාලවලට මාරු වී ගොස් තිබුණු අතර, එය ලියාපදිංචි ශිෂ්‍ය සංඛ්‍යාවේ ප්‍රතිශතයක් ලෙස සියයට 15 ක් පමණ විය. ඒ අනුව මාරු වී ගොස් සිටි ශිෂ්‍යයින් 155 දෙනා වෙනුවෙන් විශ්වවිද්‍යාලය තුළ වෙන්ව පැවති සම්පත් නිශ්ඵල වී ඇතැයි යන සැකය බැහැර කළ නොහැකි විය.

විශ්වවිද්‍යාලවලට ඇතුලුවීමට සුදුසුකම් ලබා එම අවස්ථාව අහිමි වන සිසුන් කෙරෙහි අවධානය යොමු කර මෙම සම්පත් අපතේ යාම වලක්වා ගැනීමට සුදුසු වැඩපිළිවෙලක් යෝජනා කිරීම සමාලෝචිත වර්ෂය තුලද සිදුකර නොතිබුණි.

(ඈ) ව්‍යාපාර අධ්‍යයන හා මූල්‍ය පීඨයේ ශිෂ්‍ය සංඛ්‍යාව හා අධ්‍යයන කාර්ය මණ්ඩල සංඛ්‍යාව අතර පැවතිය යුතු සම්මත අනුපාතය 18:1 ක් වුවද එහි තථ්‍ය අනුපාතය 44:1 ක් විය. එය ඉතාම අහිතකර ලක්ෂණයක් ලෙස නිරීක්ෂණය කෙරේ. අනෙක් පීඨ තුනේම සම්මත අනුපාතය 10:1 ක් වුවද තථ්‍ය අනුපාතය 12:1 ක් වීම හේතුවෙන් සම්මත අනුපාතයට වඩා තථ්‍ය අනුපාතය සුළු ප්‍රමාණයකින් පමණක් වැඩි වී තිබුණි.

4.3 කළමනාකරණ අකාර්යක්ෂමතා

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) විශ්වවිද්‍යාලයේ සේවයේ නියුතුව සිටි ආචාර්යවරුන් තිදෙනෙකු විදේශගත වීමේදී, විශ්වවිද්‍යාලය සමඟ එකඟ වූ ගිවිසුම් 2001, 2003 සහ 2014 වර්ෂවලදී කඩ කිරීම හේතුවෙන් ඔවුන්ගෙන් තවදුරටත් විශ්වවිද්‍යාලයට අයවිය යුතුව තිබුණු හිඟ මුදල වූ රු. 3,826,651 ක් අයකර ගැනීමට සමාලෝචිත වර්ෂයේදීද කටයුතු කර නොතිබුණි. මෙවැනි ලිහිල් ප්‍රතිපත්තියක් අනුගමනය කිරීම නිසා අනාගතයේදීද රජයේ සම්පත් භාවිතා කර විදේශගත වන ආචාර්යවරුද මෙය පූර්වාදර්ශයක් කර ගැනීමට ඉඩකඩ පැවතිය හැකිය යන සැකය විගණනයේදී බැහැර කළ නොහැකි විය.

(ආ) මාකඳුර පරිශ්‍රයේ පිහිටි පුස්තකාලය සඳහා 2008 වර්ෂයේදී ප්‍රදර්ශනයකින් රු.4,130,710 ක් වූ පුස්තකාල පොත් ලබා ගෙන තිබුණි. එහිදී ප්‍රසම්පාදන කාර්යපරිපාටියේ බොහෝ කරුණු නොසලකා තිබූ බවත්, පුස්තකාල පොත්වල අවශ්‍යතාවය, මිල ගණන් පිළිබඳව සහ සංස්කරණ වර්ෂය පවා නොසලකා හැර තිබූ බව අපගේ පසුගිය විගණන විමසුම් හා විගණන වාර්තා මගින් පෙන්වා දී තිබුණි. විශ්වවිද්‍යාලයේ පාලක සභාව විසින් මෙම මිලදී ගැනීම පිළිබඳව පරීක්ෂා කර වාර්තා කිරීම සඳහා කමිටුවක් පත්කර තිබුණද ඒ මඟින් විධිමත් ක්‍රියාමාර්ග නොගෙන රු.4,053,786 ක වටිනාකමක් සමාලෝචිත වර්ෂයේ අදාල ආයතනය වෙත ගෙවා තිබුණි. මෙම පොත් මිලදී ගැනීම සඳහා දරා ඇති පිරිවැයෙන් සැලකිය යුතු වටිනාකමක් නිෂ්කාර්ය වැයක් බව නිරීක්ෂණය වූ අතර, එම මිලදී ගැනීම සම්බන්ධයෙන් සිදුවී ඇති බැහැරවීම්වලට වගකිව යුතු පාර්ශවයන් පිළිබඳව විධිමත්ව සොයා බලා අවශ්‍ය පියවර ගෙන නොතිබුණි.

(ඇ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා සභාපතිගේ අංක UGC/HR/09/01/75 දරන 2008 සැප්තැම්බර් 08 දිනැති ලිපිය ප්‍රකාරව කම්කරු ශ්‍රේණිවල පුරප්පාඩු පූරවන තෙක් සනීපාරක්ෂක හා නඩත්තු කටයුතු සඳහා බාහිර ශ්‍රම සැපයීමේ ආයතනයකින් අදාල සේවාව ලබාගෙන ඒ සඳහා සමාලෝචිත වර්ෂයේදී රු. 3,644,770 ක් ගෙවා තිබුණි. අදාළ සමාගම සමඟ වූ ගිවිසුම් 2013 සැප්තැම්බර් 16 දිනෙන් අවසන් වී තිබුණද නැවත තරඟකාරී ප්‍රසම්පාදන ක්‍රියාමාර්ගයන්ට නොගොස් අදාල ආයතනයේ සේවා කාලය විටින් විට දීර්ඝ කර තිබුණි.

(ඈ) නේවාසික පහසුකම් අවශ්‍ය සිසුන් පිළිබඳව විධිමත් අධ්‍යයනයකින් තොරව සිසුන් 89 දෙනෙකුගේ නේවාසික පහසුකම් වෙනුවෙන් රු. 2,700,000 ක් ගෙවා ගොඩනැගිල්ලක් කුලියට ලබාගෙන තිබූ අතර, ඒ අනුව එක් සිසුවෙක් වෙනුවෙන් වාර්ෂිකව දරා තිබූ පිරිවැය රු. 30,337 ක් විය. මෙම ගොඩනැගිල්ල සිසුන් 150 දෙනෙකුට නේවාසික පහසුකම් සැලසිය හැකි ගොඩනැගිල්ලක් බව නිරීක්ෂණය විය.

(ඉ) සමාලෝචිත වර්ෂයේදී මාකඳුර පශු සංවර්ධන ව්‍යාපෘතිය මඟින් සත්ව කොටු ඉදිකිරීම නිම කර තිබුණද, එම තත්ත්වය ගිණුම් අංශයට වාර්තා නොකිරීම හේතුවෙන් රු. 2,469,713 ක් වූ පිරිවැය ප්‍රාග්ධනීකරණය කර නොතිබුණි.

4.4 මෙහෙයුම් අකාර්යක්ෂමතා
-----------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) විශ්වවිද්‍යාලයේ කාර්ය මණ්ඩල සංවර්ධනය වෙනුවෙන් 2012 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවෙන් ලැබී තිබුණු එකතුව රු. 10,500,000 ක මුදලින් සියයට 13 ක් එනම් රු. 1,348,618 ක මුදලක් අදාළ කාර්යයන් සඳහා යොදා ගෙන නොතිබුණි.

(ආ) විශ්වවිද්‍යාලීය නඩත්තු අංශය මඟින් ඇතැම් ඉදිකිරීම් සිදු කර තිබුණද පශු සංවර්ධන වැඩසටහන් යටතේ මිලදී ගන්නා ලද ගොඩනැගිලි ද්‍රව්‍ය රු. 1,647,590 ක් මාකඳුර නඩත්තු අංශයේ තොග ලේඛනවල ඇතුළත් කර නොතිබුණි.

4.5 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) විශ්වවිද්‍යාලයේ ආචාර්යවරියකට පශ්චාත් ආචාර්ය උපාධියෙන් පසුව කෙරෙන පරීක්ෂණ කටයුතු සඳහා ලබාදී තිබූ පවුම් 5000 (රු. 980,200) ක මුදලක් ඇයගේ පෞද්ගලික ගිණුමට බැර කර තිබුණි. මේ සම්බන්ධයෙන් පැවති විරෝධතා සලකා බැලීමෙන් තොරව විශ්වවිද්‍යාලයේ පාලක සභාවේ 2014 ජනවාරි 21 දිනැති අංක C/141/48SUPP දරන ලිපිය මඟින් ලබාදී තිබූ අනුමැතියෙන් මුදල් බැර කිරීම මතභේදයට තුඩුදෙන කරුණක් විය. මෙම ආචාර්යවරියට අදාල පර්යේෂණ කටයුතු සඳහා මුදල් ලැබී ඇත්තේ ඇය ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලයේ ආචාර්යවරියක් වීම හේතුවෙන්ය යන කරුණු විගණනයේදී බැහැර කළ නොහැකි විය.

(ආ) මාකඳුර පරිශ්‍රයේ ශිෂ්‍ය නේවාසිකාගාර දෙකක් ඉදිකිරීමේ ව්‍යාපෘතියේ ඇස්තමේන්තු සකස් කිරීම, ගිවිසුම් අත්සන් කිරීම හා මුදල් ගෙවීම යනාදිය උසස් අධ්‍යාපන අමාත්‍යාංශය මගින් සිදුකර තිබුණි. ඉදිකිරීම් ආරම්භ කිරීමට ප්‍රථම බිම සකස් කිරීමේ කටයුතු සිදුකිරීම විශ්වවිද්‍යාලය වෙත පැවරී තිබූ අතර ඒ සඳහා රු.1,640,510 ක් විශ්වවිද්‍යාලය විසින් වැයකර තිබුණි. කෙසේවුවද ගොඩනැගිලි ඉදිකිරීමේ කොන්ත්‍රාත්කරු හා විශ්වවිද්‍යාලය අතර කිසිදු ගිවිසුමක් හෝ නොමැතිව මෙම ව්‍යාපෘතිය සඳහා විශ්වවිද්‍යාලය ගොඩනැගිලි ඉදිකිරීම වෙනුවෙන් විශ්වවිද්‍යාල අරමුදලින් රු.5,341,038 ක් ගෙවා තිබුණි.

4.6 ආර්ථික නොවූ ගනුදෙනු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) විශ්වවිද්‍යාලය විසින් නේවාසිකාගාර බදු ගැනීමේදී තක්සේරු වටිනාකම ඉක්මවා රු. 246,000 ක් ගෙවා තිබුණු අතර, ඒ සඳහා පාලක සභාවේ අනුමැතියද ලබාදී තිබුණි.

(ආ) මාකඳුර පරිශ්‍රයේ ආචාර්යවරුන් දෙදෙනෙකු සමාලෝචිත වර්ෂයේ එකම දිනක කොළඹ යාම සඳහා රු. 5,850 හා රු.5,148 වශයෙන් එකතුව රු.10,998 ක් ගෙවා කුලී වාහන දෙකක් ලබා ගෙන තිබීම අනාර්ථික ලෙස කටයුතු කිරීමක් බව නිරීක්ෂණය විය.

(ඇ) 2010 දෙසැම්බර් 07 දිනැති අංක 150 දරන මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශයේ අයවැය චක්‍රලේඛය ප්‍රකාරව නව වාහන මිලදී ගැනීමෙන් පසුව කුලී වාහන ඉවත් කළ යුතු වුවද, විශ්වවිද්‍යාලය විසින් 2013 වර්ෂයේ නව වාහන 05 ක් මිලදීගෙන තිබුණද සමාලෝචිත වර්ෂය තුළදී කුලී වාහන වෙනුවෙන් රු. 2,724,456 ක් ගෙවා තිබුණ අතර, එය පසුගිය වර්ෂයට සාපේක්ෂව සියයට 50 ක වැඩිවීමකි.

## 4.7 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ගිවිසුම්ගත කාලය තුළ වැඩ අවසන් නොකිරීම හේතුවෙන් ගෙවීම් කිරීමේදී අතිරේක වැය බරක් දැරීමට සිදුවූ අවස්ථා නිරීක්ෂණය වූ අතර එවැනි අවස්ථා කිහිපයක් පහත දැක්වේ.

(i). කුලියාපිටිය පරිශ්‍රයේ ව්‍යාපාර අධ්‍යයන හා මූල්‍ය පීඨ ගොඩනැගිල්ලේ ඉදිකිරීම් අවසන් කිරීම සඳහා වූ ගිවිසුම්ගත කාලය 2011 ජනවාරි 27 දිනෙන් අවසන් වුවද, ඉදිකිරීම් අවසන් කර ගොඩනැගිල්ල භාරදී තිබුණේ 2013 නොවැම්බර් 28 දින දීය. එදිනෙන් පසු 2015 ජනවාරි මාසය වන තෙක් කිසිදු බිල්පත් ගෙවීම් කටයුතු සඳහා ඉදිරිපත්කර නොතිබුණි. ඉදිකිරීම් පමාවීම මිල විචලන සඳහා ගණනය කිරීම්වලට යටත්වන අතර, මිල විචලන සඳහා මෙතෙක් කළ ගෙවීම රු. 10,363,120 ක් වී තිබුණි. මේ සඳහා ඉදිරිපත් කර ඇති හේතු විගණනයේදී පිළිගැනීමට අසීරු විය.

(ii). මාකඳුර පරිශ්‍රයේ තනි පුද්ගල නේවාසිකාගාර ගොඩනැගිල්ල ඉදිකිරීම් අවසන් කළයුතුව තිබුනේ 2012 වර්ෂයේදී වුවත්, එය නිමකර භාරදී තිබුනේ 2013 වර්ෂයේදීය. කෙසේ වුවද එම ගොඩනැගිල්ල සඳහාද සමාලෝචිත වර්ෂයේදී කිසිදු බිල්පතක් ඉදිරිපත් කර නොතිබූ අතර, 2015 වර්ෂයේදී ඉදිරිපත් කර තිබූ 07 වන බිල්පත සඳහා රු. 2,424,959 ක් මිල විචලනය සඳහා ගෙවීම් කර තිබුණි. ඉදිකිරීම් කාල ප්‍රමාදයක් ඇතිවී තිබුණේ කොන්ත්‍රාත්කරුගේ දුර්වල ඉදිකිරීම් මත බව 2012 සැප්තැම්බර් 18 දිනැති ලිපියෙන් රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව දක්වා තිබියදීත් මිල විචලන ගෙවීම අනුමත කිරීම ප්‍රශ්නගත කරුණක් විය.

(ආ) වර්ෂයකට වැඩි කාලයක සිට කෙරීගෙන යන වැඩ ලෙස ගිණුම්වල දක්වා තිබුණු එකතුව රු. 34,085,902 ක වටිනාකම තවදුරටත් නොවෙනස්ව පැවතුණි. ඒ තුළ වර්ෂ 02 කට වඩා පැරණි ශේෂද පැවතුණි.

## 4.8 කාර්ය මණ්ඩල පරිපාලනය

2014 දෙසැම්බර් 31 දිනට විශ්වවිද්‍යාලයේ අනුමත හා තථ්‍ය සේවක සංඛ්‍යාව සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයෙහි විශ්වවිද්‍යාලයේ අනුමත අධ්‍යයන කාර්ය මණ්ඩලය 275 ක් වුවද, තථ්‍ය කාර්ය මණ්ඩලය 255 ක් විය. සමාලෝචිත වර්ෂයේදී සමහර අධ්‍යයන අංශවල ඇතැම් විෂයයන් සඳහා විශේෂ නිපුනතාවයක් ඇති ආචාර්යවරුන් නොමැති වීම හේතුවෙන් බාහිර දේශකයින් 69 දෙනෙකු බඳවා ගෙන ඔවුන්ට වැටුප් වශයෙන් රු. 8,508,195 ක් ගෙවා තිබුණි.

(ආ) අනුමත සේවක සංඛ්‍යාව අනුව සුළු සේවකයන් 26 දෙනෙකුගේ පුරප්පාඩු පැවති අතර, එය දෛනික කටයුතු කර ගෙන යාමට එතරම් බාධාවක් නොවූවද, විවිධ හේතු දක්වමින් බාහිර ශ්‍රම සේවා සපයන ආයතනයකින් කම්කරුවන් 12 දෙනෙකු බඳවා ගෙන ඔවුන්ගේ වැටුප් වශයෙන් සමාලෝචිත වර්ෂයේදී රු. 3,644,770 ක මුදලක් ගෙවා තිබුණි.

5. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

5.1 ක්‍රියාකාරී සැලැස්ම

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 5.1.2 වගන්තිය ප්‍රකාර ආයතනයක සැලසුම්ගත ව්‍යාපාර කාලය තුළ (වර්ෂයක්) අරමුණු හා ඉලක්ක සපුරා ගැනීම සඳහා පැහැදිලිව හඳුනා ගන්නා ලද කාර්යයන් ඇතුළත් කර ක්‍රියාකාරී සැලැස්මක් සකස් කිරීම කළමනාකරණයේ වගකීම වුවද සමාලෝචිත වර්ෂය සඳහා විධිමත් ලෙස සකස් කළ ක්‍රියාකාරී සැලැස්ම විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි.

(ආ) ඉදිරිපත් කර තිබූ විධිමත් නොවූ ක්‍රියාකාරී සැලැස්මේ ගොඩනැගිලි පුනරුත්ථාපනය හා වැඩි දියුණු කිරීම යටතේ රු. 12,500,000 ක ප්‍රතිපාදනයක් දක්වා තිබුණද සමාලෝචිත වර්ෂයේ අවසාන ගිණුමේ උක්ත ප්‍රතිපාදනය ලෙස දක්වා තිබුනේ රු. 37,500,000 ක් ලෙසිනි. ක්‍රියාකාරී සැලැස්මට අනුව වැඩ විෂයයන් 10 ක් සඳහා රු. 12,500,000 ක් වෙන් කර තිබුණද සමාලෝචිත වර්ෂය තුලදී ක්‍රියාකාරී සැලැස්මට අනුකූල නොවන ලෙස වැඩ විෂයයන් 51 ක් සිදුකර ඒ සඳහා රු. 39,577,470 ක් වැය කර තිබුණි.

(ඇ) ගොඩනැගිලි ඉදිකිරීම සඳහා රු.455,000,000 ක් වටිනා ව්‍යාපෘති ගණනාවක් ඉටු කිරීමට අපේක්ෂා කළද සමාලෝචිත වර්ෂය අවසානයට ප්‍රගතිය සතුටුදායක මට්ටමක නොවූ බව නිරීක්ෂණය විය. ව්‍යාපාර අධ්‍යයන පීඨ ගොඩනැගිල්ල හා අධ්‍යයන අවිචාහක කාර්ය මණ්ඩල ගොඩනැගිල්ල යන ව්‍යාපෘති සඳහා පසුගිය වර්ෂයේ ඉතිරි කරගත් ප්‍රතිපාදනයද සමඟ සමාලෝචිත වර්ෂයේ අවසානයට රු.5,398,871 ක් ඉතිරි කර තිබුණි. මාකඳුර සෞඛ්‍ය මධ්‍යස්ථානයෙන් සියයට 49 ක්ද, කුලියාපිටිය සේවා මධ්‍යස්ථානයෙන් සියයට 96 ක්ද, ක්‍රීඩාපිටිය සකස් කිරීමෙන් සියයට 20 ක්ද සහ ක්‍රීඩා දෙපාර්තමේන්තුවේ නිපුනතා සඳහා සියයට 93 ක්ද වශයෙන් එකතුව රු.14,515,623 ක් ඉතිරි කර තිබුණි. වැඩ විෂයයන් 08 ක මුළු ප්‍රතිපාදනය ඉක්මවා රු.23,120,397 ක් වැයකර තිබුණි.

5.2 අයවැය ලේඛනමය පාලනය

අයවැය ලේඛන සකස් කිරීමේදී වැය විෂයයන් 40 කට අදාලව අධි ඇස්තමේන්තු පිළියෙල කර තිබීමත්, වැය විෂයයන් 20 කට අදාලව අයවැයගත ප්‍රතිපාදන ඉක්මවා වියදම් දරා තිබීමත්, වැය විෂයයන් 02 ක මුළු ප්‍රතිපාදිත මුදලම වියදම් කර නොතිබීමත් සහ වැය විෂයයන් 03 ක් සඳහා ප්‍රතිපාදන රහිතව වියදම් දරා තිබීමත් හේතුවෙන් විශ්වවිද්‍යාලය විසින් අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස උපයෝගී කර නොතිබූ බව නිරීක්ෂණය විය.

5.3 නොවිසඳී ඇති විගණන ඡේද

විශ්වවිද්‍යාලයේ කථිකාචාර්යවරුන් වෙත 2010-2011 කාල සීමාව තුල එක් ව්‍යාපෘති යෝජනාවක් ඉදිරිපත් කළ ආචාර්යවරියක වෙත එම ව්‍යාපෘතිය වෙනුවෙන් රු.99,882 ක් ගෙවා තිබූ අතර, එම ව්‍යාපෘතියට අදාල පර්යේෂණ වාර්තාව 2013 පෙබරවාරි අවසානයට ඉදිරිපත් කළයුතු වුවත්, 2015 ජූනි 30 දින වන විටත් ඉදිරිපත් කර නොතිබුණි.

5.4 වාර්ෂික වාර්තා සභාගත කිරීම

1971 අංක 38 දරන මුදල් පනතේ 14 (1) වගන්තිය සහ 2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.3 වගන්තිය අනුව අදාල වර්ෂය අවසන් වී දින 150 ක් ඇතුළත විශ්වවිද්‍යාලයේ වාර්ෂික වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කළයුතු වුවද, 2012 වර්ෂයේ වාර්ෂික වාර්තාව සභාගත කර නොතිබුණි.

6. පද්ධති හා පාලනයන්

පද්ධති හා පාලන ක්ෂේත්‍රයන් සම්බන්ධයෙන් විගණනයේදී නිරීක්ෂණය වූ අඩුපාඩු වරින්වර උපකුලපතිවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුවේ.

(අ) අයවැය
(ආ) පුස්තකාල පොත් හා සඟරා මිලදී ගැනීම
(ඇ) ඉදිකිරීම් කොන්ත්‍රාත්තු
(ඈ) අත්තිකාරම් ලබාදීම
(ඉ) බාහිර පාඨමාලා පැවැත්වීම
(ඊ) තොග පාලනය
(උ) කාර්ය මණ්ඩල පරිපාලනය
(ඌ) ප්‍රසම්පාදන ක්‍රියාවලිය
(එ) වාහන පාලනය
(ඒ) බාහිර දේශන සම්බන්ධ පාලනය

ඩබ්ලිව්.පී.සී. වික්‍රමරත්න
විගණකාධිපති (වැඩබලන)

**ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලයේ 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ 1978 අංක 16 දරණ විශ්වවිද්‍යාල පනතේ 108 (1) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව.**

**2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම.**

**2.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති.**

මේ වන විට, 2013.12.31 දිනට විශ්වවිද්‍යාලය සතු ඉඩම්, ගොඩනැගිලි හා වාහන තක්සේරු දෙපාර්තමේන්තුව මගින් ද, අනෙකුත් සියළුම ස්ථාවර වත්කම් විශ්වවිද්‍යාලය විසින් පත්කර ගත් කමිටුවක් මගින් ද ප්‍රත්‍යාගණනය කරමින් සිටින අතර, එය අවසන් වූ වහාම ස්ථාවර වත්කම් ලේඛණය සකස් කල හැකි බව කාරුණිකව දන්වමි.

**2.2.2 ගිණුම්කරණ අඩුපාඩු**

**(අ)** රාජ්‍ය ප්‍රධාන ගිණුම් තැබීම හා අදාළ ගිණුම්කරණ ප්‍රමිත අනුව 2016 වර්ෂයේ ගිණුම් සකස් කිරීමට කටයුතු කරනු ලැබේ.

**(ආ)** 2014/12/22 දින මහා භාණ්ඩාගාරය විසින් රු. 20,575,000 ක මුදලක් ලංකා බැංකුවේ පවත්වාගෙන යනු ලබන ජංගම ගිණුමට සෘජුවම බැරකර තිබුණි. එම ජංගම ගිණුම මූලධන ප්‍රතිපාදන වෙනුවෙන් පවත්වාගෙන යනු ලබන ජංගම ගිණුම බැවින් එය මූලධන ප්‍රතිපාදන ලෙස සලකා 2014 වර්ෂයේ මූලධන වියදම් පියවීම සඳහා යොදා ගන්නා ලදී. නමුත් 2015/02/06 දින ලැබුණු මුදල් නිදහස් කිරීමේ පත්‍රිකාවේ එය පුනරාවර්තන මුදල් නිදහස් කිරීමක් ලෙස සටහන්ව තිබුණු නමුත් ඒ වන විට අදාළ මුදල් මූලධන ගෙවීම් සඳහා යොදා ගන්නා ලද බැවින් එය මූලධන ප්‍රතිපාදන ලෙසට සලකා කටයුතු කරන ලෙස 2015/02/16 දිනැති ලිපිය මගින් මහාභාණ්ඩාගාරය වෙත දැනුම් දෙන ලදී.

**(ඇ)** පත්කරන ලද කමිටුවක් විසින් මාකඳුර පරිශ්‍රයේ ඇති මෙහි සඳහන් පරිහරණයට නොගන්නා භාණ්ඩ පරීක්ෂා කරන ලදී. කුලියාපිටිය පරිශ්‍රයේ මෙතෙක් සිදුකර නොමැති බැවින් එය සම්පූර්ණයෙන් අවසන් කර නැත. ඉදිරියේ දී ඒ පිළිබඳ කටයුතු කරනු ලැබේ.

**(ඈ)** නේවාසිකාගාර අංක 03 සහ 05 කොන්ත්‍රාත්තු නිම කළ බවට ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී/ මූලධන විසින් ලබා දුන් සහතිකය මත 2014 වර්ෂයේ දී ප්‍රාග්ධනිත කර ඇත. 2015 වර්ෂයේ නිමකරන ලද කොන්ත්‍රාත්තු පිළිබඳ ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී/ මූලධන විසින් ලබා දෙන ලද ලේඛණය අනුව මෙම කොන්ත්‍රාත් වැඩ නිමකර නොමැති බැවින් 2015 වර්ෂයේ C117 ජ'නලය මගින් නැවත නොනිමි වැඩ ගිණුමට මාරු කිරීමට කටයුතු කර ඇත.

**(ඉ)** ප්‍රයෝජනයට ගත නොහැකි දේපළ පිරියත හා උපකරණ සම්බන්ධයෙන් ප්‍රමාණවත් තොරතුරු නොලැබුණ බැවින් ගිණුම්වල ගැලපීම් සිදු කර නොමැත.

**(ඊ)** පුනරාවර්තන ස්වභාවයේ ප්‍රාග්ධන ලැබීම් 2014 වසරේ මෙහෙයුම් කාර්යයන්ගෙන් සිදු වූ අතිරික්තය/ ඌනතාවය ගණනය කිරීමේ දී නිවැරදිව ගිණුම්ගත කර ඇති බැවින් පුනරාවර්තන වැය සඳහා අරමුදල් ලැබීම් රු. 2,774,000.00 ක් ප්‍රාග්ධන අරමුදල් ලැබීම් වලින් ඉවත් කර තිබීම නිවැරදි වේ.

**(උ)** 2014/12/31 දිනට හඳුනා නොගත් තැන්පතු පිළිබඳ විස්තර සොයා ගිණුම්ගත කිරීමට කටයුතු කර ඇත.

**(ඌ)** මූල්‍ය කමිටු හා පාලක සභා තීරණ අනුව CBA පඨමාලාවට අදාල රු. 144,448.00 ස්වයං අරමුදල් මත පවත්වාගෙන යනු ලබන පශ්චාත් උපාධි ඩිප්ලෝමාවේ වියදමක් ලෙස ගිණුම්ගත කර ඇත. ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 8 හි දක්වා ඇති පරිදි ගබඩා තොග ඌනතාවය වන රු.31,250.00 ප්‍රමාණාත්මක නොවන වටිනාකමක් වන බැවින් පෙර වර්ෂවල ගැලපීමක් ලෙස නොදක්වා මූල්‍ය කමිටු හා පාලක සභා තීරණ අනුව වසරේ වියදමක් ලෙස ගිණුම්ගත කර ඇත.

**(එ)** ශ්‍රී ලංකා කෘෂිකර්ම ප්‍රතිපත්ති ආයතන (CARP) සහ බාහිර පුහුණු පාඨමාලා (SDC) වෙනුවෙන් වැඩිපුර වියදම් වී ඇති මුදල ලැබිය යුතු මුදල් ලෙස ගිණුම්ගත කර ඇති අතර 2015 වර්ෂයේ අදාළ වියදම් පියවා ගැනීමට කටයුතු කර ඇත.

**2.2.3 විගණනය සඳහා සාක්ෂි නොවීම.**

**ඉඩම් ඔප්පු/පැවරුම් නියෝග**

පිඹුරු අංක 992 හි කැබලි අංක 452, 476, 454 නීත්‍යානුකූලව විශ්වවිද්‍යාලයට පවරාගෙන පැවරුම් සහතික ලබාගෙන ඇත. ඊට අමතරව විකුණුම්කර ලෙස ලබා ගත් පහත සඳහන් ඉඩම් කොටස්වල ඔප්පු විශ්වවිද්‍යාලය සතුව ඇත.

1). කඳනෙගෙදර, වෙරළුගම (උපකුලපති නිල නිවස පිහිටි ඉඩම (ඔ.අ. 318, පි.අ. 4937)
2). මාකඳුර පරිශ්‍රය ගමගේවෙල සහ නයිවල කුඹුර (ඔ.අ. 125, පි.අ. 4674)

විශ්වවිද්‍යාලය භුක්ති විඳින අනෙකුත් ඉඩම් විශ්වවිද්‍යාලයට පවරා ගැනීමට කටයුතු කරමින් සිටී.

**<u>ස්ථාවර වත්කම් ලේඛන</u>**

මේ වන විට, 2013.12.31 දිනට විශ්වවිද්‍යාලය සතු ඉඩම්, ගොඩනැගිලි හා වාහන තක්සේරු දෙපාර්තමේන්තුව මගින් ද, අනෙකුත් සියළුම ස්ථාවර වත්කම් විශ්වවිද්‍යාලය විසින් පත්කර ගත් කමිටුවක් මගින් ද ප්‍රත්‍යාගණනය කරමින් සිටින අතර, එය අවසන් වූ වහාම ස්ථාවර වත්කම් ලේඛණය සකස් කල හැකි බව කාරුණිකව දන්වමි.

**<u>උපලේඛන</u>**

2014/01/01 දින සිට අත්පත්කර ගනු ලබන වත්කම් වලට අදාල විස්තර ස්ථාවර වත්කම් මෘදුකාංගයට (Fixed Asset Software Package) මුදල් අංශය මගින් ඇතුලත් කරනු ලැබේ. 2013/12/31 දිනට විශ්වවිද්‍යාලය සතු ස්ථාවර වත්කම් වටිනාකම මේ වන විට ප්‍රත්‍යාගණනය කරමින් පවතී.

**2.3 <u>ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්</u>**

**(අ) (i) කාර්ය මණ්ඩල ණය - රු. 8,990.00**

T.M.C.P ප්‍රනාන්දු මයාගේ රු. 4,080.00 ක මුදල ඒ මහතාගේ විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදල් නිදහස් කිරීමේ දී අය කර ගැනීමට කටයුතු කර ඇති අතර ඉතිරි මුදල් 2015 වර්ෂයේ දී නිරවුල් කර ඇත.

**(ii) ආපදා ණය - රු. 116,356.00**

1. T.M.C.P ප්‍රනාන්දු මයාගේ ණය ශේෂය වන රු. රු.114,240.00 ක මුදල විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදල් නිදහස් කිරීමේ දී අයකර ගැනීමට කටයුතු කර ඇත.
2. J.G.W.S නිශාන්ත මහතාගේ  රු. 1,116.00 ක ණය ශේෂය 2015 වර්ෂයේ දී නිරවුල් කර ඇත.
3. S.V සෙනෙවිරත්න මියගේ රු. 1,000.00 ක ණය ශේෂය පවරා ගැනීම සඳහා පේරාදෙණිය විශ්වවිද්‍යාලය වෙත සිහි කැඳවීම් ලිපි යවා ඇත.

**(iii) <u>පුස්තකාල පොත් හා සඟරා මිළ දී ගැනීමේ අත්තිකාරම් - රු. 470,597</u>**

මෙහි අගය රු. 385,937.22 ලෙස නිවැරදි විය යුතුය. ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලයේ වයඹ මණ්ඩපය පැවති කාලයේ (1996-1999) ලබා දී ඇති මෙම අත්තිකාරම් පිළිබඳ ලිපි ලේඛණ ඉතා පැරණි බැවින් සොයා ගැනීමට අපහසු වී ඇත. මේ පිළිබඳ තීරණයක් ගැනීම සඳහා විගණන කමිටුවට යොමු කර ඇති අතර 2015/12/04 දින පැවති 52 වන විගණන කමිටුවේ දී මෙම මුදල මුදල් රෙගුලාසි පරිදි කපාහැරීමට කටයුතු කරන ලෙස නිර්දේශ කර ඇත.

| ලබා දුන් දිනය | වවුචර් අංකය | ආයතනය | වටිනාකම (රු.) |
|---|---|---|---|
| 1996/12/31 | 50 | People's Bank, International Branch | 36,860.17 |
| 1997/12/31 | C102 | Vote Trade Press | 70,235.04 |
| 1999/12/31 | C104 | Indian Institute of Packaging | 278,842.01 |
| | | Total | 385,937.22 |

**(iv) ඉදිකිරීම් අත්තිකාරම් - රු. 2,486,208.00 (කොන්ත්‍රාත් පිටු 8/49)**

මෙය සේවයට අනුගත කිරීමේ අත්තිකාරමක් ලෙස ගෙවා ඇති අතර 2014/12/31 වන විට කොන්ත්‍රාත්තුවේ ඉදිකිරීම් කටයුතු නිමකර නොමැති බැවින් මෙය නොපිය වූ අත්තිකාරමක් ලෙස දක්වා ඇත.

**(ආ) (ඇ)**

මෙම මුදල් පිළිබඳ 2015 වර්ෂයේ ගිණුම් වාර්තාවල අවශ්‍ය ගැලපීම් කිරීමට කටයුතු කර ඇත.

**(ඈ)** මෙම අත්තිකාරම් පියවීමට කටයුතු කර ඇත.

**2.4 නීති, රීති රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම.**

**(අ) (i) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ xix පරිච්ඡේදයේ 4.1 ප්‍රකාරව හා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ 2013 අගෝස්තු 29 දිනැති අංක 12/2013 දරණ චක්‍රලේඛය**

විශ්වවිද්‍යාල පනතේ 29 වගන්තියේ (ග) උප වගන්තිය ප්‍රකාරව සහ විශ්වවිද්‍යාල ආයතන සංග්‍රහයේ 1 පරිච්ඡේදයේ 7.3 (ඇ) වගන්තිය ප්‍රකාරව විශ්වවිද්‍යාල ශිෂ්‍යයන්ගේ, ආචාර්යවරුන්ගේ සහ නිලධරයන්ගේ වාසය විනය සහ සුභසිද්ධිය විධිමත් කිරීමට ඒ සඳහා විධිවිධාන සැලැස්විය යුතු බව සඳහන්ව ඇත. තවද, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ 2013 අගෝස්තු 29 දින අංක 12/2013 චක්‍රලේඛය මගින් නිල නිවාස හිමි නිළධාරීන් වෙත නිවාස පහසුකම් සලසා දිය යුතු බව සඳහන්ව ඇත.

විශ්වවිද්‍යාල පීඨාධිපතිවරු, ලේඛකාධිකාරී, මූල්‍යාධිකාරී හා පුස්තකාලයාධිකාරී පූර්ණකාලීන නිලධාරීන් වන බැවින් ඔවුන් දුරස්ථව සේවාස්ථානයට පැමිණෙන්නේනම් ඉහත විධිවිධාන අනුව විශ්වවිද්‍යාලය තුළ හෝ විශ්වවිද්‍යාලය තුල එවැනි නිවාස නොමැතිනම් කුලියට ලබාගෙන හෝ සිය පවුල සමග වාසය කිරීමට හැකිවන පරිදි තනි නිවාස පහසුකම් සපයා දීම සියලුම විශ්වවිද්‍යාල මඟින් කරනු ලැබේ.

විශ්වවිද්‍යාලයක ලේඛකාධිකාරීවරයා විශ්වවිද්‍යාලයේ පූර්ණකාලීන නිලධාරියකු වන අතර විශ්වවිද්‍යාලයේ සියලුම දේපල හා වාර්තා භාරකරු සහ සහකාර ගණන්දීමේ නිලධාරියා ද වේ. ඊට අමතරව විශ්වවිද්‍යාලයේ දේපල හා පුද්ගල ආරක්ෂාව සම්බන්ධයෙන් වගකීම දරනුයේ ඔහු වන බැවින් ඒ සම්බන්ධයෙන් ගැටළු සහගත තත්වයක් ඇති වූ ඕනෑම වේලාවක ඒවා නිරාකරණය කිරීමට මැදිහත්වීම ඔහුගේ වගකීමකි. විශේෂයෙන්, ශිෂ්‍ය ශිෂ්‍යාවන්ගේ නේවාසිකාගාර පිහිටා ඇත්තේ ද විශ්වවිද්‍යාලය ඇතුලත බැවින් මෙහි බැරෑරුම් බව තවත් වැඩි වී ඇති අතර රාත්‍රී කාලයේ දී පවා ප්‍රශ්න පැන නැගුණු අවස්ථාවල දී ඒවා විසඳීමට මැදිහත් වීමට සිදු වී ඇත. එබැවින්, ලේඛකාධිකාරීවරයා විශ්වවිද්‍යාලය අසලින් පදිංචිව සිටීම ඉතාමත් අත්‍යාවශ්‍යය.

පුස්තකාලයාධිපතිවරයා ද විශ්වවිද්‍යාලයේ නිල නිවාස හිමි පළමු පෙළේ නිලධාරියෙකි. වයඹ විශ්වවිද්‍යාලයීය පුස්තකාලයාධිපතිවරයා 2006 වසරේ සිට පෞද්ගලික කුලී නිවසක සිට විශ්වවිද්‍යාලයේ සේවයට වාර්තා කරන අතර ඔවුන්ගේ වැටුපෙන් පෞද්ගලිකව නිවාස කුලී ගෙවනු ලබයි.

මේ පිළිබඳ සොයා බැලීමෙන් අනතුරුව පාලක සභාව අනුමත කරන ලද (Memo C/ 134/29) නිල නිවාස දීමනාව 2014 වසරේ පෙබරවාරි සිට ඔහුගේ වැටුපත් සමග වයඹ විශ්වවිද්‍යාලය විසින් ගෙවා ඇත.

දැනට ලංකාවේ සෑම විශ්වවිද්‍යාලයකම වාගේ ඉහත නිලධාරීන්ට මෙලෙස තනි නිවාස පහසුකම් සපයා දී ඇත. වයඹ විශ්වවිද්‍යාලය සතුව එවැනි තනි නිවාස නොමැති බැවින් නිවාස පහසුකම් සපයන්නේනම් කුලියට නිවාස ලබා ගත යුතුය. එහෙත්, විශ්වවිද්‍යාලය අසලින් සුදුසු නිවාස සොයා ගැනීමට නොහැකි වූ අතර අපහසුවෙන් වුව ද සොයාගත් නිවාස සඳහා ඉතා විශාල මුදලක් දැරීමට සිදුවනු ඇත. මෙම කරුණු සැලකිල්ලට ගත් පාලක සභාව, රැස්වීම් වාර තුනකදීම ඉහත නිලධාරීන්ට තනි නිවාස කුලියට ගෙන ලබා දීම වෙනුවට ඔවුන්ට නිවාස පහසුකම් සපයා ගැනීමට හැකි වන පරිදි මසකට රු. 10,000/- ක දීමනාවක් ගෙවීමට තීරණය කරන ලදී. ඒ අනුව, වයඹ විශ්වවිද්‍යාලයේ ලේඛකාධිකාරීවරයාට සහ පුස්තකාලයාධිපතිවරයාට විශ්වවිද්‍යාලයෙන් තනි නිවාස ලබා දී නැති අතර ඔවුන්ට ඉහත විධිවිධානවලට අනුව එම දීමනාව ගෙවා ඇත.

කෙසේවුවද, මේ වන විට වයඹ විශ්වවිද්‍යාලයේ ලේඛකාධිකාරීවරයාට සහ පුස්තකාලයාධිපතිවරයාට මෙම නිවාස කුලී දීමනාව ගෙවීම නවතා ඇත.

**(ii)** පාලක සභා රැස්වීම්, සනාතන සභා රැස්වීම් සහ වෙනත් විශේෂ රැස්වීම් පැවැත්වෙන අවස්ථාවලදී මෙන්ම සිසුන්ගේ විවිධ වැඩසටහන් පැවැත්වෙන අවස්ථාවලදී

ලේඛකාධිකාරීවරයාට විශ්වවිද්‍යාලය තුල රැවන තුරු රැඳී සිටීමට සිදුවන අවස්ථාවලදී පමණක් විධායක නිළධාරීන්ගේ නේවාසිකාගාරයේ කාමරයක නතරවීම නිසා ඒ සඳහා කුලිය වැටුපෙන් අයකර ගෙන ඇති නමුත් දැනට වැටුපෙන් එවැනි අඩු කිරීමක් සිදුකරනු නොලැබේ.

**(ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය**

**(i) මුදල් රෙගුලාසි 271 (2) (අ) (ආ)**

**(ii) මුදල් රෙගුලාසි 396 (ඇ)**

මෙම මුදල් ගෙවීමට ඇති මුදලක් ලෙස ගිණුම්ගත කර ඇති අතර මේ පිළිබඳව සොයා ලබා 2015 ගිණුම් වාර්තාවල අවශ්‍ය ගැලපීම් කිරීමට කටයුතු කර ඇත.

**(ඇ) 2011 පෙබරවාරි 11 දිනැති අංක 02/2014 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛය**

විශ්වවිද්‍යාල කටයුතු කරනු ලබන්නේ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් නිකුත් කරනු ලබන චක්‍රලේඛ උපදෙස් පරිදිය. අංක 02/2014 දරණ කළමනාකරණ සේවා චක්‍රලේඛය අනුව පර්යේෂණ දීමනාව මූලික වැටුපෙන් 25% සිට 35% දක්වා වැඩි කිරීම හා මධ්‍යම මට්ටමේ හා ඉහළ මට්ටමේ විධායක නිළධාරීන්ට මෙම දීමනාව ගෙවීම සිදුකරන ලද්දේ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් නිකුත් කරන ලද අංක 05/2014 දරණ ආයතන චක්‍රලේඛ ලිපියෙන් සලසා තිබූ විධිවිධාන අනුව බව කරුණාවෙන් දන්වා සිටිමි.

තවද, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් නිකුත් කරන ලද ආයතන චක්‍රලේඛ ලිපි අංක 05/2014 (I) හා 05/2014 (II) මගින් පර්යේෂණ දීමනා ගෙවීමට අදාල උසස් අධ්‍යාපන අමාත්‍යාංශ චක්‍රලේඛ අංක 1/2011 සහ 01/2011 (I) නැවත ප්‍රතිෂ්ඨාපනය කරන ලද අතර ඒ අනුව අදාල දීමනාව ලබා ගැනීමට එහි සඳහන් ක්‍රමවේදය අනුගමනය කරන ලදී.

**03. <u>මූල්‍ය සමාලෝචනය</u>**

**3.1 <u>මූල්‍ය ප්‍රතිඵල</u>**

නිරීක්ෂණය සමඟ එකඟ වේ.

**3.2 <u>විග්‍රාහාත්මක මූල්‍ය සමාලෝචනය</u>**

**(අ) මූල්‍ය කාර්යසාධනය**

(i). නිරීක්ෂණය සමඟ එකඟ වේ.

(ii). පෙර වර්ෂය සමඟ සැසඳීමේ දී මෙම වර්ෂය තුළ විදේශ ගමන් වැඩිවීම, සේවක සංඛ්‍යාව වැඩි වීම, ශිෂ්‍ය සංඛ්‍යාව වැඩිවීම හා වෙලඳපොළ භාණ්ඩවල වටිනාකම වැඩිවීම හේතුවෙන් මෙසේ වියදම වැඩි වී ඇත.

**(ආ) මූල්‍ය තත්වය**

**(i)** නිරීක්ෂණය සමග එකඟ වේ.

**(ii)** නිරීක්ෂණය සමග එකඟ වේ.

**(iii)** නිරීක්ෂණය සමග එකඟ වේ.

**3.3 විශ්වවිද්‍යාලයට එරෙහිව ආරම්භ කර ඇති නෛතික සිද්ධි**

නීතිපති දෙපාර්තමේන්තුවේ උපදේශන සහිතව දෙපාර්ශවය විසින් 2016.01.26 දින අධිකරණ ක්‍රියා මාර්ගය අවසන්කල අතර දැනට එහි ඉතිරි ඉදිකිරීම් කටයුතු කරමින් පවතී.

**4. මෙහෙයුම් සමාලෝචනය**

**4.1 කාර්ය සාධනය**

**(අ) (ආ)**

**පශු සම්පත්, ධීවර හා පෝෂණ පීඨය**

පශු සම්පත්, ධීවර හා පෝෂණ පීඨයේ ඒක ශිෂ්‍ය පිරිවැය අනෙකුත් පීඨ වලට සාපේක්ෂව වැඩි වීමට හේතු වන මූලික කරුණු කිහිපයක් පහත දක්වනු කැමැත්තෙමි.

1 නව පාඨමාලා විෂය සංකලනයන් අන්තර්ගතව පීඨය තුල පාඨමාලා දෙකක් ක්‍රියාත්මක වන බැවින් ඒ සඳහා වැඩි වශයෙන් බාහිර කථිකාචාර්යවරුන්ගේ සහාය ලබා ගැනීමට අවශ්‍ය ප්‍රතිපාදන වෙන් කිරීමට සිදු වීම.

2 පීඨය තුල අංග සම්පූර්ණ සත්ව ගොවිපලක් (පශු සම්පත්/කරදිය හා මිරිදිය මත්ස්‍ය) නොමැති වීම නිසා ඉතා විශාල වශයෙන් ක්ෂේත්‍ර චාරිකා හා ක්ෂේත්‍ර ඉගැන්වීම් කටයුතු සිදුකල යුතු වීම හා එවැනි ක්ෂේත්‍ර චාරිකා ඉතා ඈත ප්‍රදේශවල දී සිදු කිරීමට ඇති බැවින් ඒ සඳහා වන ප්‍රවාහන පහසුකම් හා අනෙකුත් සියළු අවශ්‍යතාවයන් සඳහා අවස්ථානුකූලව මූල්‍ය ප්‍රතිපාදන විශාල වශයෙන් වෙන් කරවීමට සිදු වීම.

3 රසායනාගාර මට්ටමේ ප්‍රායෝගික පුහුණුව සඳහා වන අධ්‍යයන කටයුතුවලට අවශ්‍ය රසායනික ද්‍රව්‍ය මිල අධික බැවින් ඒ සඳහා මුදල් ප්‍රතිපාදන යෙදවීම.

4 අනෙකුත් පීඨවල මෙන් නොව මෙම පීඨයේ උපාධි පාඨමාලා දෙකෙහිම සියළුම විභාගයන්හි ලිඛිත හා ප්‍රායෝගික පරීක්ෂණ සඳහා වන ප්‍රශ්න පත්‍ර මුද්‍රණය සම්පූර්ණයෙන්ම පීඨය තුල සිදුකරනු ලබන අතර, ඒ සඳහා අවශ්‍ය වන ලිපි ද්‍රව්‍ය, මුද්‍රණ

තීන්ත හා අනෙකුත් උපකරණ සහ නඩත්තු කටයුතු සඳහා සැලකිය යුතු පිරිවැයක් වෙන් කිරීමට සිදු වීම. මෙම ක්‍රියාවලිය සිදුවනුයේ අප පීඨයෙහි පමණි. තවද, මුද්‍රණ කටයුතු සඳහා වන ගෙවීම් ද මෙකී පිරිවැයට අයත් වේ.

5 තවද, ව්‍යාපාර අධ්‍යයන හා මූල්‍ය පීඨයේ ඒක ශිෂ්‍ය පිරිවැය සමග මෙම පීඨයේ ඒක ශිෂ්‍ය පිරිවැය කිසි ලෙසකින් හෝ සැසඳිය නොහැකි අතර එසේ වන්නේ පීඨයේ ඉගැන්වෙන විද්‍යා විෂයයන්ට අදාලව වැඩි වශයෙන් ක්ෂේත්‍ර චාරිකා සිදුකරන හෙයිනි.

**කෘෂිකර්ම හා වැවිලි කළමනාකරණ පීඨය**

විද්‍යාවේදී කෘෂිකර්ම උපාධි පාඨමාලාව දේශන, විද්‍යාගාර පරීක්ෂණ, ව්‍යාපෘති, ක්ෂේත්‍ර පරීක්ෂණ, ක්ෂේත්‍ර චාරිකා, පර්යේෂණ ව්‍යාපෘති හා සේවස්ථ පුහුණුව (Inplant Training) අංශ වලින් සමන්විත වන පාඨමාලාවකි. මේ නිසා ශිෂ්‍ය පිරිවැය සාපේක්ෂව ඉහළ අගයක් ගනී. මෙය සියළුම කෘෂිකර්ම පීඨවලට පොදු වූ කරුණකි.

එමෙන්ම, 2014 වසර තුල නව කාර්ය මණ්ඩල බඳවා ගැනීම ද, විද්‍යාගාර රසායන ද්‍රව්‍ය හා උපකරණ ඇතුළු සමස්ථ වියදම් සීග්‍ර ලෙස ඉහළ යෑම නිසා ද පීඨයේ සමස්ථ පිරිවැය ඉහළ යෑම තුලින් ඒකක ශිෂ්‍ය පිරිවැය වැඩිවීම සිදුවී ඇත.

**ව්‍යාපාර අධ්‍යයන හා මූල්‍ය පීඨය**

භාණ්ඩ හා සේවා පිරිවැය ඉහළ යෑම නිසා වාර්ෂිකව ඇති වූ බලපෑම තුලින් පීඨයේ ඒක ශිෂ්‍ය පිරිවැය ඉහළ ගොස් ඇත.

**ව්‍යවහාරික විද්‍යා පීඨය**

2014 වර්ෂය තුළ ඒක ශිෂ්‍ය පිරිවැය වැඩිවීමට පහත සඳහන් කරුණු බලපා ඇති අතර ඒ පිළිබඳව ඔබගේ අවධානය යොමු කරමි.

1 අධ්‍යයන හා අනධ්‍යයන කාර්ය මණ්ඩල සඳහා ස්ථිර/තාවකාලික සේවක මහත්ම මහත්මීන් බඳවා ගැනීම හා අධ්‍යයන කාර්ය මණ්ඩල වැටුප් ඉහළ යාම.
2 අධ්‍යයන කාර්ය මණ්ඩල සඳහා ගෙවනු ලබන පර්යේෂණ දීමනාවන් ඉහළ යාම.
3 2014 වර්ෂය තුල දී කාර්යය මණ්ඩල උසස්වීම් සිදුකිරීම හේතුවෙන් අධ්‍යයන හා අනධ්‍යයන කාර්ය මණ්ඩලයන්හි වැටුප්තල ඉහළ යාම හා ඊට සමගාමීව විශ්වවිද්‍යාලය විසින් දරනු ලබන UPF, ETF, විශ්‍රාම වැටුප් දායක මුදල් ඉහළ යාම සහ ජීවන වියදම් දීමනා හා අනෙකුත් දීමනාවන් ද ඉහළ යාම.
4 විද්‍යාගාරයන් හි ප්‍රායෝගික පරීක්ෂණ සඳහා අවශ්‍ය විවිධ ද්‍රව්‍යයන්ගේ (ඉලෙක්ට්‍රොනික උපාංගයන්) මිල ඉහළ යාම.

5 නවක සිසුන් සඳහා ලබා දෙන ශිෂ්‍ය අත්පොත් මුද්‍රණය කිරීම හා එම මුද්‍රණ වියදම් අධික වීම.

6 සේවක කාර්ය මණ්ඩලයේ වෘත්තිය අභිවෘද්ධිය සඳහා ඔවුන් විවිධ අධ්‍යාපනික, සේවාස්ථ වැඩමුළු සඳහා යොමු කිරීම.

7 ශිෂ්‍ය සංඛ්‍යාව වැඩිවීමත් සමඟම ඔවුන්ට ගෙවනු ලබන මහපොල/ශිෂ්‍යාධාර මුදල් ප්‍රමාණයන් ඉහළ යාම සහ සිසුන්ට ගෙවනු ලබන මහපොල/ශිෂ්‍යාධාර වාරිකා මුදල වැඩි කිරීම.

8 ශිෂ්‍ය කේන්ද්‍රීය අධ්‍යාපන ක්‍රමය තුළ සිසුන් නොයෙකුත් අධ්‍යාපන වැඩසටහන් සඳහා යොමු කිරීම.

**(ඇ) ව්‍යවහාරික විද්‍යා පීඨය**

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව නිකුත් කරනු ලබන ශිෂ්‍ය අත්පොතට අනුව විශ්වවිද්‍යාල සඳහා පාඨමාලාව උසස් කර යැවීමේදී ශිෂ්‍යයා විසින් එම මාරුවීම් අනිවාර්යයෙන්ම බාර ගත යුතුය. එම හේතුවෙන් වෙනත් විශ්වවිද්‍යාලවලට මාරු කර යැවූ ශිෂ්‍ය සංඛ්‍යාව 59 ක් වී ඇත. 2012 වසරේ දී වෙනත් විශ්වවිද්‍යාලවලට මාරු වී ගිය ශිෂ්‍ය ප්‍රතිශතය 68% ක් වූ අතර එම තත්වය 2013 වර්ෂය වන විට 25% දක්වා අඩු වී තිබුණි. 2014 වර්ෂයේ දී ද එම ප්‍රතිශතය 25% කි.

ව්‍යවහාරිකවිද්‍යා පීඨය සඳහා පළමුවෙන්ම බඳවා ගත් ශිෂ්‍ය සංඛ්‍යාවට අමතරව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පුරප්පාඩු පිරවීම සඳහා වරින් වර එවන ලද ශිෂ්‍ය නාම ලේඛනයන්ට අනුව නැවත නැවතත් ශිෂ්‍යයින් බඳවා ගැනීම සහ පීඨයේ ලියාපදිංචි වූ සිසුන් වෙනත් විශ්වවිද්‍යාලයන්ට මාරු කර යැවීම සිදු කරන ලදී. මෙම තත්වය 2014.03.24 දින අප පීඨයේ 2012/2013 අධ්‍යයන වර්ෂය ආරම්භවීමෙන් පසුව ද සිදු කරන ලද බැවින් අධ්‍යයන වර්ෂය අතරමඟ දී ද සිසුන් වෙනත් විශ්වවිද්‍යාල සඳහා උසස් කර යැවූ අතර එමඟින් ඇති වූ පුරප්පාඩු පිරවීම සිදු කළ නොහැකි විය. එසේ වූයේ අධ්‍යයන වර්ෂය අතරමඟ දී නවක සිසුන් නැවත නැවත බඳවා ගැනීම අධ්‍යයන පාඨමාලාවේ ගුණාත්මක භාවයට අහිසි ලෙස බලපාන බැවින් සහ එම නවක සිසුන්ට පාඨමාලාවේ කොටසක් මඟ හැරෙන බැවින් ඒ වන විටත් පුරප්පාඩු පිරවීම නතර කිරීමට පීඨ මණ්ඩලය විසින් තීරණය කර තිබූ බැවිනි.

මේ අයුරින් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මඟින් සිසුන් උසස් කර යැවීමෙන් පසු ඇති වූ පුරප්පාඩු පිරවීමේ හැකියාවක් නොවූ බැවින් ඉහත දක්වා ඇති පරිදි වෙනත් විශ්වවිද්‍යාලයන්ට මාරු වී ගිය ශිෂ්‍ය සංඛ්‍යාවේ ප්‍රතිශතය 25% ක් ලෙස දක්වයි.

කෙසේවෙතත්, මේ පිළිබඳව නිරන්තරයෙන් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව දැනුවත් කර ඇති අතර මෙම ගැටළු සහගත තත්වයට පිළියම් ලෙස 2013/2014 අධ්‍යයන වර්ෂය සඳහා සිසුන් 300 ක නම් ලැයිස්තුවක් ඉල්ලීමට කටයුතු කළ අතර එමඟින් අභ්‍යන්තර ස්ථාන මාරු කිරීම් සිදුකිරීමෙන් අනතුරුව සිසුන් 200 ක පමණ ප්‍රමාණයක් රඳවා ගැනීමට අපේක්ෂා කළ අතර එම ශිෂ්‍ය සංඛ්‍යාවෙන් බහුතරයක් ව්‍යවහාරිකවිද්‍යා පීඨයේ අධ්‍යයන කටයුතුවල නිරත වේ.

**පශු සම්පත් ධීවර හා පෝෂණ පීඨය**

ආරම්භයේදී මෙම උපාධි පාඨමාලාවන් සඳහා ලියාපදිංචි වූ සිසුන් හට, පසුව වෙනත් උපාධි පාඨමාලාවලට ඇතුළුවීමට විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මඟින් අවස්ථාව ලබාදීමත්, ඒ බව සෘජුවම සිසුන් වෙත දැනුම්දීමත් ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් සිදුකරනු ලබයි. පීඨවල මෙසේ ඇතිවන පුරප්පාඩු පිරවීම ද කොමිෂන් සභාව යටතේ සිදුවේ. මෙම ක්‍රියාවලිය විශ්වවිද්‍යාලයට පාලනය කළ නොහැක.

**කෘෂිකර්ම හා වැවිලි කළමනාකරණ පීඨය**

වෛද්‍ය, දන්ත වෛද්‍ය, අතුරු වෛද්‍ය සේවා ඇතුළු උපාධි පාඨමාලාව සාමාන්‍යයෙන් වැඩි ඉල්ලුමක් පවතින ක්ෂේත්‍රයක් වේ. සිසුන් විද්‍යා විෂය ධාරාවෙන් විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා අයඳුම් කිරීමේදී සාමාන්‍යයෙන් සෑම වරණයක් සඳහාම ඉල්ලුම් කරන බැවින් එහිදී උපාධි පාඨමාලා සඳහා තේරුණ විට මෙම පීඨයේ ලියාපදිංචි වී සිටියද එය ඇතහැර ඉහත පාඨමාලා සඳහා යෑම සාමාන්‍ය පිළිවෙත වේ. මෙය අප පාලනයෙන් බැහැර වූ තත්වයකි. කෙසේ වුවද, මෙම බැහැරව යන සිසුන් වෙනුවෙන් නැවත සිදු කරන ලද බඳවා ගැනීම් තුලින් වර්තමානයේ කිසිදු පුරප්පාඩුවක් විද්‍යමාන නොවේ.

**ව්‍යාපාර අධ්‍යයන හා මූල්‍ය පීඨය**

ශිෂ්‍ය ඉල්ලීම මත ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් විශ්වවිද්‍යාල අතර සිසුන් මාරු කිරීම සිදුකරනු ලබයි. ඒ අනුව සම්පත් උපයෝගීතාවය නිශ්ඵල වී ඇත යන්න පිළිගත නොහැක. අප විසින් ඉල්ලා සිටි ශිෂ්‍යයින් ගණන 350 කි. එහෙත් ශිෂ්‍යයින් 467 ක් එවන ලදී. එයින් 26 දෙනෙකු ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් මාරු කරන ලදී. ඒ අනුව 441 ක් දක්වා අඩු විය.

**(ඈ)**

**ව්‍යාපාර අධ්‍යයන හා මූල්‍ය පීඨය**

වර්ෂ 2014 ට අනුපාත ඇබෑර්තු සියල්ල පුරවා ඇත. වර්ෂ 2015 දී අනුමත කාර්ය මණ්ඩල ඇබෑර්තු පිරවූ පසු අනාගතයේ දී මෙම අනුපාතය ක්‍රමානුකූලව පහළ යනු ඇතැයි විශ්වාස කරමි.

## 4.3 කළමනාකරණ අකාර්යක්ෂමතා

**(අ)** මෙහි සඳහන් ආචාර්යවරුන් දෙදෙනාගෙන් අයවීමට ඇති රු. 1,542,625.00 ක මුදල අයකර ගැනීමට නොහැකිව ඇත්තේ ඉන් එක් අයෙකු වන රූපසිංහ මහතාට විරුද්ධව අනුරාධපුර දිසා අධිකරණයේ පවත්වාගෙන යනු ලබන නඩුවට අදාළව රූපසිංහ මහතාට හා ඇපකරුවාට සිතාසි භාර දීමට දැනට අප වෙත පවතින එම අයගේ ලිපිනයන් නඩුව සම්බන්ධයෙන් පෙනී සිටින නීතිඥවරියට ලබා දුන් නමුත් එම ලිපිනවල ඒ අය පදිංචිව නොමැති බැවින් ඒවා භාර දීමට නොහැකි වීමය. කෙසේවෙතත්, රූපසිංහ මහතා දැනට සේවය කරන විදේශ විශ්වවිද්‍යාලයේ ලිපිනයට කැනඩාවේ ශ්‍රී ලංකා මහ කොමසාරිස් කාර්යාලය හරහා ලිපියක් යොමුකර ඇත.

මේ වන විට කැනඩාවේ ශ්‍රී ලංකා තානාපතිතුමා විසින් රූපසිංහ මහතා වෙත විශ්වවිද්‍යාලයෙන් යවන ලද ලිපිය ඔහු සේවය කරන විශ්වවිද්‍යාලය වෙත යවා ඇත. අදාළ මහ කොමසාරිස් කාර්යාලයෙන් එවා ඇති ලිපියේ පිටපතක් මේ සමඟ එවමි. **(ඇමුණුම - 01)**

මෙහි සඳහන් දෙවන ආචාර්යවරයා වන ආර් එම් ඩබ් එස් රත්නායක මහතාගෙන් අයවීමට ඇති මුදල එම මහතාට හිමි අර්ථසාධක අරමුදලින් අයකර ගැනීමට කැමැත්ත ප්‍රකාශකර ලිපියක් හා අර්ථසාධක නිදහස් කර ගැනීමට අයදුම්පත ඔහුවෙත යැවුව ද ඔහු විසින් ඒ සඳහා කැමැත්ත දක්වා ලිපියක් නොඑවීම නිසා ඔහුගෙන් එම මුදල අයකර ගැනීමට නොහැකි විය. කෙසේවෙතත්, ඔහුගෙන් අයවීමට ඇති මුදල සඳහන් කර ඔහු දැන් සේවය කරන ඇමරිකානු විශ්වවිද්‍යාලයට ලිපියක් එම රටේ තානාපති කාර්යාලය හරහා යවනු ලැබ ඇත.

තවද, H.A.S.I. හපුආරච්චි මහතාගෙන් අයවීමට ඇති මුදලින් කොටසක් ඔහු විසින් විශ්වවිද්‍යාලය වෙත ගෙවා ඇති අතර ඉතිරි මුදලින් තවත් කොටසක් ඔහුට හිමි අර්ථසාධක අරමුදලේ ශේෂයෙන් හා විශ්‍රාම වැටුප් අරමුදලට අයකරගෙන තිබූ මුදලින් ද සේවා පාරිතෝෂිත මුදලින් ද අයකර ගැනීමට අවශ්‍ය කටයුතු කර ඇත. ඉතිරි මුදල වර්ෂ 6 ක් ඇතුලත ගෙවීමට ඔහු විසින් එකඟත්වය පළ කර ඇත. ඒ සඳහා පාලක සභාවේ අනුමැතිය හිමි වී ඇත.

ඒ අනුව ඔහුගෙන් අයවීමට ඇති සම්පූර්ණ මුදල අය කර ගත හැකිය.

**(ආ)** විගණන වාර්තාවේ සඳහන් වන පරිදි Quency ආයතනයට අදාළ පොත් වෙනුවෙන් රු.4,053,786/= ක වටිනාකමක් සමාලෝචිත වර්ෂයේ දී ගෙවා තිබුණි" යන්න හා එකඟ නොවෙමි. එසේ ගෙවූ වටිනාකම රු. 3,772,289.77 ක් ලෙස නිවැරදි විය යුතුය.

විගණන විමසුමෙහි සඳහන් පුස්තකාල පොත් මිලදී ගැනීමේ දී අනුගමනය කර තිබූ ක්‍රමවේදයෙහි පැවති යම් යම් දුර්වලතා හේතුවෙන් 2012 වන තෙක් ඒ සඳහා ගෙවීම් කිරීමට විශ්වවිද්‍යාලය කටයුතු නොකරන ලදී. මන්ද, පවතින නීති රීති රෙගුලාසි අභිබවමින් කටයුතු කිරීම විශ්වවිද්‍යාලය කිසිසේත් අනුමත නොකල බැවින් හා එසේ කලේ නම් එය අප කීර්තිනාමයට ද බලවත් ලෙසට බලපානු ලැබීමට ඉඩ තිබූ බැවිනි. කෙසේවෙතත්, අදාල පොත් 2008 වර්ෂයේ සිට අවුරුදු 04 ක් ඉකුත්වන තුරුත් කිසිඳු ගෙවීමකින් තොරව විශ්වවිද්‍යාලය විසින් පරිහරණය කිරීම හේතුවෙන් උක්ත ගෙවීම දිගින් දිගටම ප්‍රතික්ෂේප කිරීමේ සදාචාරාත්මක අයිතියක් ද අප සතුව නොතිබුණි.

එමෙන්ම, Quency Distributors ආයතනයට ගෙවිය යුතුව තිබූ රු. 4,130,710/= ක මුදල නොසැලකීම නිසා විශ්වවිද්‍යාලය අපකීර්තියට ලක්ව තිබූ බවත්, විශ්වවිද්‍යාලය විසින් කරන ලද දුර්වලතා හේතුවෙන් එම ආයතනයට මුදල් ගෙවීමට කටයුතු නොකිරීමෙන් එම ආයතනයට අලාභයක් සිදු වී තිබූ බවත් NW/PT/B/වයඹ වි.වි./මු.වි./2011/05 අංක දරන 2012 මාර්තු 23 දිනැති රජයේ විගණන විමසුම මගින් ද දැඩි ලෙස අවධාරණය කර තිබුණි.

ඒ අනුව, ඉහත සඳහන් සියලු කරුණු සලකා බැලූ 125 වන පාලක සභාව විසින් පවතින නීති රීතිවලට පටහැනි නොවන පරිද්දෙන් අදාල ගෙවීම කිරීමේ හැකියාව පිළිබඳ සොයා බලා අවශ්‍ය ඉදිරි පියවර ගැනීම සඳහා විශේෂ අනු කමිටුවක් පත් කරන ලදී.

මේ වෙනුවෙන් අනු කමිටු රැස්වීම් වාර 04 ක් පවත්වන ලද අතර පළමු කමිටු රැස්වීමේදී මේ සම්බන්ධයෙන් පැවති අභ්‍යන්තර සහ බාහිර විගණන විමසුම් සහ අනෙකුත් සියලුම කරුණු සලකා බලා ඒවායේ සඳහන් කරුණු නිවැරදි කිරීමෙන් අනතුරුව උක්ත ගෙවීම කල යුතු බවට කමිටු සාමාජිකයන් තීරණය කරන ලදී. එමෙන්ම, ගෙවීම් කිරීමට ප්‍රථම පැවති ගැටලුකාරී තත්වයන් හේතුවෙන් මිල ගණන් පිළිබඳ නැවත සමීක්ෂණයක් ද කල යුතු බවට තීරණය වූ අතර එහි වගකීම අභ්‍යන්තර විගණන අංශය වෙත පවරන ලදී.

Quency Distributors ආයතනය මඟින් ඉදිරිපත් කර තිබූ මිල ගණන් හි විචලතාවයක් පැවති බව අභ්‍යන්තර විගණන අංශය විසින් කරන ලද මිල ගණන් පිළිබඳ නැවත සමීක්ෂණය තුලින් තහවුරු වූ අතර ඒ සඳහා 10% ක වට්ටමක් ලබාගත යුතු බවට 2 වන අනු කමිටුවේ දී තීරණය කරන ලදී. එමෙන්ම උක්ත සමීක්ෂණයේ දී ඉන්වොයිස්වල විය යුතු සංශෝධනයන් කීපයක් ද හඳුනා ගන්නා ලද අතර ඒවා ද ගැලපීමෙන් පසු වට්ටම් අඩු කිරීමට පෙර රු. 3, 850, 288.41 ක් දක්වා මිල අඩු විය යුතු බවට තීරණය විය.

මෙසේ, Quency Distributors ආයතනයට ගෙවිය යුතු මුදලෙන් සිදු කරනු ලබන අඩුකිරීම් සඳහා වූ එකඟතාවය එම ආයතනයෙන් ලබා ගැනීම සඳහා එහි සහභාගිත්වය ඇතිව

තෙවන අනු කමිටු රැස්වීම පවත්වන ලදී. ඉදිරිපත් කරන ලද අනෙකුත් සංශෝධන සඳහා එකඟතාවය ලැබුණ ද, වසර 4 කට වඩා වැඩි කාලයක් මෙම ගෙවීම ප්‍රමාදව තිබූ බැවින් 2% ක වට්ටමක් පමණක් ලබා දිය හැකි බවට Quency Distributors ආයතනය ප්‍රකාශ කරන ලද අතර එකඟ වන ලද අවසන් මිල රු. මිලියන 3.7 ක් විය.

මෙතෙක් ප්‍රසම්පාදන කමිටුවෙන් ප්‍රතික්ෂේප කරන ලද මෙම ගෙවීම සම්බන්ධයෙන් වූ නව ප්‍රසම්පාදන වාර්තාව පිළියෙල කිරීම පුස්තකාලයාධිකාරි වෙත සිව්වන අනු කමිටුවේ දී පවරන ලදී. එම වාර්තාව සමඟ මිල තීරණය කිරීම සඳහා පාදක කරගන්නා ලද සියළු විස්තර ඇතුලත් සවිස්තරාත්මක වාර්තාවක් ද (WU/IA/LIB/QU) ප්‍රසම්පාදන කමිටුව වෙත ඉදිරිපත් කරන ලදී.

දීර්ඝ සාකච්ඡාවකින් අනතුරුව 2013/11/19 දින පැවති 101 වන ප්‍රසම්පාදන කමිටුව විසින් මෙම ගෙවීම අනුමත කර ඇති අතර එම ප්‍රසම්පාදන තීරණය 2013/11/27 දින පැවති 140 වන පාලක සභාව විසින් අනුමත කරන ලදී.

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ ද දැඩි අවධානයට ලක්ව තිබූ උක්ත ගෙවීම නිරාකරණය කර ගැනීම සඳහා අවශ්‍ය උපදෙස් හා මගපෙන්වීම් ලබාදීමට විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සභාපතිතුමිය විසින් එහි අභ්‍යන්තර විගණකවරයා ද පත්කොට තිබූ අතර අවසන් තීරණයකට එළඹීමේ දී ඔහුගේ දායකත්වය ද ලබා ගැනීමට හැකි විය.

**(ඇ)** මෙම විශ්වවිද්‍යාලයේ අනුමත කම්කරු සේවක සංඛ්‍යාව 82 කි. එහෙත් පසුගිය වසර කිහිපය තුළ විශ්වවිද්‍යාලයේ නඩත්තු කටයුතු බෙහෙවින් පුළුල් වී ඇති නමුත් ඊට සරිලන පරිදි කනිෂ්ඨ සේවක සංඛ්‍යාවේ වැඩි වීමක් සිදුව නැත. එමෙන්ම, පසුගිය වසර තුළ අළුතින් උද්‍යාන අංශයක් ද ස්ථාපිත කර ඇත. නමුත්, ඊට අවශ්‍ය කනිෂ්ඨ සේවකයින් ද ලැබී නැත.

නඩත්තු අංශය, උද්‍යාන අංශය ඇතුළු සියළු අංශවල කටයුතු විධිමත් පරිදි පවත්වාගෙන යාම සඳහා අවම වශයෙන් කනිෂ්ඨ සේවකයින් 170 කගේ පමණ අවශ්‍යතාවක් පවතී. ඒ අනුව විශ්වවිද්‍යාල සේවක අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශ්වවිද්‍යාලය, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව, කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශ නිලධාරීන් සමඟ 2014.12.18 හා 19 දිනවල සාකච්ඡා වට කිහිපයක් පවත්වන ලද නමුත් මෙතෙක් නව සේවක ප්‍රතිපාදන ලැබී නැත. සේවක ප්‍රතිපාදන ලබාදෙන තෙක් අත්‍යවශ්‍ය අංශ සඳහා පෞද්ගලික ශ්‍රම සේවා සැපයුම් මඟින් කම්කරුවන් ලබා ගන්නා ලෙස එම සාකච්ඡාවේදී උපදෙස් ලබා දෙන ලදී. ඒ අනුව, පාලක සභාවේද අනුමැතිය

සහිතව දැනට පෞද්ගලික ශ්‍රම සේවා සැපයුම් ආයතනයෙන් කම්කරුවන් 20 කගේ පමණ සේවය ලබා ගනී.

**(ඈ)** 2013 වර්ෂයේ නේවාසිකාගාර ලබාදීම සඳහා අයදුම්පත් කැඳවීමේදී පිරිමි සිසුන් 125 කට වැඩි ප්‍රමාණයක් අයදුම්පත් ඉදිරිපත් කර තිබුණි. ඒ අනුව කාරියවසම් නේවාසිකාගාරය බදු පදනම මත ලබා ගැනීමට කටයුතු කරන ලදී. නේවාසිකාගාර සඳහා සුදුසුකම් ලත් සිසුන් ප්‍රමාණය ඉතා ඉහළ මට්ටමක පැවතුණ ද නේවාසිකාගාර සඳහා සිසුන් ලියාපදිංචි වීමේ ප්‍රතිශතය අඩු මට්ටමක පැවතුණි.

තවද, කාරියවසම් නේවාසිකාගාරයේ බදු කාලය 2015-01-30 දිනෙන් අවසන් වූ බැවින් සියළු අලුත්වැඩියා කටයුතු වලින් අනතුරුව 2015-03-10 දින නැවත ගොඩනැගිලි හිමිකරු වෙත බාරදුන් බව ද වැඩිදුරටත් දන්වා සිටිමි.

**(ඉ)** සතුන් රැඳවීමට අවශ්‍ය මූලික පහසුකම් වන විදුලිය, ජලය, ආරක්ෂිත වැට, රාත්‍රී කාලයට ආරක්ෂක නිලධරයකු සහ ආරක්ෂක කුටියක් ආදී අත්‍යාවශ්‍යම අංග සම්පූර්ණ වී ගොවිපලක් ලෙස භාවිතා කල හැකි මට්ටමට ගොවිපලේ ඉදිකිරීම් කටයුතු නිම වූ පසු ප්‍රාග්ධනිත කරනු ලැබේ.

### 4.4 <u>මෙහෙයුම් අකාර්යක්ෂමතා</u>

**(අ)** විශ්වවිද්‍යාල කාර්ය මණ්ඩලය සංවර්ධනය වෙනුවෙන් 2012 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවෙන් ලැබී තිබුණු එකතුව රු. 10,500,000.00 ක් වන අතර එයින් 2012 වසරේ සිට මේ දක්වා අදාළ කාර්යයන් සඳහා යොදා ගෙන ඇති මුළු මුදල 9,908,114.83 ක් වන අතර එය පහත පරිදි වේ.

වියදම (රු.)

| | | 2012 | 2013 | 2014 | 2015 |
|---|---|---|---|---|---|
| **වැඩමුළු/ දේශන** | | 785,615.75 | 989,047.00 | 137,288.02 | 453,248.00 |
| **උපකරණ මිල දී ගැනීම්** | | 3,770,319.80 | 1,917,005.00 | 402,106.02 | 169,304.00 |
| **පරිත්‍යාග** | WINC | | | 1,000,000.00 | |
| | URES | | | 75,000.00 | 74,000.00 |
| | AGREES | | | 75,000.00 | |
| | Siyapatha | | | | 60,181.24 |
| **එකතුව** | | 4,555,935.55 | 2,906,052.00 | 1,689,394.04 | 756,733.24 |
| **මුළු වියදම** | | | | | **9,908,114.43** |

2015.12.31 දිනට ශේෂය **591,885.17** (10,500,000.00 – 9,908,114.83)

ඉතිරි මුදල් අදාල කාර්යයන් සඳහා තවදුරටත් යොදාගනු ලැබේ.

**(ආ)** මෙම භාණ්ඩ විශ්වවිද්‍යාලයට ලද බවටත් ඒවා එම කාර්යය සඳහා යොදාගත් බවට වැඩ පරීක්ෂක විසින් නිර්දේශකර ඇති අතර පශු සම්පත් හා පක්ෂි විද්‍යා දෙපාර්තමේන්තුවේ අංශ ප්‍රධානගේ හා පීඨාධිපතිගේ අනුමැතිය යටතේ ගෙවීම් කර ඇත.

**4.5 මතභේදයට තුඩුදෙන ගනුදෙනු**

**(අ)** විශ්වවිද්‍යාල පනතේ 99 (1) වගන්තිය ප්‍රකාරව ලැබෙන සියළු මුදල් විශ්වවිද්‍යාල අරමුදලට ලැබිය යුතු වුවද, 2014 ජනවාරි මස 20 වන දින ආචාර්ය උපාධියෙන් පසුව කෙරෙන පර්යේෂණ සඳහා ලබා දී තිබූ පවුම් 5000 ක මුදල අදාළ කථිකාචාර්යවරියගේ පෞද්ගලික ගිණුමට බැර කර තිබුයේ, 2014.01.09 දිනැති ඇය විසින් උපකුලපතිවරයා අමතා ලියන ලද ලිඛිත ඉල්ලීමකට අනුවය. **(ඇමුණුම 02)**

අදාළ ආයතනය විසින් එම මුදල ඇය වෙත ලබා දී තිබුණේ පොදු රාජ්‍ය මණ්ඩලීය විශ්වවිද්‍යාල සංගමය සහ ඇය අතර ඇති කර ගනු ලැබූ ගිවිසුමකට අනුව අදාළ පර්යේෂණ කටයුත්ත සඳහා අවශ්‍ය කරන වියදම් වශයෙනි. මෙම මුදල ඇයගේ ගිණුමට බැර කොට ඇත්තේ 2014.01.21 දින පැවති 141 වන පාලක සභා අනුමැතිය සහිතවය. **(ඇමුණුම 03)**

තවද, ඇය විසින් 2015.07.10 දිනැති ලිපිය මඟින් අදාළ මුදල් එම පර්යේෂණ කටයුතු සඳහා වියදම් වූ බව ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී, අධ්‍යයන ආයතන වෙත ලිඛිතව දැනුම් දී ඇත. **(ඇමුණුම 04)**

ඒ අනුව, නිසි අනුමැතියකින් පසු අදාළ ක්‍රියාමාර්ග ගෙන ඇති බව පෙන්වා දෙනු කැමැත්තෙමි.

**(ආ)** උසස් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් ලබා දුන් කොන්ත්‍රාත්තුවේ අතිරේක වැඩ සඳහා ගෙවීම් විශ්වවිද්‍යාලය විසින් කළ යුතුව තිබූ අතර එම අතිරේක වැඩ සඳහා විශ්වවිද්‍යාල ප්‍රසම්පාදන කමිටුවේ අනුමැතිය ඇතිව ගෙවීම් කර ඇත. උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ ගිවිසුම මේ සඳහා වලංගු වේ.

**4.6 <u>ආර්ථික නොවූ ගනුදෙනු</u>**

**(අ)** විශ්වවිද්‍යාලය සඳහා නේවාසිකාගාර කුලියට ලබා ගැනීමේදී තක්සේරු දෙපාර්තමේන්තුව මගින් අදාල නිවාස/ ගොඩනැගිලි සඳහා ලබාගත් තක්සේරු වටිනාකමට අනුකූල වනසේ ටෙන්ඩර්කරුවන් ඉදිරිපත් කර තිබූ මිල ගණන් අඩුකර ගැනීමට උත්සාහ ගත් අතර ඉදිරිපත් කර තිබූ ටෙන්ඩර් වටිනාකමින් යම් ප්‍රමාණයක් අඩුකර ගැනීමට ටෙන්ඩර් කමිටුව සමත් වූ නමුත් අනුමත තක්සේරු වටිනාකම දක්වා මිල අඩු කිරීමට අදාල පාර්ශ්ව විසින් එකඟ නොවීය. අදාල පාර්ශ්ව සමඟ එකඟ වූ නිවාස කුලිය පාලක සභාවේ අනුමැතිය මත ගෙවීමට කටයුතු කර ඇත.

**(ආ)** පශු සම්පත් ධීවර හා පෝෂණ පීඨයේ, පශු සම්පත් හා පක්ෂි විද්‍යා අධ්‍යයනාංශයේ කථිකාචාර්ය ඩබ්.ඒ.ඩී.වී. වීරතිලක මහතා උසස් අධ්‍යාපන කටයුතු සඳහා විදේශගතවීම පිණිස වීසා ලබා ගැනීම සඳහා පැවති සම්මුඛ පරීක්ෂණයකට සහභාගී වීම පිණිස කොළඹ බ්‍රිතාන්‍ය මහ කොමසාරිස් කාර්යාලයට යාම සඳහා 2014-09-10 දින පෙ.ව. 7.00 ට වාහන පහසුකම් අයඳුම් කර තිබුණි. තවද, වීරතිලක මහතාගේ නිවසේ (ගිරිඋල්ල) සිට කොළඹ දක්වා ප්‍රවාහන පහසුකම් ලබා ගැනීම පිණිස ඒ මහතා අයඳුම් කර තිබූ අතර එහි ගමන් මාර්ගය වූයේ මාකඳුරේ සිට ගිරිඋල්ල දක්වාත් එහි සිට කොළඹ දක්වාත් වශයෙනි. මෙවැනි කරුණක් සඳහා නියමිත වේලාවට එම ස්ථානයට යා යුතු අතර එම කරුණ උදෙසා කොපමණ කාලසීමාවක් ගතවනවා දැයි යන්න පිළිබඳව පූර්ව නිගමනයකට එළඹිය නොහැක.

තවද, මෙම පීඨයේම ආහාර විද්‍යා හා තාක්ෂණ අධ්‍යයනාංශයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය ඩී.එන්. ලියනගේ මහතා වර්ණ ප්‍රින්ටරයක් මිලදීගැනීම පිණිස කොළඹ, ටෙක්නො ෆෝර්ම්ස් ආයතනයට යාම සඳහා ඉහත දිනයේදීම එම වේලාවටම ප්‍රවාහන පහසුකම් අයඳුම් කර

තිබුණි. මෙම මුද්‍රණ යන්ත්‍රය ව්‍යාපෘතියක් යටතේ ලද එකක් වන අතර ප්‍රමාණයෙන් ද විශාල විය. එය වාහනයක රැගෙන ඒමේදී වාහනයේ ආසනයක් ඉවත් කිරීම අනිවාර්යයෙන්ම කළ යුතුව තිබුණි. තවද, එම වකවානුව මෙම පීඨයේ වාර්ෂික පරීක්ෂණ පැවති අතර මෙම මුද්‍රණ යන්ත්‍රය, ප්‍රශ්ණ පත්‍ර මුද්‍රණය කිරීම සඳහා අවශ්‍යව තිබුණි. එමෙන්ම, එම කාලසීමාවේ දී ආහාර විද්‍යා හා තාක්‍ෂණ අධ්‍යයනාංශයේ ඡායා පිටපත් යන්ත්‍රය ක්‍රියා විරහිතව තිබූ නිසාත්, මෙම මුද්‍රණ යන්ත්‍රය බහුකාර්ය පහසුකම් (ඡායා පිටපත් ගැනීම, පරිගණක මුද්‍රණ පිටපත් (වර්ණ/කළුසුදු) ගැනීම, ස්කෑන් කිරීම වැනි කාර්යන්) සහිත එකක් වූ නිසාත් එම අධ්‍යයනාංශයට ද අදාල යන්ත්‍රය ඉක්මනින් සපයා ගැනීමේ අවශ්‍යතාවය ඉස්මතු වී තිබුණි. ඒ අනුව, එම මුද්‍රණ යන්ත්‍රය මිලදී ගැනීමේ හදිසි අවශ්‍යතාවය පැහැදිළි වනු ඇතැයි සිතමි. ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය ලියනගේ මහතා මෙම ප්‍රවාහන පහසුකම් ලබාගත්තේ  මාකඳුරේ සිට කොළඹ දක්වා මාර්ගයෙනි.

මෙම ගමන් වාර දෙක සඳහා වියදම වශයෙන් ඉහත විමසුම් ලිපියේ සඳහන් කොට තිබූ සංඛ්‍යාවන් නිවැරදි නොවන අතර එය මෙසේ නිවැරදි විය යුතුය. කථිකාචාර්ය වීරතිලක මහතාගේ ගමන සඳහා කි.මී. 195 ක් දුර ගෙවා තිබූ අතර ඒ සඳහා ගෙවා ඇති මුදල රු. 5,850.00 කි. එම වාහනය වායුසමීකරණ පහසුකම් නොමැති එකක් වූ අතර එයට ගෙවා ඇත්තේ කිලෝ මීටරයට රු. 30.00 බැගින් වන පරිද්දෙනි. ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය ලියනගේ මහතාගේ ගමන සඳහා කි.මී. 143 ක දුරක් ගෙවා තිබූ අතර ඒ සඳහා ගෙවා ඇති මුදල රු. 5,148.00 කි. එම වාහනය වායුසමීකරණ පහසුකම් සහිත එකක් වූ නිසා එයට ගෙවීම් කොට ඇත්තේ කිලෝ මීටරයට රු. 36.00 බැගිනි.

ඒ අනුව, මෙම ගමන් වාර දෙක සඳහා ගෙවා ඇති මුදල රු. 10,998.00 වන අතර එය විමසුම් ලිපියේ සඳහන් මුදලට වඩා රු. 3,042.00 ක අඩුවීමකි.

**(ඇ)** වයඹ විශ්වවිද්‍යාලයේ මාකඳුර පරිශ්‍රයේ වෑන් රථයක්, බස් රථයක් හා පීඨාධිපතිවරුන් දෙදෙනාට වෙන් කරන ලද කාර් රථ දෙකක් ඇති නමුත් විශේෂයෙන් පරිශ්‍රයේ පීඨ දෙකේ සිසුන්ගේ ක්ෂේත්‍ර චාරිකා, අධ්‍යයන චාරිකා හා ක්‍රීඩා කටයුතු සඳහා අවශ්‍ය ප්‍රවාහන පහසුකම් සැපයීමට ඉහත වාහන ප්‍රමාණවත් නොවේ. එමෙන්ම කාර්‍යමණ්ඩලයේ රැස්වීම්, සම්මන්ත්‍රණ හා ප්‍රායෝගික පුහුණු වැඩසටහන් සඳහා ද විශාල වශයෙන් වාහන අවශ්‍යව ඇති බැවින් අදාල අංශ ප්‍රධානීන් විසින් කුලී පදනමින් වාහන ලබා දෙන ලෙසට ඉල්ලීම් කර ඇත. ඒ අනුව කුලී වාහන ලබාගෙන ඇත.

**4.7 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු**

**(අ)**

**(i)** මිල විචලනය සඳහා හේතු ඉදිරිපත් කර නොමැති අතර ගිවිසුම් ප්‍රකාරව, කොන්ත්‍රාත් කාලයට අදාළව උපදේශන ආයතනය විසින් මිල විචලනය ගණනය කරනු ලැබේ.

**(ii)** ගිවිසුම අනුව, මිල විචලනය පිළිබඳ කොන්දේසි කොන්ත්‍රාත් කාලය දීර්ඝ කිරීම තුළින් වලංගු වේ. කොන්ත්‍රාත් කාලය දීර්ඝ කිරීම සඳහා ඉදිරිපත් කර ඇති කරුණු උපදේශන ආයතනය විසින් පිළිගෙන අනුමත කර ඇති බැවින් මිල විචලනය සඳහා ගෙවිය යුතු වේ.

ඒ අනුව, 2012 සැප්තැම්බර් 18 දිනැතිව රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව විසින් ඉදිරිපත් කර ඇති අවවාද ලිපිය මෙම කරුණ සමඟ සබඳතාවයක් නැත.

**(ආ)** වර්ෂය තුල ඉදි කිරීම් හා පුනරුත්තාපන කටයුතු සඳහා දැරූ සියලු වියදම් කෙරීගෙන යන වැඩ ගිණුමට හර කරනු ලබන අතර එම සියලුම ව්‍යාපෘතිවලට අදාල වියදම් වාර්තා මූලධන අංශය වෙත යොමුකර වර්ෂය තුළ  නිමකරන ලද ව්‍යාපෘතිවලට අදාළ පිරිවැය ප්‍රාග්ධනිත කිරීමට කටයුතු කරනු ලැබේ.

**4.8 කාර්ය මණ්ඩල පරිපාලනය**

**(අ)** විශ්වවිද්‍යාලයේ අනුමත අධ්‍යයන කාර්ය මණ්ඩලය 275 ක් වුවත් නිත්‍ය කාර්ය මණ්ඩලය 255 ක් වේ. ඒ අනුව, පුරප්පාඩු තනතුරු සංඛ්‍යාව 20 ක් වුවද ඒ ඒ අධ්‍යයන අංශ සඳහා බාහිර කථිකාචාර්යවරුන් බඳවාගෙන ඇත්තේ එම අධ්‍යයන අංශවල තිබෙන විෂයයන් සඳහා විශේෂ නිපුණතාව ඇති ගුරුවරුන් හිඟ නිසාය. එමෙන්ම, සමහර අධ්‍යයන අංශවල සිටි ආධුනික කථිකාචාර්යවරුන් එම අයගේ තනතුරු ස්ථිර කිරීම හා ශ්‍රේණි උසස් වීම ලබා ගැනීමට අවශ්‍ය පශ්චාත් උපාධි පාඨමාලා හැදෑරීම සඳහා අධ්‍යයන නිවාඩු ලබාගැනීම නිසාත් ඒ ඒ අධ්‍යයන අංශවල ඉගැන්වීම් කටයුතු සඳහා ප්‍රමාණවත් අධ්‍යයන කාර්ය මණ්ඩලය නොමැති අවස්ථා ඇත. මේ නිසා එම අඩුව සම්පූර්ණ කිරීමට බාහිර කථිකාචාර්යවරුන්ගේ සේවය ලබා ගැනීමට සිදු විය. සිසුන්ගේ අධ්‍යයන කටයුතු බාධාවකින් තොරව පවත්වාගෙන යාම සඳහා බාහිර කථිකාචාර්යවරුන්ගේ සේවය ලබා ගැනීම තුලින් අනර්ථයක් සිදුවී නොමැති බව කිව හැකිය.

**(ආ)** 4.3 (ඇ) පිළිතුර අදාල වේ.

## 5. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

### 5.1 ක්‍රියාකාරී සැලැස්ම

**(අ)** 2014 වර්ෂයට පමණක් වූ ක්‍රියාකාරී සැලැස්මක් සකස්කර නොමැති අතර 2013-2017 සඳහා සකස් කළ සංයුක්ත සැලැස්මෙහි 2013-2017 කාලපරිච්ඡේදයට අදාලව විශ්වවිද්‍යාලයේ ක්‍රියාකාරී සැලැස්ම ඇතුලත් වේ.

**(ආ)** පුනරුත්තාපන කටයුතු සඳහා ක්‍රියාකාරී සැලැස්මක් එම වර්ෂයට මාස 6 කට පෙර සකස් කරන අතර එම සැලසුම් කාර්යයන්ගේ ප්‍රමුඛතාවයන් අදාළ අංශයන් විසින් අදාළ වර්ෂය වන විට වෙනස් වීම් සිදු කර අත්‍යාවශ්‍ය කාර්යයන්ගේ වැඩ පත්‍රිකා මූලධන අංශයට එවනු ලැබේ. ඒ අනුව කාර්යයන්ගේ පරස්පරතාවයක් දක්නට ලැබේ.

**(ඇ)** ව්‍යාපෘති ඉදිකිරීම සඳහා වර්ෂය තුල ලබා දුන් සියළුම ප්‍රතිපාදන, ඒ එක් එක් ව්‍යාපෘතියේ බිල් ලැබීම් මත එම ව්‍යාපෘතීන් තුල වැය කර අවසන් කර ඇත.

### 5.2 අයවැය ලේඛනමය පාලනය

ඇස්තමේන්තු සකසනුයේ පෙර වර්ෂවල සත්‍ය වියදම් ඉදිරි වර්ෂයේ සැලසුම් හා විවිධ උපකල්පන පදනම් කර ගනිමිනි. සාර්ව ආර්ථික තත්වයන්ගේ විචලතාවයන් හා අනපේක්ෂිත වෙනස්වීම් විචලතාවයන්ට හේතුවන අතර එබඳු විචලතාවයන් අවම කිරීමට ඉදිරියේදී කටයුතු කරනු ලැබේ.

### 5.3 නොවිසඳී ඇති විගණන ඡේද

මෙම කථිකාචාර්යවරිය විසින් උපකුලපතිතුමා වෙත ඉදිරිපත් කළ පර්යේෂණ වාර්තාව 51 වන විගණන කමිටුව වෙත ඉදිරිපත් කළ අතර පැවති ගැටළුකාරී තත්වය නිසා කමිටු තීරණය පරිදි විශ්වවිද්‍යාලයීය පර්යේෂණ කමිටුව වෙත ඉදිරිපත් කරන ලදී.

විශ්වවිද්‍යාලයීය පර්යේෂණ කමිටුව විසින් තවදුරටත් එහි නිරවද්‍යතාවය සහතික කර ගැනීම සඳහා එම පර්යේෂණ යෝජනාව හා පර්යේෂණ වාර්තාව අදාළ විෂය පිළිබඳ ප්‍රවීනයන්ගෙන් සැදුම්ලත් බාහිර කමිටුවක් වෙත යොමු කිරීමට කටයුතු කර ඇත.

### 5.4 වාර්ෂික වාර්තා සභාගත කිරීම

2012 වාර්ෂික වාර්තාව පාර්ලිමේන්තු සභාගත කිරීම සඳහා භාෂාත්‍රයෙන් සකස් කරන ලද මුද්‍රිත පිටපත් 15 ක් හා CD පිටපත් 350 ක් 2015.11.12 වන දින පාර්ලිමේන්තුවට භාර දෙන ලදී.

6. <u>පද්ධති හා පාලනයන්</u>

විගණන වාර්තාව මඟින් අවධානයට ලක් කර ඇති පාලන ක්ෂේත්‍රයන්හි පැවති අඩුපාඩු අවම කර ගැනීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගනු ලබන බව කාරුණිකව දන්වමි.

මහාචාර්ය එස්.ජේ.බී.ඒ. ජයසේකර

උපකුලපති

උපකුලපති
ශ්‍රී ලංකා වයඹ විශ්ව විද්‍යාලය
කුලියාපිටිය

*High Commission of the Democratic Socialist Republic of Sri Lanka*
*333, Laurier Avenue West, Suite # 1204 Ottawa, Ontario, K1P 1C1*
*Tel: (613) 233 - 8449 Fax: (613) 238-8448 E-Mail: slhcit@rogers.com*
*www.srilankahcottawa.org*

My. No.CAN/GEN/LEGAL/01

19th July 2016

09 AUG 2016
VICE-CHANCELLOR'S OFFICE
WAYAMBA ★ KULIYAPITIYA

11 AUG 2016
24139

Dr. HPV Rupasinghe,
Department of Environmental Science,
Nova Scotia Agricultural College,
Rm219-3 Cox Institute Building,
50 Pictou Road (P.O. Box 550)
Truro, Nova Scotia, B2N 5E3

Dear Dr. Rupasinghe,

**BOND VIOLATION AND DUES TO BE SETTLED TO WAYAMBA UNIVERSITY OF SRI LANKA.**

This refers to the letter No.AE/02 dated 20.06.2016 issued to you by the Vice Chancellor of the University of Wayamba, Sri Lanka, through this High Commission on the above matter.(Annex – I )

02. According to the Vice Chancellor of the University of Wayamba, you have violated the Bond and Agreement that you have entered with the University and as a result of that you are required to pay a sum of **Rupees Five Hundred and Ninety Five Thousand Nine Hundred and Ninety One and Cents Thirty Two (Rs. 595,991.32)** to the University of Wayamba.

03. Failing to settle the above amount will lead to legal actions against you and your sureties. Hence, you are hereby advice to settle the said amount to the University of Wayamba as early as possible and keep this High Commission informed of the actions taken in this regard.

Thanking you,

Sincerely,

Sgd/-
A.D.L.G. Kalansuriya
Minister
*f*or High Commissioner

SAR(AE)

AE/02
file

Copy, Vice Chancellor of the University of Wayamba – for your information pls.

10/08/2016
SAR.

Dr CVL Jayasinghe,
Senior Lecturer,
Department of Food Science and Technology,
Faculty of Livestock, Fisheries and Nutrition,

2014.01.09

Vice Chancellor,
Wayamba University of Sri Lanka
Kuliyapitiya

Through
Dean,
Faculty of Livestock, Fisheries and Nutrition,
Makandura

Head,
Department of Food Science and Technology,
Faculty of Livestock, Fisheries and Nutrition,

forwarded
N. Perera
09/01/2014

HEAD
Department of Food Science & Te
Faculty of Livestock, Fisheries &
Wayamba University of Sri L
Makandura - Gonawila (N\

Dear Sir/Madam,

**Request of transferring scholarship money to the Bank account Sampath bank AC number- 101659000343- CVL Jayasinghe**

In 2013, I received Titular fellowship from Association of Commonwealth Universities to visit University of Saskatchewan to conduct Postdoctoral research, and the award money £5000 has been transferred to the Wayamba University account on 08.29.2013. The proof for the remittance is attached herewith.

As I am planning to leave the country on 19th of February 2014 I kindly request you to transfer the money to my account at Sampath bank PLC, Gampaha branch, AC number- 101659000343- CVL Jayasinghe.

Thanking you,
Yours truly,

Dr CVL Jayasinghe
Senior Lecturer, Grade 1

WU/AC/C/2014/142
Academic Branch
Wayamba University of Sri Lanka
19.02.2014

Bursar
SAR/AE

Subject: Request of Transferring Scholarship Money to Sampath Bank AC Number - 101659000343 - Dr. (Mrs.) C V L Jayasinghe (Memo C/141/48- Supp)

I am forwarding herewith an extract from the minutes of the 141st meeting of the Council held on 21.01.2014 for your information and necessary action please.

Please note that the minutes were confirmed at the 142nd meeting of the Council held on 18.02.2014.

Secretary / Council

---

141.19 Request of Transferring Scholarship Money to Sampath Bank AC Number - 101659000343 - Dr. (Mrs.) C V L Jayasinghe (Memo C/141/48- Supp)

The Council noted that Dr. (Mrs.) C V L Jayasinghe, Senior Lecturer Grade I, Department of Food Science & Technology, Faculty of Livestock Fisheries & Nutrition, had received a Titular Fellowship from the Association of Commonwealth Universities to visit University of Saskatchewan to conduct postdoctoral research. An award of £ 5000 had been granted to her for this purpose and this money had been transferred to the Wayamba University of Sri Lanka. She had requested that the funds be sent to her bank account.
It was agreed that although this amount was in the University account, it had been granted to Mrs. Jayasinghe, and the Bursar was requested to take necessary steps to hand over the funds to her.

ඇමුණුම - 04

**Department of Food Science and Technology**
**Faculty of Livestock, Fisheries and Nutrition**
**Wayamba University of Sri Lanka**
**Makandura, Gonawila (NWP)**

Head: 031-2299871 General: 031-2299871 Fax: 031-2299870

2015.07.10

පීඨාධිපතිතුමා
පශුසම්පත්, ධීවර හා පෝෂණ පීඨය
මාකඳුර

මගින්,

ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී
අධ්‍යයන ආයතන අංශය
ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලය
කුලියාපිටිය

මහත්මියණි,

කැනඩාවේ Saskatchewan විශ්වවිද්‍යාලයේදී මාගේ පශ්චාත් උපාධි පර්යේෂණ කටයුතු සඳහා පොදු රාජ්‍ය මණ්ඩලීය විශ්වවිද්‍යාල සංගමය විසින් මා වෙත පිරිනමන ලද Titular Fellowship සඳහා අදාල පවුම් 5000 ක මුදල මා එම ශිෂ්‍යත්වය වෙනුවෙන් ඇතිකරගත් ගිවිසුමට අනුකූලව පර්යේෂණ කටයුතු සඳහා පිටත්වීමට සතියකට පෙර ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලය විසින් ගිණුම් අංක: 101659000343 යටතේ පවත්වාගෙන යන මාගේ පෞද්ගලික ගිණුමට බැර කළ අතර, එම මුදල අදාල පර්යේෂණ කටයුතු සඳහා වියදම් කල බව ඉතා කාරුණිකව ඔබ වෙත දන්වා සිටිමි. (මෙම කරුණට අදාල ලිපිලේඛන මේ සමග අමුණා ඉදිරිපත් කරමි.)

ස්තූතියි.

මෙයට විශ්වාසී,

[signature]

මහාචාර්ය සී.වී.එල්. ජයසිංහ
අංශ ප්‍රධාන / ආහාර විද්‍යා හා තාක්ෂණ අංශය

HEAD
Department of Food Science & Technology
Faculty of Livestock, Fisheries & Nutrition
Wayamba University of Sri Lanka
Makandura - Gonawila (NWP)